57 වන කාණ්ඩය
14 වන කලාපය

සඳුදා
1964 සැප්තැම්බර් 28

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය [තී. 3213]

පළමුවන වර කියවන ලද කෙටුම්පත් පණත් [තී. 3215] :

Betting on Horse-Racing (Repeal) Bill [Senate]
Muslim Marriage and Divorce (Amendment) Bill [Senate]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 3220]

ශෝක ප්‍රකාශය : ආර්. එම්. ගුණසේකර මහතා [තී. 3231]

පිළිගන්වන ලද කෙටුම්පත් පණත [තී. 3235] :

Agricultural and Industrial Credit Corporation (Amendment) Bill

වැය සම්මතවල අතිරික්ත [තී. 3237]

පරිපූරක මුදල් [තී. 3240]

කල් තැබීමේ යෝජනාව [තී. 3337]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 3351]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 57
இல. 14

திங்கட்கிழமை,
28 செப்ரெம்பர், 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்


மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி [ப. 3213]

முதல் முறை மதிக்கப்பெற்ற மசோதாக்கள் [ப. 3215] :
Betting on Horse-Racing (Repeal) Bill [Senate]
Muslim Marriage and Divorce (Amendment) Bill [Senate]

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 3220]

அனுதாபத் தீர்மானம் : திரு. ஆர். எம். குணசேக்கர [ப. 3231]

AGRICULTURAL AND INDUSTRIAL CREDIT CORPORATION AMENDMENT) BILL [ப. 3235] :
முதல் மதிப்பு

வாக்குப் பண மிகைச் செலவு [ப. 3237]

குறைநிரப்பும் தொகை [ப. 3240]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 3337]

வினுக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 3351]


---

Volume 57
No. 14

Monday
28th September, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


MESSAGE FROM THE GOVERNOR-GENERAL [c. 3213]

BILLS READ THE FIRST TIME [c. 3215] :
Betting on Horse-Racing (Repeal) Bill [Senate]
Muslim Marriage and Divorce (Amendment) Bill [Senate]

ORAL ANSWERS TO QUESTIONS [c. 3220]

VOTE OF CONDOLENCE : MR. R. M. GUNASEKERA [c. 3231]

AGRICULTURAL AND INDUSTRIAL CREDIT CORPORATION AMENDMENT) BILL [c. 3235] :
Read the First time

EXCESS VOTES [c. 3237]

SUPPLEMENTARY SUPPLY [c. 3240]

ADJOURNMENT MOTION [c. 3337]

WRITTEN ANSWERS TO QUESTIONS [c. 3351]



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

### 1964 සැප්තැම්බර් 28 වන සඳුදා

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය.

---

**ලේකම්**

*(செயலதிகாரி)*

(The Clerk)

I have to inform this honourable House that Mr. Speaker is unavoidably absent. I call upon the Deputy Speaker to take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා [සී. ඒ. රාජපක්ෂ මයා.] මූලාසනාරූඪ විය.**

## අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ලත් සන්දේශය

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE GOVERNOR-GENERAL

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர்)*

(Mr. Deputy Speaker)

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගෙන් ලැබී තිබෙන සන්දේශයක් මම දැන් කියවනවා:

"රජ වාසල
කොළඹ
ශ්‍රී ලංකාව
1964 සැප්තැම්බර් 19.

**ගොනු අංකය: සී. 21/1964**

මහත් මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත්වලට මහා රාජිණින් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරවපූර්වකව ඔබට දන්වමි.

'An Act to amend the Companies Ordinance.'.

'An Act to amend the Institutes of Chartered Accountants Act, No. 23 of 1959.'.

'An Act to amend the Agricultural Products (Guaranteed Prices and Control of Hulling and Milling) Act, No. 33 of 1961.'.

'An Act to amend the Milk Board Act.'.





'An Act to amend the Veterinary Surgeons and Practitioners Act, No. 46 of 1956.'.

'An Act to amend the Animals Act, No. 29 of 1958.'.

'An Act to amend the Rubber Replanting Subsidy Act.'.

'An Act to Amend the Army Act.'.

මෙ වගට,

ඔබගේ කීකරු සේවක,
අ. ක. ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ ගරු කථානායකතුමා."

## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

மூதவையிலிருந்து வந்த செய்தி

MESSAGE FROM THE SENATE

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர்)*

(Mr. Deputy Speaker)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශ දෙකක් දැන් ලේකම් විසින් කියවනවා ඇති.

**මතු පළවන සන්දේශය ලේකම් විසින් කියවන වන ලදී:**

I

"සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය මතු පළවන කෙටුම්පත් පනත් සම්මත කළෙන් ඊට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වය ඔවුහු අපේක්ෂා කරති:

Betting on Horse-racing (Repeal)
Muslim Marriage and Divorce (Amendment)

මතු පළවන කෙටුම්පත් පනත්වලට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සංශෝධන නොමැතිව එකඟ වී ඇත:

Companies (Amendment)
Institute of Chartered Accountants (Amendment)

Agricultural Products (Guaranteed Prices and Control of Hulling and Milling) (Amendment)

Milk Board (Amendment)

Veterinary Surgeons and Practitioners (Amendment)

Animals (Amendment)

Rubber Replanting Subsidy (Amendment)

Army (Amendment)."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

## BETTING ON HORSE-RACING (REPEAL) BILL [SENATE]

**විවියන් ගුණවර්ධන මිය. (පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விவியன் குணவர்தன—உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Vivienne Goonewardene—Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs)

**විසින් ඉදිරිපත් කරන ලදී.**

**කෙටුම්පත් පණත පළමුවන වර කියවන ලදින්, 1964 ඔක්තෝබර් 6 වන අඟහරුවාද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද, නියෝග කරන ලදී.**

## MUSLIM MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL [SENATE]

**විවියන් ගුණවර්ධන මිය.**

*(திருமதி விவியன் குணவர்தன)*

(Mrs. Vivienne Goonewardene)

**විසින් ඉදිරිපත් කරන ලදී.**

**කෙටුම්පත් පණත පළමුවන වර කියවන ලදින්, 1964 ඔක්තෝබර් 6 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද, නියෝග කරන ලදී.**

# සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

*மூதவையிலிருந்து வந்த செய்தி*

## MESSAGE FROM THE SENATE

II

**මතු පළවන සන්දේශය ලේකම් විසින් කියවනලදී.**

"මතු පළවන කෙටුම්පත් පනතට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සංශෝධන සහිතව එකඟවී ඇත:

Tea Propaganda (Amendment)."

## TEA PROPAGANDA (AMENDMENT) BILL

**සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ සංශෝධන මුද්‍රණය කිරීමට සහ 1964 ඔක්තෝබර් 6 වන අඟහරුවාද සලකා බැලීමට.**

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்*

## PAPERS PRESENTED

**1963-64 අංක 46, 47, 51, 52, 53, 54 හා 65 දරණ** පරිපූරක ඇස්තමේන්තු මම ඉදිරිපත් කරමි.—[අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1963-64 අංක 50 දරණ පරිපූරක ඇස්තමේන්තුව මම ඉදිරිපත් කරමි.—[අධ්‍යාපන ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1963-64 අංක 61 දරණ පරිපූරක ඇස්තමේන්තුව මම ඉදිරිපත් කරමි.—[ගරු චම්ලි ගුණවර්ධන]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1963-64 අංක 45 දරණ පරිපූරක ඇස්තමේන්තුව මම ඉදිරිපත් කරමි.—[සංස්කෘතික කටයුතු හා සමාජ සේවා ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

(1) 1956 අංක 46 දරණ පශු වෛද්‍යවරුන් සහ පශු වෛද්‍ය කර්මයෙහි නියුක්ත වූවන් පිළිබඳ පනතෙහි 40 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝග මාලාවක්.

(2) 1958 අංක 29 දරණ සත්ව පනතේ 35 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝග මාලාවක්.

(3) Treaty Series No. 13 of 1959 relating to Universal Postal Convention Ottawa—3rd October, 1957, together with Final Protocol and Annexes Detailed Regulations Provisions concerning Air Mail.

(4) Treaty Series No. 14 of 1959 relating to Agreements concerning—
(i) Insured Letters and Boxes,
(ii) Postal Parcels Ottawa—3rd October, 1957, together with Final Protocols Detailed Regulations and Annexes.—[රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

## UNIVERSAL POSTAL CONVENTION, AND AGREEMENTS CONCERNING (i) INSURED LETTERS AND BOXES; (ii) POSTAL PARCELS

**ගරු ආර්. එස්. පැල්පොල (තැපැල් හා විදුලි පණිවුඩ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஆர். எஸ். பெல்பொல—தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*

(The Hon. R. S. Pelpola—Minister of Posts and Telecommunications)

The following documents printed by the Ceylon Government as Treaty Series No. 13 and No. 14 of 1959 have been tabled:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

(1) The Universal Postal Convention, together with its final Protocol, Annexes, detailed Regulations, provisions concerning Airmail, and the final Protocol to the provisions concerning Airmail. These comprise Treaty Series No. 13 of 1959.

(2) The Agreement concerning Insured Letters and Boxes, together with its final Protocol and detailed Regulations.

(3) The Agreement concerning Postal Parcels, together with its final Protocol and detailed Regulations, and final Protocol to the detailed Regulations.

(2) and (3) comprise Treaty Series No. 14 of 1959.

Copies of the documents have already been supplied to the hon. Members of this House. These documents will be in force till the end of 1965. The decisions made at the Vienna Congress held this year will be effective from 1st January, 1966.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

1963 ශිවිසුමාවලියෙහි අංක 4—ලංකාණ්ඩුව හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය අතර 1962 නොවැම්බර් මස 21 වැනි දින කොළඹ දී අත්සන් කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආසියානු ක්ෂේත්‍ර කාර්යාලය කොළඹ පිහිටුවීමේ ගිවිසුම.—[රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ගරු සී. පී. ද සිල්වා]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

### AGREEMENT BETWEEN THE I. L. O. AND CEYLON GOVERNMENT

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ எம். பீ. டி சொய்சா சிறிவர்தன —தொழில், வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. P. de Zoysa Siriwardena —Mirister of Labour and Housing)

The Asian Field Office of the International Labour Organization was located in Bangalore in South India for a number of years. The International Labour Organization decided to transfer its Field Office of Asia to Colombo and entered into negotiations with the Government of Ceylon. We welcomed this move and offered the International Labour Organization our fullest co-operation.

The agreement between the International Labour Organization and the Ceylon Government was signed on 21.11.62 and the Asian Field Office was formerly opened on 30.4.63.

The desire to locate this important Field Office in Asia is an indication of Ceylon's growing importance in world affairs and is a tribute to its neutrality. Amongst other benefits that Ceylon would achieve by this transfer of the Field Office to Colombo is the inflow of much needed foreign exchange into the country from persons attending International and Regional Conferences, Seminars and Symposiums. A number of experts will be stationed in Ceylon and the close contact between them and the officers of the Ceylon Government can be of great importance to the future development of this island. There is also the benefit of publicity gained for Ceylon by locating an International Field Office here.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

1963-64 අංක 49, 57 සහ 58 දරන පරිපූරක ඇස්තමේන්තුව.—[කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති හා රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ගරු සී. පී. ද සිල්වා]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

1963-64 අංක 44 හා 59 දරන පරිපූරක ඇස්තමේන්තුව.—[ගරු ආර්. එස්. පැල්පොල]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

(1) 1961 අංක 65 දරන මුදල් පනතේ, 27 හා 60; සහ 56 හා 60 වැනි වගන්ති යටතේ පනවන ලද නියෝග මාලා හතරක්.

(2) පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතෙහි (432 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ පනවන ලද නියෝග මාලාවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(3) ආදායම් බදු ආඥාපනතේ (242 වන අධිකාරය) 95 වන වගන්තිය යටතේ පනවන ලද නියෝගයක්.

(4) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 11 (2) (ii); හා 125 (2) (ඊ) සහ 125; යන වගන්ති යටතේ පනවන ලද ව්‍යවස්ථා මාලා දෙකක්.

(5) 1961 ජූලි මස 1 වැනි දින සිට 1962 සැප්තැම්බර් මස 30 වන දින දක්වා වූ කාලය සඳහා ශේෂ පත්‍රය සහ ගණන් පරීක්ෂකගේ වාර්තාවද ඇතුළත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව.

(6) 1963-64 අංක 48, 55, 56 හා 60 දරන පරිපූරක ඇස්තමේන්තු.—[ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

1963-64 අංක 62 දරන පරිපූරක ඇස්තමේන්තුව.—[ගරු අනිල් මුණසිංහ]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

(1) 1962 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වර්ෂය සඳහා වූ ලංකා තුනී ලෑලි සංයුක්ත මණ්ඩලයේ සහතික කරන ලද ගණන් ශීලව්ද ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

(2) 1963-64 අංක 63 හා 64 දරන පරිපූරක ඇස්තමේන්තු.—ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

117 වන අධිකාරය වන ලියවිලි ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 49 වන වගන්තිය යටතේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගයක්.—[පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්වරිය වෙනුවට ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

## පෙත්සම්

### மனுக்கள்

### PETITIONS

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க—காலி)*
(Dr W. Dahanayake—Galle)

I present a petition from Mrs. D. F. Archibald of No. 9, Havelock Road, Galle. She complains that her husband who is a head guard in the Ceylon Government Railway was interdicted from duty on 29.3.62. He was charged in a court of law and acquitted on 1.6.64. It is now $2\frac{1}{2}$ years since he was interdicted from duty and 3 months since his acquittal by court, but still he remains under interdiction receiving only half his salary.

Mrs. Archibald and her five children are going through a period of great distress and tribulation. She asks that her husband should be re-instated at once.

This is a case of negligence on the part of the Public Service Commission because it has delayed to take action. I hope that the Petitions Committee when going through this case will give a direction to the Public Service Commission that it should carry out its duties with expedition and speed.

**මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතුයැයි නියෝග කරන ලදී.**

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTONS

**වෛද්‍ය විශේෂඥයින්ගේ සේවාවන් ලබා ගැනීම සඳහා යාපනේ චිකිත්සාගාරයක් පිහිටුවීම**

*ஒருமுகப்படுத்தப்பட்ட வைத்தியசோதனைச் சேவை : யாழ்ப்பாணத்தில் பிணியாய் நிலையம் திறுவுதல்*

CHANNELLED CONSULTATION SERVICE: ESTABLISHMENT OF CLINIC IN JAFFNA

1. **එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)**
*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*
(Mr. M. Sivasithamparam—Uduppiddi)
සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සෞඛ්‍ය සේවා අධිකාරිගේ 64.7.24 වැනි දින අංක 322 දරණ චක්‍ර ලේඛය, සාමාන්‍ය වෛද්‍යාචාර්යවරුන්ගෙන් උපදෙස් ලබා ගැනීමට රෝගීන්ට බල කරන්නේ, සාමාන්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

වෛද්‍යවරුන්ගේ මාර්ගයෙන් විශෙෂඥයින්ගේ සේවාවන් ලබා ගත යුතු නිසා ම බව එතුමා දන්නවාද? (ආ) විශෙෂඥයින්ගේ සේවාවන් ලබා ගැනීම පහසු වන පිදි, කොළඹ මෙන්ම යාපනේද චිකිත්සාගාරයක් පිහිටුවීමට එතුමා සලකා බලනවාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) சுகாதார சேவைகள் அதிபதியினது 24.7.64 ஆம் தேதியிடப்பட்ட 322 ஆம் இலக்கச் சுற்றறிக்கைப் பிரகாரம் சாதாரணமாய் வைத்திய விற்பன்னர்களது சேவையைப் பெறவிரும்பும் நோயாளர்கள் அத்தகைய சேவைகளைப் பெறுவதற்கு சாதாரண வைத்தியர்களை முதலிற் கலந்து ஆலோசிக்கவேண்டிய நிர்ப்பந்தத்திற்குட்படுத்தப்பட்டுள்ளன ரென்பதை அவர் அறிவாரா? (ஆ) வைத்திய விற்பன்னர்களது சேவையைப் பெறவிரும்பும் நோயாளர்களுக்கு வாய்ப்பளிப்பதற்கேதுவாக கொழும்பிலுள்ளது போல் யாழ்ப்பாணத்திலும் பிணியாய் நிலையமொன்றினை நிறுவுவதுபற்றி அவர் ஆலோசிப்பாரா?*

asked the Minister of Health: (*a*) Is he aware that by Circular No. 322 of 24.7.64 of the Director of Health Services, patients are compelled to consult general practitioners merely to seek the services of specialists through the general practitioners? (*b*) Will he consider establishing a clinic in Jaffna as in Colombo for the benefit of patients who seek the services of specialists?

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. W. P. G. Ariyadasa—Parliamentary Secretary to the Minister of Health)

(*a*) Yes, as a general rule. However, there is provision for direct consultation by patients in case of emergency. Specialists function primarily as consultants and it is in the public interest to ensure as far as possible that the specialists are available for consultation in all difficult cases. This will not be possible if the time of the specialist is wasted by his being in direct charge of private patients or by the specialist being called upon to attend to cases which a general practitioner is quite competent to attend. The general practitioners who is himself a competent doctor will be in direct charge of private patients and will consult the specialist as and when necessary, whether for diagnosis or for treatment. (*b*) Provision has been made for a consultation clinic in Colombo mainly for the benefit of patients from outstations where specialists are not available. The Health Department is collecting statistics of calls and attendance at all secretariats including Jaffna. After these statistics are collected, the question of establishing consultation clinics in provincial hospitals will be considered as a general issue.

## (උතුර හා නැගෙනහිර පළාත්වල) අත්කම් පරීක්ෂකගේ තනතුර:

### *நூண் கைப்பணிப் பரிசோதகர் பதவி (வட, கிழக்கு மாகாணங்கள்)*

### POST OF HANDICRAFTS INSPECTOR (NORTH AND EAST)

2. එම්. සිවසිතම්පරම් මයා.

*(திரு. எம். சிவசிதம்பரம்)*

(Mr. M. Sivasithamparam)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1963 සිට (උතුර හා නැගෙනහිර පළාත්වල) අත්කම් පරීක්ෂකගේ තනතුර පුරප්පාඩු වී තිබෙන බව එතුමා දන්නවාද? (ආ) මෙම තනතුර ඉක්මණින් පිරවීමට එතුමා කටයුතු කරනවාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) வடக்கு, கிழக்கு மாகாணங்களுக்கான நூண் கைப்பணிகள் பரிசோதகர் பதவி 1963 ஆம் ஆண்டிலிருந்தே வெற்றிடமாக விருக்கின்றதென்பதை அவர் அறிவாரா? (ஆ) இப் பதவியை விரைவில் நிரப்புவதற்கு அவர் நடவடிக்கைகள் மேற்கொள்வாரா?*

asked the Minister of Education: (*a*) Is he aware that the post of Handicrafts Inspector (North and East) has been vacant since 1963? (*b*) Will he take steps to fill this post early?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එස්. කේ. කේ. සූරියාරච්චි මයා. (අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—கல்வி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. K. K. Suriarachchi—Parliamentary Secretary to the Minister of Education)

(*a*) Yes. But arrangements had been made to attend to the inspection of handicraft work in Northern and Eastern Provinces. (*b*) Action has been taken to fill this post early.

## නීවිල් ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම (යාපනය): අභ්‍යන්තර පාරවල් සෑදීම

*யாழ்ப்பாணப் பகுதியிலுள்ள நீவில் கிராம விஸ்தரிப்புத்திட்டம் : உட்பாதை*

NEEVIL VILLAGE EXPANSION SCHEME, JAFFNA DISTRICT : INTERNAL ROADS

5. එම්. සිවසිතම්පරම් මයා.—(ඒ. ශිව සුන්දරම් මයා. වෙනුවට)

*(திரு. எம். சிவசிதம்பரம்—திரு. ஏ. சிவ சுந்தரம் சார்பாக)*

(Mr. M. Sivasithamparam—on behalf of Mr. A. Shivasunderam)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යාපන දිස්ත්‍රික්කයේ නීවිල් ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාරවල් අත්‍යාවශ්‍ය ලෙස සලකන ලද බවත්, යාපනේ දිස්ත්‍රික්ක උපදේශක කාරක සභාව හා දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කාරක සභාව මේ කාර්යය සඳහා අග්‍ර ප්‍රමුඛත්වය දීමට තීරණය කළ නමුත් මෙතෙක් කිසිම දෙයක් කර නැති බව එතුමා දන්නවාද? (ආ) එසේ නම්, අප්‍රමාදව මෙම පාරවල් සෑදීමට එතුමා වහාම ක්‍රියා කරනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) யாழ்ப்பாண மாவட்டத்திலுள்ள நீவில் கிராம விஸ்தரிப்புத் திட்டத்திலுள்ள உள் பாதைவேலைகள் மிக அவசியமானவையெனக் கருதப்பட்டதென்பதையும், யாழ்ப்பாண மாவட்ட ஆலோசனைக் குழுவும் மாவட்ட இணைப்புக்குழுவும் இவ்வேலைகளுக்கு அதிமுன்னுரிமை கொடுக்கப்படவேண்டுமென இரண்டு வருடங்களுக்கு முன்னர் தீர்மானித்தன வென்பதையும், ஆனால் இதுவரை ஒன்றும் செய்யப்படவில்லை யென்பதையும் அவர் அறிவாரா? (ஆ) அவ்வாறாயின், மேலும் காலதாமதமின்றி இப்பாதைகள் அமைக்கப்படுவதற்கு அவர் உடனடியாக நடவடிக்கைகள் மேற்கொள்வாரா?*

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that internal roads in the Neevil Village expansion scheme in the Jaffna District were considered urgent and the D. A. C. and the D. C. C., Jaffna, decided to give top priority to this work about two years ago, but that so far nothing has been done? (*b*) If so, will he take immediate steps to have these roads constructed without delay?

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභා නායක)

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) Yes. The D.A.C. and D.C.C. did give this road priority but as there was no S. D. W. attached to this kachcheri, this decision could not be implemented. (*b*) Yes. Estimates have been prepared and the work will be put in hand no sooner the *Maha* rains are over.

## මදිතියවල බී. ඒ. ධර්මසේන මහතා වන්දි මුදලක් ඉල්ලීම

*மடித்தியாவலவைச் சேர்ந்த திரு. பி. ஏ. தர்மசேன : சுகாதாரப் பகுதியிலிருந்து கோரப்படும் நட்ட ஈடு*

MR. B. A. DHARMASENA OF MADITIYAWALA : CLAIM FOR COMPENSATION FROM HEALTH DEPARTMENT

6. ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මීරිගම ආරෝග්‍ය ශාලාවේ කාරක මණ්ඩලය විසින් 1964.7.7

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැනි දින මදිතියවල බී. ඒ. ධර්මසේන මහතාට නික්ෂේපණයක් දෙන ලද බවත් මෙම නික්ෂේපණය දුන් වහාම ඔහුගේ දකුණු අත පණ නැති වී ගිය හෙයින් එයට පසුව ඔහු කොළඹ මහා රෝගයශාලාවේ ශල්‍ය චිකිත්සාගාරයට යවන ලද බවත් එතුමා දන්නවාද? (ආ) මෙම නික්ෂේපණය නිසා ඔහුගේ අරීය ස්නායුව තුවාල වූ බැවින් ඔහු 6 බී දරණ වාට්ටුවේ නැවතී සිටි බවත් (ලියා පදිංචි අංකය 48744) දැන් ඔහු සම්පූර්ණයෙන්ම පණ නැති වී ගොස් සිටින බවත් එතුමා දන්නවාද? (ඉ) ආරෝග්‍යශාලාවේ කාර්ය මණ්ඩලයේ නොසැලකිල්ල නිසා සිදු වූ මෙය වෙනුවෙන් ඔහුට සෑහෙන වන්දියක් වහාම ගෙවීමට එතුමා ක්‍රියා කරනවාද? (ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினு: (அ) மடித்தியாவலவைச் சேர்ந்த திரு. பி. ஏ. தர்மசேன என்பவருக்கு மிரிகம வைத்தியசாலைப் பணியாளர் 7.7.64 இல் ஊசிமூலம் மருந்தேற்றினரென்பதையும் அவ்வூசிமருந்தேற்றியதையடுத்து அவரது வலது கை உடனடியாய் வலுவிழந்தமையால் கொழும்பு அரசினர் வைத்தியசாலையின் சத்திர சிகிச்சை நிலையத்திற்கு அவர் மாற்றப்பட்டாரென்பதையும் அவர் அறிவாரா? (ஆ) ஊசியேற்றியதன் விளைவாய் அவரது முக்கிய இரத்தக் குழாய் பாதிக்கப்பட்டமையால் 6B என்னும் இலக்கங் கொண்ட சிகிச்சைக்களத்தில் அவர் அனுமதிக்கப்பட்டிருந்தாரென்பதையும் தற்பொழுது அவர் முற்றிலும் வலுவிழந்த நிலையிலுள்ளாரென்பதையும் அவர் அறிவாரா? (இ) வைத்தியசாலைப் பணியாளர்களது கவலையீனத்திற்காக அவருக்கு உடனடியாய்ப் போதிய அளவு நட்டஈடு வழங்குவதற்கு அவர் நடவடிக்கைகள் எடுப்பாரா? (ஈ) இல்லையெனில், ஏன்?

asked the Minister of Health: (*a*) Is he aware that the staff of the Mirigama Hospital administered an injection on B. A. Dharmasena of Maditiyawala on 7.7.64 and that he was referred to the Surgical Clinic, G. H., Colombo, thereafter as his right arm was crippled immediately after the injection? (*b*) Is he aware that he was in Ward 6 B (Reg. No. 48,744) as his radial nerve had been damaged due to the injection and that he is now completely crippled? (*c*) Will he take steps to pay him adequate compensation immediately for the negligence of the Hospital Staff? (*d*) If not, why?

**ආරියදස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

(අ) එසේය. (ආ) එසේය. ඔහුට දකුණු අත සෙලවිය නොහැක. (ඉ) රෝගියා තවම ප්‍රතිකාර ලබන හෙයින් වන්දි ගෙවීමේ ප්‍රශ්නයක් පැන නොනගී. සුදුසු ප්‍රතිකාර කිරීමෙන් පසුව අතේ ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට ගෙන ඒමට හැකිවන්නට පුළුවන. (ඊ) පැන නොනගී.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

මේ රෝගියා පසුගිය සතියේ තරම ආරෝග්‍යශාලාවෙන් අස් කර යවා තිබෙනව. එහෙත් අද වනතුරු ඔහුගේ ඒ අත සොලවන්ට බැහැ. ඇමතිතුමා ඒ බව දන්නවාද?

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳ වැඩි විස්තරවල මේ අන්දමටයි තිබෙන්නෙ: ස්නායුව යළි පණ ගැන්වීමට පුළුවන් වෙතැයි කල්පනා කළෙන්, රෝගියා කායික වෛද්‍ය අංශයට ප්‍රතිකාර පිණිස යවන ලදි. එහිදී අප තැත අසාර්ථක වුවොත්, ස්නායු බද්ධය පිණිස ශල්‍යකර්ම විධි සැලසීමට ක්‍රියා කළ යුතු වේ. රෝගය ගැන කිසිවක් දැන්ම කිය නොහැකිය.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විශෙෂයෙන්ම මේ ප්‍රශ්නය අහන්නෙ ඒ රෝගියාගේ පවුලේ නව දෙනකු සිටින නිසයි. කොයි විධියකටදැයි මා දන්නෙ නැහැ; ඉන්ජේක්ෂන් එකක් ගැසීමෙනුයි, මේ තත්ත්වය හටගැනී තිබෙන්නෙ. සාමාන්‍යයෙන් පෙනිසිලිං ඉන්ජේක්ෂන් එකක් ගහගන්ටයි ඔහු ගියේ. එහෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

එය ගැසූ වේලේ සිට අත පණ නැතිව ගියා. දැන් මාස 6ක් පමණ ගත වී තිබෙන නමුත් අද දක්වා අත හොලවන්ට බැහැ. ඔහුට යම්කිසි වන්දියක් හෝ යැපෙන්ට තාවකාලික මුදලක් මාස්පතා ගෙවීමට හෝ කටයුතු කරනවාද කියා මා අහන්ට කැමතියි.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ඒකට මට මේ අවසථාවේදී පිළිතුරක් දෙන්ට අමාරුයි. මා ඒ ගැන සොයා බලන්නම්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ක්ෂය රෝගීන්ට දෙන්නා වගේ ආධාර යක් ලබා දෙන්න.

**ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்பு தெற்கு முதலாம் அங்கத்தவர்)*
(Mr. J. R. Jayewardene—First Colombo South)

මාත් ඒ කාරණය ගැන පාර්ලිමේන්තු ලේකම්තුමාට වචනයක් කියන්ට කැමතියි. මේ කාරණය ඇත්තටම භයානක සිද්ධියක්. "නික්ෂේපණයකින්"—ඒ වචනය පාවිච්චි කර තිබෙන්නෙ ඉන්ජෙක්ෂන් එකටයි—බරපතළ තුවාලයක් සිදුවන්ට; අතක් පණ නැතිවන්ට, ආරෝග්‍යශාලාවේ නිලධාරීන් අත මොකක් හෝ නොසැලකිල්ලක් ඇති. ඒ නිසා මාත් ඉල්ලා සිටිනවා, ඒ රෝගියාට සිදු වුණේ කුමක්දැයි සොයා බලන්න කියා. ඒ වගේම ඒ දුප්පත් අහිංසක තැනැත්තාට වන්දියක් නැත්නම් ආධාරයක් දිය යුතුය කියාත් මා කල්පනා කරනව.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ඒ ගැන වැඩිදුරටත් සොයා බැලීමට නියෝග කරනවා.

## ඇහැලියගොඩ ආරෝග්‍යශාලාවේ අංක 8 දරණ වාට්ටුව අලුත්වැඩියා කිරීම
## எஹெலியகொட வைத்தியசாலை : 8 ஆம் இலக்க சிகிச்சை அறையைப் பழுதுபார்த்தல்
## EHELIYAGODA HOSPITAL : REPAIRS TO WARD NO. 8

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (දෙහිවල-ගල්කිස්ස)—(පී. බී. විජේසුන්දර මයා.—කිරිඇල්ල—වෙනුවට)
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா—தெகிவலை-கல்கிசை—திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல சார்பில்)*
(Dr. Colvin R. de Silva—Dehiwala-Mt. Lavinia)—(on behalf of Mr. P. B. Wijesundara—Kiriella)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ඇහැලියගොඩ ආරෝග්‍යශාලාවේ අංක 8 දරණ වාට්ටුව අලුත්වැඩියා කිරීම සඳහා වූ ඇස්තමේන්තුව අනුමත කර තිබේද? එසේ නම්, ඒ කවදාද? (ආ) මෙම වාට්ටුවේ අවශ්‍ය අලුත්වැඩියා කිරීම් කරගෙන යැමට ඇති ප්‍රමාදය කුමක්ද? (ඉ) මෙය කරන්නේ කවදාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) எஹெலியகொட வைத்தியசாலையின் 8 ஆம் இலக்கச் சிகிச்சைக் களத்தைப் பழுதுபார்ப்பதற்குரிய மதிப்பீடு அங்கீகரிக்கப்பட்டதா? ஆமெனில் எப்பொழுது? (ஆ) இச்சிகிச்சைக் களத்திற்குத் தேவையான திருத்தங்களைச் செய்வதில் உள்ள தாமதமென்ன? (இ) அது எப்பொழுது செய்யப்படும்?*

asked the Minister of Health: (a) Has the estimate for repairing ward No. 8 of the Eheliyagoda Hospital been approved, and if so, when? (b) What is the delay in carrying out the necessary repairs to this ward? (c) When will this be done?

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

(අ) එසේයි. වැය තක්සේරුව දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද්දේ 1963.12.16 වනදාය. (ආ) ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීමට සිදුවිය. දැන් වැඩ කෙරීගෙන යයි. (ඉ) වැඩ කටයුතු 1964.9.28 වනදා වනවිට අවසන් වේතැයි අපි බලාපොරොත්තු වෙමු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

**කේ. එච්. ජී. ඇල්බට් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

*(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தர-எல்பிட்டிய)*

(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ අංශයේ ඇස්තමේන්තු පිළියෙළ කිරීම පසුගිය කාලයේ ඉතාමත්ම ප්‍රමාද වන තත්වයක් තිබුණා. ඒ තරම් ප්‍රමාදයක් මේ රටේ වෙන කොහේවත් තිබුණේ නැහැ. ඒ ප්‍රමාදය වළක්වන්ට ක්‍රියා කරනවාදැයි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා අහන්ට කැමතියි.

**ආරියදාස මයා.**

*(திரு. ஆரியதாச)*

(Mr. Ariyadasa)

ඔව්.

## දෙහිපහල උප තැපැල්කාර්යාලයක් පිහිටුවීම

*தெஹிபாஹலவுக்கு உப தபாற்கந்தோர்*

SUB-POST OFFICE FOR DEHIPAHALA

3. **ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**—(ඩී. පී. ආර්. වීරසේකර මයා.—රත්නපුර වෙනුවට)

*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—திரு. டி. பீ. ஆர். வீரசேக்கர சார்பாக)*

(Dr. Colvin R. de Silva—on behalf of Mr. D. P. R. Weerasekera—Ratnapura)

තැපැල් හා විදුලි පණිවුඩ කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දෙහිපහල හා කීරගලට තැපැල් පහසුකම් කොහෙත්ම නැති බව එතුමා දන්නවාද? (ආ) දෙහිපහල උප තැපැල් කාර්යාලයක් විවෘත කිරීමට එතුමා ක්‍රියා කරනවාද?

*தபால் தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) தெஹிபாஹல, கீராகல ஆகிய இடங்களுக்குத் தபால் வசதிகள் எதுவுமில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) தெஹிபாஹலவில் உபதபால் நிலையமொன்று திறப்பதற்கு அவர் நடவடிக்கைகள் மேற்கொள்வாரா?*

asked the Minister of Posts and Telecommunications: (*a*) Is he aware that Dehipahala and Keeragala have no postal facilities at all? (*b*) Will he take steps to open a Sub-Post Office in Dehipahala?

**ගරු පැල්පොල**

*(கௌரவ பெல்பொல)*

(The Hon. Pelpola)

(අ) දෙහිපහල ග්‍රාමයේ කොටසකට දැනටමත් කුරුවිට තැපැල් කාර්යාලයෙන් ලියුම් බෙදීමේ සේවයක් සලසා ඇත. දෙහිපහල ඉතිරි කොටසට හා කීරගලට තැපැල් පහසුකම් දීර්ඝ කිරීමේ ප්‍රශ්නය මිළඟ වරට කුරුවිට තැපැල් කාර්යාලයේ ලියුම් බෙදීමේ කොට්ඨාශ ප්‍රතිශෝධනය කරන කල්හි සලකා බලන්නෙමි. (ආ) නැත. අළුතින් උප තැපැල් කාර්යාල විවෘත කිරීම සඳහා මුදල් නොමැත.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.** (නිවිතිගල)

*(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவிதிகல)*

(Mr. Stanley Molligoda—Niwitigala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. කුරුවිට සිට දෙහිපහල ගමට හැතැප්ම 14 ක් පමණ දුර බව ගරු ඇමතිතුමා දන්නවාද? එමෙන්ම මේ කුරුවිට තැපැල් කාර්යාලයෙන් දෙහිපහල ගමට කිසිම සේවයක් ඇති වන්නෙ නැහැ. රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා දෙහිපහලට තැපැල් කන්තෝරුවක් ඉල්ලුවෙත් මේ ප්‍රශ්නය ඉදිරිපත් කළෙත් ඒ නිසා තමයි. කුරුවිට තැපැල් කන්තෝරුවෙන් දෙහිපහල ගමට සේවයක් වෙන්නෙ නැහැ. ඒ නිසා දෙහිපහල ග්‍රාමයට හෝ කීරගලට හෝ වහාම උප තැපැල් කන්තෝරුවක් ලබාදීමට ගරු ඇමතිතුමා වහාම නියෝග කරනවාද? ඒ අයට තැපැල්වලින්වත් විදුලි සන්දේශවලින්වත් අද සේවයක් ඇත්තෙ නැහැ.

**ගරු පැල්පොල**

*(கௌரவ பெல்பொல)*

(The Hon. Pelpola)

දෙහිපහල ගමට හැතැප්ම 14 ක් ය කියා ගරු මන්ත්‍රීතුමා කී නමුත් කුරුවිට ආදායම් පාලක නිලධාරිතුමා ලියා තිබෙන හැටියට එයට ඇති දුර ප්‍රමාණය හැතැප්ම 3/4 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දුර කියන්නෙ කපුටෙක් ඉගිලෙන හැටියට. කපුටෙක් ඉගිලෙන හැටියට හැතැප්ම 3/4 යි. පාරවලින් යනවා නම් ඊට වැඩියි.

**ගරු පැල්පොල**
*(கௌரவ பெல்பொல)*
(The Hon. Pelpola)

කුරුවිට කෝරළයට දුර හැතැප්ම 3/4ක් ය කියා තිබෙනව. බටතොට "සී" පෙළේ තැපැල් කන්තෝරුවෙන් ඒ ලියුම් බෙදා දෙනවාය කියාත් තිබෙනව. කීරගල කියන තැපැල් කන්තෝරුවට තිබෙන්නෙ එක ඉස්කෝලයයි වත්තයි පමණයි.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

ඉස්කෝල එක වෙන්න පුළුවන්. නමුත් මිනිසුන් හුඟක් සිටිනව. මේ දෙහිපහල කියන ගම ඉතාම තදබදය ඇති ගමක්.

## ශෝක ප්‍රකාශය : ආර්. එම්. ගුණසේකර මයා.

*அனுதாபத் தீர்மானம் : காலஞ்சென்ற திரு. ஆர். எம். குணசேக்கர*

## VOTE OF CONDOLENCE: MR. R. M. GUNASEKERA

අ. භා. 2.25

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Mr. Deputy Speaker, I have to refer to the death under tragic circumstances of Mr. R. M. Gunasekera who was an honourable Member of this House. The late Mr. Gunasekera was elected to the Bibile electorate in March, 1960. He took a keen interest in the welfare of his village and was a popular figure in his area. He was also the Chairman of the Medagama Village Committee.

I request you, Mr. Deputy Speaker, to direct the Clerk of the House to send a copy of these proceedings to the members of the bereaved family and convey to them our deepest sympathy.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.** (මහියංගන)
*(திரு. சீ. பீ. ஜே. செனவிரத்ன—மஹியங்கனை)*
(Mr. C. P. J. Seneviratne—Mahiyangane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද ඒ ශෝක ප්‍රකාශනය ස්ථිර කරමින් මේ අවස්ථාවේදී ඉතා කනගාටුවෙන් කරුණු කීපයක් සඳහන් කළ යුතුව තිබෙනව. බිබිලේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. එම්. ගුණසේකර මහතා 1960 මාර්තු මාසයේදී බිබිලේ ආසනය සඳහා මහජන ඡන්දයෙන් තේරී පත්ව මේ පාර්ලිමේන්තුවට පැමිණියා. සුළු කාලයක් මේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ සේවය කර ජූලි මාසයේ පැවැති මැතිවරණයෙන් ඔහු පරාජයට පත් වූ නමුත්, එසේ පරාජයට පත් වී මේ අවාසනාවන්ත අභාවයට පත්වූ දිනය වන තුරු—මේ වර්ෂ 4 මුළුල්లේම—එතුමාගේ සම්පූර්ණ කාලය කැප කළේ මහජන සේවය සඳහාමයි. මහජන ඡන්දයෙන් එදා එතුමා පැරද්දෙව්වාය කියා මහජනයා සමග විරුද්ධ වී දේශපාලන වෛර බැඳගෙන එතුමා ක්‍රියා කළේ නැහැ. මහජනයා විසින් එතුමාගේ හිස මත යම්කිසි වග කීමක් පවරා තිබෙනවාය කියන හැඟීමෙන් ඔහු කටයුතු කළා. එමෙන්ම නොදියුණු ප්‍රදේශයක් වන පහළ ඌවේ දුප්පත් ජනතාව වෙනුවෙන් යම්කිසි සේවයක් කිරීමට ඔහු බැඳී සිටිනවාය කියන චේතනාව උඩ මහජනයා සමග උරෙනුර ගැටී වාසය කරමින් දුප්පතාගේ ඕනෑ එපාකම්වලට සෑම අවස්ථාවකම ඉදිරිපත් වෙමින් එතුමාගේ ජීවිත කාලය ගත කළා. එසේ ගත කළේ එතුමාගේ පෞද්ගලික සැපපහසුකම් හෝ ආර්ථික අඩුපාඩුකම් හෝ වෙනත් ඕනෑ එපා කම් ගැන සළකා බලා නොවෙයි. පෞද්ගලිකව එතුමා මගේ මිත්‍රයකු බව මා මතක් කරන්ට සතුටුයි. ඇත්ත වශයෙන්ම මිත්‍රයකු හැටියට එතුමා ඉතාම අවංක මිත්‍රයෙක්. ඒ වාගේම මහජන සේවකයකු හැටියටත් එතුමා ඉතාම අවංක වැදගත් සේවකයෙක්. කණගාටුවට කාරණය නම්, මෙවැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවකයකුට, පහළ ඌව වැනි නොදියුණු ප්‍රදේශයකින් ඉදිරිපත් වූ ඒ පොළොවේම උපන් මෙවැනි දරුවකුට, අනාගතයේදී ඒ ප්‍රදේශයේ මහජන නායකයකු වන්නට නැත්නම් මහජනයාට යම්කිසි විශ්වාසයක් තැබිය හැකි පුද්ගලයකු වීමට තිබුණු ඉඩ මෙවැනි අකල් අවාසනාවන්ත මරණයකින් නැතිව යැමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1960 මාර්තු මාසයේදී, මේ ගරු සභාවේ එතුමා කළ පළමුවැනි කථාව මට මතකයි. එදා තිබුණේ එක්සත් ජාතික පක්ෂය පිහිටෙවූ තාවකාලික ආණ්ඩුවයි. එම පක්ෂයෙන්ම එතුමා ඉල්ලා සිටියේ, වර්ෂ හතක් අටක් තිස්සේම ඌව ප්‍රදේශයේ ගොවි ජනතාව ඔවුන්ගේ ගොවිතැන් වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා තුවක්කු බල පත්‍ර නොදුන් නිසා, ඉතා වැදගත් ලෙස ඒ ගැන කල්පනා කර බලා වහාම තුවක්කු බලපත්‍ර ලබා දෙන්න ක්‍රියා කරන්නය කියායි. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ එතුමා කළ පළමුවැනි කථාවේ පළමුවැනිම ඉල්ලීම එයයි. එදා එතුමා විසින් ඒ දුප්පත් ජනතාව වෙනුවෙන් යම්කිසි ප්‍රති පත්තියක් උඩ යම්කිසි සටනක් ගෙන ගියා නම්, එහි ප්‍රතිඵලයක් වශයෙන් 1961 වර්ෂයේ සිට වර්තමාන රජය විසින් ඒ ප්‍රදේශවලට නැවතත් තුවක්කු බලපත්‍ර නිකුත් කරන්ට පටන් ගත්තා. සමහර විට එතුමාට වෙඩි පහර වැදුණේ ඒ පලපත්‍ර යකින්ම ලබාගත් තුවක්කුවකින්ම වෙන්න ඇති. කණගාටුවට කාරණය ඒකයි. තවද එතුමා සේවය කරන කාලයේ දෙවරක්ම එතුමා මැදගම්පත්තුවේ ගම්කාර්‍ය සභාවේ සභාපති හැටියට සේවය කළා. එපමණක් නොවෙයි; මීට මාස තුනකට පෙර තිබුණු ගම් කාර්ය සභා මැතිවරණ යේදී කොට්ඨාශ 14 කින් 13 ක්ම දිනා ගනිමින් එතුමාගේ කණ්ඩායම විශිෂ්ට ජයග්‍රහණයක් අත් කර ගත්තා. මහ ජනයා මොන තරම් ජනප්‍රසාදයක් මෙතුමා කෙරෙහි ඇති කර ගත්තාද කියා මේවායින් පෙනෙනවා. එවැනි මහජන සේවකයකු අවසථාවාදී, දේශද්‍රෝහී යම්කිසි පුද්ගලයකු විසින් අභාවයට පත් කිරීම අප කාගේත් කණගාටුවට කරුණක් මෙන්ම භයටත් කරුණක් වෙනව. සුළු කාලයක් තුළදී එතුමා විසින් කරන ලද සේවය අමරණීයයි. එම නිසා එතුමාගේ නාමය නොදිරනවා ඇති.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

Sir, I wish to express my sincere sorrow on the passing away of Mr. R. M. Gunasekera, the former Member for Bibile. I knew the late Mr. Gunasekera nearly 20 years ago when I fought the Bibile seat and I remember him as one of the most valiant fighters for the cause of the peasants of Wellassa. During the last 20 years he identified himself with every public movement of importance and, I think, he was a most exemplary public man. Whatever may have been his party, Sir, we have lost a great and valiant fighter and I am sorry that his death has been brought about under such tragic circumstances.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர்)*

(Mr. Deputy Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවර ආර්. එම්. ගුණසේකර මහතාගේ අභාවය පිළිබඳ මන්ත්‍රී මණ්ඩලයේ දෙපාර්ශ්වයෙන් ම කරන ලද ශෝක ප්‍රකාශ අනුමත කිරීමට මම කැමැත්තෙමි. අද දින රැස්වීමට අදාළ කාර්ය සටහන්හි පිටපතක් වියොවට පත් වූ පවුලේ අය වෙත යවන මෙන් මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්ට නියෝග කරමි.

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of Mr. R. M. Gunasekera, ex-Member of Parliament. I shall request the Clerk of the House to make a minute of the proceedings of the meeting today and send a copy thereof to the members of the bereaved family.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

## BILLS PRESENTED

### AGRICULTURAL AND INDUSTRIAL CREDIT CORPORATION (AMENDMENT) BILL

"to amend Agricultural and Industrial Credit Corporation Ordinance."

**පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා විසිනි. 1964 සැප්තැම්බර් 29 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.**

## නොපැමිණීමේ අවසරය

*வராதிருக்க அனுமதி*

## LEAVE OF ABSENCE

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය :**

"1946 ලංකා ආණ්ඩුක්‍රම රාජ සභා ඇඳෑවේ 24 (1) (ඊ) ඡේදය යටතේ පානදුරයේ මන්ත්‍රීවර ලෙස්ලි ගුණවර්ධන මහතාට 1964 සැප්තැම්බර් මස 28 වන දින සිට මාස 3 ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

*சபை அலுவல்*

## BUSINESS OF THE HOUSE

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය :**

අංක 24 දරණ ස්ථාවර නියෝගයේ කුමක් සඳහන්ව තිබුණද, න්‍යාය පත්‍රයේ අංක 17 සිට 21 දක්වා ඇති යෝජනා ගැන අද දින ක්‍රියා කළ යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

*சபை அமர்வு*

## SITTING OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பி. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 2 p.m. on Tuesday, 29th September, 1964."

**ප්‍රශ්නය සභාසම්මත කරන ලදී.**

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

We should like to know what the time table will be in the coming month. There is the Press Bill that will be coming up very soon. We want to know what arrangements will be made for a full debate on the Press Bill. I am sure the Hon. Leader of the House will agree with me that it will be very necessary to debate the Press Bill fully. We should like to know what the time table will be in the coming weeks so that we may be able to make arrangements for our other work. Are we meeting next week? How many days does the Hon. Leader of the House propose that we should meet next month? Has he any idea of the time table for the Sittings of this House?

Then there are certain other very important questions. There are certain Motions of which notice has been given. One is the Motion under the names of several Members of the Opposition concerning the appointment of a Select Committee. There are various other Motions of importance. There is also the White Paper on Education that is pending.

It is, therefore, very necessary that hon. Members should have an idea of what the Sittings of the House will be during the coming months. Has the Hon. Leader any idea of the time table?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பி. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I quite agree with the hon. Member for Galle (Dr. W. Dahanayake) that hon. Members should have an idea of what the Sittings will be and what the programme of work will be. I shall take the matter up through the usual channels and settle it, probably by tomorrow.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

I think the Hon. Leader of the House has already given a promise about the Motion that deals with the appointment of a Select Committee.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

## වැය සම්මතවල අතිරික්ත, 1961-62

மிகை வாக்குப் பணம், 1961-62

EXCESS VOTES, 1961-62

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා (මුදල් ඇමති)
(கௌரவ கலாநிதி என். எம். பெரேரா—நிதி அமைச்சர்)
(The Hon. Dr. N. M. Perera—Minister of Finance)

These are all Excess Votes which have not been disallowed by the Public Accounts Committee.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

Excess Vote No. 6 is for a sum of Rs. 37,204.06. Will the Hon. Minister of Finance please give us some idea of what this is about ?

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

Shall we pass Excess Votes 1 to 5 ? Then we can take up 6.

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

That a sum not exceeding Rs. 33.29 be granted to make good an excess, reported by the Public Accounts Committee on Head 60, Vote 2, Estimates 1961-62. [ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

That a sum not exceeding Rs. 10,671.58 be granted to make good an excess, reported by the Public Accounts Committee on Head 85, Vote 4, Estimates 1961-62. [ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

That a sum not exceeding Rs. 10,820.50 be granted to make good an excess, reported by the Public Accounts Committee on Head 99, Vote 2, Estimates 1961-62. [ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

That a sum not exceeding Rs. 9,595.64 be granted to make good an excess, reported by the Public Accounts Committee on Head 102, Vote 6, Estimates 1961-62. [ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

That a sum not exceeding Rs. 21,699.43 be granted to make good an excess, reported by the Public Accounts Committee on Head 164, Vote 6, Estimates 1961-62. [ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

I move,

"That a sum not exceeding Rs. 37,204.06 be granted to make good an excess, reported by the Public Accounts Committee on Head 169, Vote 2, Estimates 1961-62."

The provision allowed in the Estimates 1961-62 under this particular Head was Rs. 10,800,000. The previous year the amount was Rs. 11,430,000, which was far below the actual requirements, according to the department. The total expenditure in 1961-62 amounted to Rs. 11,530,000. During the course of the financial year, savings to the extent of Rs. 625,000 were transferred from anticipated expenditure under certain sub-heads of Vote No. 2. However, on finalization of the accounts of the year, some sub-heads were found to have been exceeded. Having set off all the available savings within the Vote against the excess, there was still a balance of Rs. 30,000 to be covered mainly due to very heavy expenditure incurred at the end of the year under Sub-head 13, "Maintenance and improvements of telecommunication Services."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

සම්මති 1 සිට 6 දක්වා සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

I move,

"That the House doth agree with the Committee in the said Resolutions."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## වැය සම්මතවල අතිරික්ත, 1960-61

வாக்குப்பண மிகைச் செலவு, 1960-61

## EXCESS VOTES, 1960-61

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

I move :

"That, notwithstanding the proviso to paragraph 5 of Standing Order No. 129, this House do resolve itself into a Committee to consider grants to make good Excesses on the sum granted for the financial year 1960-61."

May I move that the House do now go into Committee.

ප්‍රශ්නය සභාසම්මත කරන ලදී.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (වත්තල)
(திரு. டீ. செல்டன் ஜயசிங்ஹ—வத்தளை)
(Mr. D. Shelton Jayasinghe—Wattala)

There are no details given.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

You will find the details in the Auditor-General's Report. The financial accounts will carry all the details.

If the hon. Member presses, I have no objection to taking it up tomorrow.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Tomorrow.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

If the hon. Member seriously objects, I do not mind taking it up tomorrow. May I point out that all these are Excess votes, 1960-61, approved by the Public Accounts Committee as not being disallowed.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

In that case I have no objection to taking them up now.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

These are formal items of two or three years ago which are just cluttering up the Order Paper. I have no objection to taking them up tomorrow. The details are there in the financial accounts. If the hon. Member feels that I should formally move them, I am prepared to do it tomorrow.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කාරකසභාව 1964 සැප්තැම්බර් 29 වන අඟහරුවාදා.

## පරිපූරක මුදල : තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යංශයේ පෞද්ගලික පඩිනඩි ආදිය

குறை நிரப்புந்தொகை : தபால், தந்தி அமைச்சு, ஆளுக்குரிய வேதனம் முதலியன :

## SUPPLEMENTARY SUPPLY : MINISTRY OF POSTS AND TELECOMMUNICATIONS, PERSONAL EMOLUMENTS, ETC.

ගරු පැල්පොල
(கௌரவ பெல்பொல)
(The Hon. Pelpola)

I move :

"That a supplementary sum not exceeding Rupees Seventy-seven thousand two hundred and eighty-six

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(Rs. 77,286) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October, 1963, and ending on 30th September, 1964, and that the said sum may be expended as specified in the Schedule hereto :—

SCHEDULE

| | Rs. |
|---|---|
| New Head 163—Minister of Posts and Telecommunications | |
| Vote No. 1—Personal emoluments and other allowances of staff .. .. | 50,495 |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. .. | 26,791 |
| | 77,286 |

This sum is required to meet the cost of salaries, cost-of-living and other allowances, travelling, stationery, furniture, electric current and rent for housing.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

අ. භා. 2.43

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
**(Dr. W. Dahanayake)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම වැය ශීර්ෂය යටතේ රුපියල් 77,286 කුත් මෙම න්‍යාය පත්‍රයේ අංක 16 වශයෙන් සඳහන් වී ඇති වැය ශීර්ෂය යටතේ තවත් රුපියල් ලක්ෂ 16 ක පමණ මුදලකුත් තැපැල් හා විදුලි සංදේශ ඇමති අංශයට ඉල්ලා තිබෙනව. මෙම ඇමති අංශය මහජනයාගේ දිනපතා ඔනෑ එපාකම් ඉටු කිරීම සම්බන්ධව ඉතාමත්ම විශාල වගකීමක් ඇති ඇමති අංශයක්. අයවැය විවාදයේදී මෙම ඇමති අංශය ගැන සාකච්ඡා කිරීමට ඉඩ නොලැබීම ගැන අපි කනගාටු වෙනව. එම නිසා ඒ අඩුපාඩුව තරමක් දුරටවත් පිරිමසා ගැනීමට මේ වැය ශීර්ෂ යටතේ කෙරෙන වාද විවාදවලදී අවස්ථාව ලැබේයයි මම බලාපොරොත්තු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව අද ලංකාවේ තිබෙන ඉතාමත්ම දුර්වල දෙපාර්තමේන්තුවක්; මහජනයාට හිරිහැර කරන දෙපාර්තමේන්තුවක්. මේ දෙපාර්තමේන්තුව තමන්ගේ රාජකාරී නිසි විදියට නොකරන දෙපාර්තමේන්තුවක් වී තිබෙනව. මේ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට වැළඳී තිබෙන බරපතළ අසනීපය අද ඊයේ එකක් නම් අපට එය මොහොතකින් අමතක කරන්න පුළුවන්කම තිබෙනව. නමුත් අවුරුදු ගණනක් තිස්සේම මාසයෙන් මාසයට, දවසෙන් දවසට, පැයෙන් පැයට, විනාඩියෙන් විනාඩියට මේ දෙපාර්තමේන්තුවේ තත්ත්වය දුර්වල වී අද ඉතාමත්ම නරක දුර්වල තත්ත්වයකට පත් වී තිබෙනව. සාමාන්‍ය මහජනයා තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවෙන් ඉතා විශාල වැඩ කොටසක් කර ගැනීමට බලාපොරොත්තුවෙන් සිටිනව. මේ දෙපාර්තමේන්තුවේ අද තිබෙන තත්ත්වය නිසා සාමාන්‍ය මහජනයාට කොපමණ හිරිහැර ඇති වී තිබෙනවද යන්න මම දන්නව. අද විදුලි පණිවුඩයක් යැව්වොත් දවස් තුනකින්වත් ඒ විදුලි පණිවුඩය ලැබෙන්නෙ නැහැ. සාමාන්‍ය ලිපියක් විදුලි පණිවුඩයට වඩා ඉක්මනින් ලැබෙනව. ලියා පදිංචි කරන ලද ලිපියක් සාමාන්‍ය ලිපියකට වඩා ඉක්මනින් ලැබෙනව. අද විදුලි පණිවුඩයක් යැවීමේ කිසිම වැදගත්කමක් නැහැ. අද විදුලි පනිවුඩ සේවයක් තිබීම වංචාවක්. එය මේ ආණ්ඩුව කරන වංචා සහිත වැඩක්. නමුන්නාන්සෙලා විදුලි පණිවුඩවලට මුදල් අය කර ඒ විදුලි පණිවුඩය යැවීම දවස් 3 ක් ප්‍රමාද කිරීම හොරකමක්; බරපතළ නින්දිත වංචාවක්. ඇයි, මා එහෙම කියන්නෙ? විදුලි පණිවුඩ සේවය තිබෙන නිසා සාමාන්‍ය ජනයා විශාල අමාරුවකට පත් වී තිබෙනව. විදුලි පණිවුඩයක් පැය ගණනකින් යාවිය කියා සාමාන්‍ය මහජනයා විශ්වාස කරනව. මරණයක් සම්බන්ධව හෝ හදිසි වුවමනාවක් සම්බන්ධව හෝ යවන විදුලි පණිවුඩයක් පැය ගණනකින් නොගියොත් ඒ විදුලි පණිවුඩයේ වැදගම්මක් නැහැ. දවස් තුනකට පසු ඒ විදුලි පණිවුඩය දීම හොරකමක්. මේ ආණ්ඩුවට විදුලි පණිවුඩ සේවය හොඳින් පවත්වාගෙන යන්න බැරි නිසා එය අතහැර දමනවා යයි ආණ්ඩුව කියනවා නම් මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

කැමතියි. කරගෙන යන්න බැරි දෙයකට අනගසා එය සේවයක් හැටියට මහජනයා ඉදිරිපිට තැබීම වංචාවක් බව මතක් කරන්න ඕනෑ. මොකටද මේ වංචාව කර ගෙන යන්නේ ? මේ වංචාවෙන් සාමාන්‍ය මිනිසාට පහර වදිනවා. මේ විදුලි පණිවුඩ සේවය මෙතරම් දුර්වල තත්ත්වයකට වැටී තිබෙන්නේ කුමන කරුණක් නිසා දැයි මා ගරු තැපැල් ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරනවා. මේ සේවාව මීට වඩා හොඳින් පවත්වා ගෙන යෑම සඳහා යොදා තිබෙන විධිවිධාන මොනවාද ? මාතර ගරු මන්ත්‍රීතුමා තැපැල් සහ විදුලි පණිවුඩ ඇමති ධුරය භාර ගන්නට අකමැති වූ බවක් ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණා. මගේ කල්පනාව නම් දැනට මේ ඇමති ධුරය භාරගෙන තිබෙන්නේ මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ සිටින ඉතාමත්ම දක්ෂ, වැඩ කිරීමට ශක්තියක් ඇති ප්‍රබල මන්ත්‍රීවරයකු බවයි. මේ ඇමති අංශය භාර ගන්නට කෙනකු ලජ්ජා විය යුතු නැහැ. ලජ්ජා වෙනවා වෙනුවට මේ අංශය සතුටින් භාරගෙන දැනට තිබෙන අසතුටුදායක තත්ත්වය මඟහරවන්නට ඕනෑ. විදුලි පණිවුඩ සේවය නියම විදුලි පණිවුඩ සේවයක් බවට පත් කිරීමට තැපැල් ඇමතිතුමා මොන විධිවිධාන යොදා තිබෙනවාද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට අවුරුදු 100 කට පමණ පෙර පරෙවියන් ගේ මාර්ගයෙන් ගාල්ලේ සිට කොළඹට සන්දේශ යවා තිබෙනවා. ගාල්ලේ සිට කොළඹට සන්දේශ ගෙන ඒම සඳහා පරෙවියන් යොදනවා නම් දැනට තිබෙන විදුලි පණිවුඩ සේවයට වඩා හොඳ වේවි.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

We want aeroplanes and not pigeons.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

It is not that I prefer the pigeons. The pigeons will do better than the "Pelpola Service".

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Pigeons make good pie.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි පණිවුඩ සේවය පිළිබඳ තත්ත්වය ඒ විධියයි. ඊළඟට ටැලිපෝන් සේවය ගැන කල්පනා කර බලමු. ගාල්ලේ සිට කොළඹට රාජ ප්‍රමුඛ ඇමතිමක් ලබා ගැනීමට දැන් පැය 3 ක් ගත වෙනවා. තත්ත්වය එසේ නම් මේ ටැලිපෝන් සේවයේ වැදගම්මක් තිබෙනවාද ? නොබෝදා ගාල්ලේ සිට ටැලිපෝන් කම්බි 9 ක් සවි කළා යයි මේ දෙපාර්තමේන්තුව බොහොම ලොකුවට කෑකෝ ගැසුවා. නමුත් මාසයකට තිබෙන දවස් 30 න් 20 ක් සඳහාම ගාල්ලේ සිට කොළඹට රාජ ප්‍රමුඛ ඇමතිමක් ලබා ගැනීම සඳහා පැය 3 ක කාලයක් ගත වෙනවා. කොළඹ තිබෙන ආණ්ඩුවේ කන්තෝරුවක් සමඟ කථා කිරීමට උදේ 9 ට ඇමතිමක් ඉල්ලුවහොත් දහවල් 12 වන තුරු එය ලැබෙන්නේ නැහැ. දොළහ වන විට ඒ පණිවුඩය ගන්න කිසිම කෙනෙක් කන්තෝරුවෙ නැහැ. නැවතත් ඒ කන්තෝරුවටම ඇමතිමක් ඉල්ලන්න සිදු වෙනව එතකොට. සවස දෙකේ සිට හතර වන තුරු ඇමතිම ලැබෙන්නෙ නැහැ. මගේ අත්දැකීම් අනුව මට කියන්න පුළුවනි, අපට ආණ්ඩුවේ කන්තෝරුවකට ඇමතිමක් ලබා ගන්න බොහෝ විට හැන්දෑවේ පහ වන තුරු බැහැ. ඒ වෙලාවට ඇමතිමක් ලැබුණත් කා සමග ද ඒ කන්තෝරුවෙ කථා කරන්නෙ ? ඔය විධියට දැන් ටෙලිෆෝන් සේවයෙන් වැදගම්මක් නැති වෙලා තියෙනව. රාජ ප්‍රමුඛ ඇමතිම්වලට ඉඩ දෙන නිලධාරීන්ට වන දේ තමයි මා ඔය දැන් කිව්වෙ. සෙසු සාමාන්‍ය මහජනයාට ටෙලිෆෝන් පණිවුඩයක් දෙන්න ඕනෑ වුණොත් මොකක්ද වෙන්නෙ ? ටෙලිෆෝන් ඇමතිමක් ඉල්ලන සාමාන්‍ය කෙනෙකුට ලැබෙන පිළිතුර නම් ඒ සඳහා පැය නවයක් යන බවයි. ඒ අය කියනව: Nine hours' delay කියල. ගාල්ලෙන් කොළඹට ඇමතිමක් ගන්න පැය හතරක් පහක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත්නම් සමහර විට තාවයක් ගත වෙන බව කී ඇතැම් අවසථාවල මෝටෝ රියකින් කොළඹට ඇවිත් තියෙනව පණිවුඩය දෙන්න. එවැනි අවසථා පිළිබඳව මාත් වාත්‍යාකර තිබෙනව. තමුන්නාන්සෙගෙ ටෙලිෆෝන් සේවාව කොයි තරම් හොඳද කිව්වොත්, ඊට වඩා හොඳයි ගාල්ලෙ ඉඳල කොළඹට මෝටර් රථයකින් පැමිණ පණිවුඩය දීම. ඉතින් මේ ටෙලිෆෝන් සේවාවෙන් ලැබෙන වැදගැම්ම මොකක් ද? රාජ්කාරි කරුණු අතිනුත්, මහජනයගෙ ඕනෑ එපාකම් අනුවත් ටෙලිෆෝනයෙන් පණිවුඩයක් දීමට තරම් හදිසි කරුණු බොහෝ විට ඇති වෙනව. එවැනි අවසථාවලදී මේ ටෙලිෆෝන් සේවාවෙන් ප්‍රයෝජන ගන්නෙ කොහොමද කියා අහන්න කැමතියි.

ගාලු නගරය අවට තිබෙන තැපැල් කන්තෝරුවලට එවන ලද මනිඕඩරත් පෝස්ටල් ඕඩරත් දෙසියයකට වඩා තැපැල් කන්තෝරුවල රැඳී තිබෙනව. ඒවා අඩංගු ලියකියවිලි මුදල් ලැබිය යුතු උදවියට ගිහින් නැහැ. තැපැල් කරන ලද ලියමනක්, එය ලැබිය යුතු තැනැත්තාට යවන්නෙ නැත්නම් ඒ තැපැල් සේවයේ වැදගම්මක් තිබෙනවද? ලියුම් බෙදා දීමවත් හරියාකාර සකස් කරන්න බැරි නම් මේ සේවය අහෝසි කර දමා කොම්පැණියකට හෝ කොම්පැණි කිහිපයකට හෝ මේ කටයුත්ත භාර දෙන්නෙ නැත්තෙ ඇයි? කොම්පැණි දෙක තුනක් තරඟයට ලියුම් බෙදා දීම කරන්න පටන් ගත්තොත් වඩා ඉක්මනින් වැඩ කරන කොම්පැණියට වඩ වඩා වැඩ ලැබෙනවා ඇති. පළමුවෙනි කොම්පැණිය පැය තුනකින් ලියුමක් බෙදා දෙනව නම්, දෙවැනි කොම්පැනිය ඒ වැඩේ පැයකින් කරතොත්, දෙවැනි කොම්පැණියේ මාර්ගයෙන් ලියුම් යවන්න අපට පුළුවනි. මේ දැන් පවතින තැපැල් බෙදා දිමේ සේවය නම් තුච්ඡවක වැදගම්මක් නැහැ. මොන හේතු උඩද මෙවැනි තත්ත්වයක් පවතින්නෙ කියල මා අහනව. තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව ඇයි මෙපමණ අබලන් තත්ත්වයකට වැටී තිබෙන්නෙ? මේ විධියට දුප්පත් මනුෂ්‍යයෙකුට සල්ලි ටිකක් යවන්න බැහැ. අපේ ප්‍රදේශයේ සිටින තරුණයන් තමන්ගේ දෙමව්පියන්ට නොයෙකුත් අවසථාවලදී මනිඕඩර් මාර්ගයෙන් මුදල් යවන නමුත් ඒ මුදල් ලැබෙන්නෙ නැති බව මට දැනගන්න ලැබී තිබෙනව. අවුරුද්දක් ගියත් ලැබෙන්නෙ නැහැ. මොකක්ද මේ සිද්ධ වනනෙ? තමුන්නාන්සේගෙ විදුලි පණිවුඩ සේවයෙන් විදුලි පණිවුඩයක් යවන්න බැරි නම්, ටෙලිෆෝන් සේවාවෙන් දුර කථා කරන්න බැරි නම්, තැපැල් සේවාවෙන් මනිඕඩරයක් යවන්න බැරි නම්, තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන් මොන සේවාවක් ද කෙරෙන්නෙ? ඒ අංශ තුන පමණක් නොවෙයි, තැපැල් කන්තෝරුවෙ මුදල් ආරක්ෂා කරන බැංකුවෙ පවා නියම විධියට කටයුතු කෙරෙන්නෙ නැති බව කණගාටුවෙන් කියන්න සිදු වී තිබෙනව.

මුදල් ආපසු ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් යැවූ විට ඒ සඳහා බල පත්‍රයක් එවීමට මාස දෙක තුනක් ගත වෙනව. ඒ ගැන මතක් කර කොපමණ ටැලිග්‍රෑම් යැව්වත් බලපත්‍රය ලැබෙන්නෙ නැහැ. දුප්පත් මිනිසුන්ට මංගල්‍ය කටයුත්තක් යෙදුණ විට ඒ සඳහා මුදල් ගැනීමට බල පත්‍රයක් ඉල්ලා, මංගල්‍යයට මාසයකට පමණ කලින් ඉල්ලුම් පත්‍රයක් යවනවා. සුමානයක් දෙකක් බලාගෙන ඉන්නවා. බල පත්‍රය ලැබෙන්නෙ නැහැ. ලියුම් යවනවා; විදුලි පණිවුඩ යවනව; අන්තිම සතියත් පැමිණෙනව; ඒත් බලපත්‍රය නැහැ. ඊ ළඟට කරන්නෙ මොකක්ද? මන්ත්‍රීවරයා සොයා ගෙන යනවා. මංගල්ලෙට දවස් දෙක තුනක් තියෙද්දී දුප්පත් මිනිස්සු මා හමු වන්න ඇවිත් කියා තිබෙනවා, අපේ මංගල්ලෙ අනිද්දය, මාසයකට කලින් මුදල් ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් දැම්මාය, තවමත් බල පත්‍රය ආවෙ නැත කියා. මන්ත්‍රීවරයා මොනවා කරන්නද? ඉතින් අපි පුළුවන් තරම් උත්සාහ ගන්නව. ටැලිෆෝන් පණිවුඩයක් යවා, එහෙම නැත්නම් ලියුමක් දී කියනවා, කොළඹට ඇවිත් ලබා ගන්නය කියා. මුදල් ගැනීම සම්බන්ධව රෙගුලාසි අණ පණත් රාශියක් තිබෙනව. ඒ සියල්ලම නියම විධියට හරි ගස්සා ගෙන ගියත් මුදල් ගන්න අමාරුයි.

තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව දුප්පතාගේ බැංකුවයි. තමුන්නාන්සේට මා දැන් මේ විස්තර කරන අමාරුකම් බල පාන්නේ දුප්පතාටයි; පොහොසතාට නොවෙයි. එම නිසා තැපැල් කන්තෝරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ඉතිරි කිරීමේ බැංකුවේ වැඩ කටයුතු නියම විධියට හරි ගස්සාගෙන කටයුතු කිරීම තැපැල් ඇමතිතුමාගේ විශෙෂ වගකීමක්. එක්තරා මන්ත්‍රීවරයෙක් මේ ඇමතිකම ගන්නට බැරිය කීම ගැන මා කනගාටු වෙනව. මෙය භාර ගෙන තිබෙන තමුන්නාන්සෙ කරුණාකර මේ දෙපාර්තමේන්තුවෙ තිබෙන වැරදි හරි ගස්සා දුර්වලකම් මග හරවා කටයුතු කරන්න. මට පෙනෙන හැටියට දුර්වලකම් රාශියක් තිබෙනව. ඒ දුර්වලකම්වලින් ලොකුම දුර්වලකම තමයි, නියම විධියට සේවය කිරීම සඳහා සේවක යන් අඩු වීම. ඇයි තමුන්නාන්සෙ කැබිනට් මණ්ඩලයට බල කරන්නෙ නැත්තෙ, තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවට තවත් සේවකයන් විශාල සංඛ්‍යාවක් ගන්නය කියා ?

අද ලංකාවේ සෑම ප්‍රදේශයකම ලියුම් සහ විදුලි පණිවුඩ බෙදීම ඉතාමත් ප්‍රමාද වෙනවා. ඇයි, එසේ වන්නේ ? ලියුම් හා විදුලි පණිවුඩ බෙදන සුළු සේවකයින් මදි නිසයි. ගාලු දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කාරක සභා රැස්වීම්වලදී ගරු මන්ත්‍රීවරු පෙන්නා දී තිබෙනවා, ගාලු දිස්ත්‍රික්කයට පමණක් අඩු ගණනේ තව තැපැල් සුළු සේවකයින් සියයක්වත් අවශ්‍ය බව.

තැපැල් කන්තෝරු සේවිංස් බැංකු සේවය සඳහා ලිපිකරුවන් හිඟ බව මම දැන් තමුන්නාන්සේට කියා සිටියා. එහි එක ලිපිකරුවකුට ලිපිකරුවන් පස් දෙන කුගේ වැඩ පවරා තිබෙනවා. ඉතින් කොහොමද ඔවුන් මහජනයාගේ වැඩ ප්‍රමාද නොකර කරන්නේ ? මේ නිසා කර දර සිදු වන්නේ කාටද ? දුප්පත් මහජන යාටයි. ඇයි මේ ගරු ඇමතිතුමාට අඩු ගණනේ තව ලිපිකරුවන් දෙතුන් සීයක් වත් තැපැල් කන්තෝරු සේවිංස් බැංකු සේවයට යෙදවීම සඳහා කැබිනට් අනුමැති යක් ලබාගන්න බැරි ? තැපැල් දෙපාර්තමේන්තුවේ සෑම අංශයකම වාගේ— විශෙෂයෙන්ම ලියුම් හා විදුලි පණිවුඩ බෙදීමෙහි හා තැපැල් කන්තෝරු සේවිංස් බැංකු සේවයෙහි—සේවකයින් මදි නිසා බොහෝ වැඩ ප්‍රමාද වෙනවා. මේ දෙපාර්තමේන්තුවේ පළමුවන දුර්වලකම තමයි, සේවකයින් මදිකම.

අද රැකීරක්ෂා කාර්යාලවල රක්ෂා නැතිය වුන් ලක්ෂ ගණනක් ලියාපදිංචි වී සිටිනවා. එහෙම නම් ගරු ඇමතිතුමාට අමාරුද, ලියුම් හා විදුලි පණිවුඩ බෙදීම සඳහා ඉන් දෙතුන් සීයක් බඳවා ගන්න ? ඒ වාගේම තැපැල් කන්තෝරු සේවිංස් බැංකු සේවය සඳහා ලිපිකරුවන් හත් අට සීයක් බඳවා ගන්න අමාරුද ?

ඊළඟට තිබෙන දුර්වලකම වශයෙන් පෙන්වන්නට තිබෙන්නේ මේ දෙපාර්තමේන්තුව තවමත් පැරණි ක්‍රමයේම වැඩ කටයුතු කරගෙන යන බවයි. අදත් මේ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන්නේ අවුරුදු 25 කටත් වඩා පැරණි ටෙලිපෝන් සේවාවක්. ඒ සේවාව වර්තමාන ලෝක යට ගැළපෙන්නේ නැහැ. ඇයි, ටෙලිපෝන් සේවය සම්බන්ධයෙන් සංවර්ධන වැඩ පිළිවෙලක් ඇති නොකරන්නේ ? බොහොම කල් ගොස්, බොහොම අමාරු වෙන් කොළඹ නගරය අවට ප්‍රදේශවලට අළුත් ටෙලිපෝන් සේවයක් ඇති කර තිබෙනවා. තවමත් එය සම්පූර්ණ නැහැ. එම සේවාව ඇති කිරීමට අවුරුදු ගණනක් ගත වුණා. මට මතකයි, එංගලන්තය විසින් දෙන්න ලෑස්ති වූ ණය මුදල් ගත්තේ නැතිව අවුරුදු 5 ක් පමණ සාකච්ඡා කරමින් සිටි බව. කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා වන ගරු කළුගල්ල තැපැල් කටයුතු භාර ඇමති හැටියට සිටි කාලයේදී කොළඹ අවට ප්‍රදේශයට ටෙලිපෝන් සේවය ලබා දීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදු බව අපට මතකයි. එම අළුත් සේවාව සඳහා එංගලන්තයෙන් විශාල මුදලක් ණයට ලබා ගත්තා. අළුත් පිළිවෙළේ ටෙලිපෝන් සේවාවක් මුළු ලංකාවටම ලබා දෙන්න කටයුතු නොකරන්නෙ ඇයි කියා මා තමුන්නාන්සෙලාගෙන් ප්‍රශ්න කරනව. කොළඹ, නුගේගොඩ සහ කෝට්ටෙ වැනි ප්‍රදේශවලට විතරද, අළුත් පිළිවෙළේ ටෙලිපෝන් සේවාවක් වුවමනා කරන්නෙ ? විනාඩියකින් දෙකකින් ටෙලිපෝන් පණිවුඩයක් දීමට හැකි වන ආකාරයට අනිකුත් ප්‍රදේශවලටත් පහසුවක් සලස්වන්න බැරි ඇයි ? මෙවැනි වැඩ නොකරන නිසා මා තමුන්නාන්සෙලාට චෝදනා කරනව.

තමුන්නාන්සෙල කරන්න පළුවන් වැඩ කරන්නෙ නැහැ. වර්තමාන තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුව මේ මුළු ලංකාවටම පහසු අන්දමේ ටෙලිපෝන් සේවාවක් ලබා ගන්න පුළුවන්කම තියෙනවා. වෙනත් නානාවිධ රටවල් එවැනි අළුත් ක්‍රමානුකූල යන්ත්‍ර සේවා ආරම්භ කිරීම සඳහා අපට අවශ්‍ය ණය මුදල් දෙන්න ලැස්තිව සිටිනවා; නමුත් තමුන්නාන්සෙල මෙවැනි කරුණු එතරම් දුරට හිතට ගන්නෙ නැහැ. තමුන්නාන්සෙල බොහොම සන්තෝසෙන් සැතපී සිටිනවා. තමුන්නාන්සෙලාට මහජනයගෙ දුක දැනෙන්නෙ නැහැ. ඒකයි, තමුන්නාන්සෙලාට වෙලා තියෙන ලෙඩේ. තමුන්නාන්සෙලාට මේව තේරෙන්නෙත් නැහැ. මේව තේරුණු කාලයක් තිබුණ නම්, ඒ ආත මුත්ත කාලෙයි. දැන් ඒව අමතක වෙලා. දැන් තමුන්නාන්සෙලාට මහජන අමාරුකම් තේරෙන්නෙ නැහැ. තේරෙනව නම්, ඉක්මනින් මේ සියලුම වැඩ කටයුතු හැකි තරම් දුරට ප්‍රතිසංස්කරණය කරන්න උත්සාහ ගන්නවා. තමුන්නාන්සෙල සාදා තිබෙන සැලැස්ම මොකක්ද? ලංකාවේ අනිකුත් පළාත්වලටත් නියම විධියෙ ටෙලිපෝන් සේවාවක් දීම සඳහා සුදුසු සැලැස්මක් තියෙනවද? තියෙනව නම් මෙම සභාව ඉදිරියෙ කියන්න ඕනෑ. එවැනි සැලැස්මක් නැති නම් මේ කබල් ක්‍රමය අත හැර දමන්න ඕනෑ. මෙම දෙපාර්තමේන්තුවෙ දොර වසා අහෝසි කර දමන්න ඕනෑ. මේ විධියෙ වංචා සහගත ක්‍රියාවල යෙදෙන්න එපා. තමුන්නාන්සෙල මහජනයගෙ ඇස්වලට වැලි ගහනවා. මහජන අවශ්‍යතාවන් තමුන්නාන්සෙලාට තේරෙන්නෙ නැහැ. දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා දස අවුරුදු සැලැස්මක් පිළියෙල කළා, මෙම තැපැල් සහ විදුලි පණිවුඩ අංශයටත් අදාළව. කෝ, ඒ සැලැස්ම? තමුන්නාන්සෙ ගිය සෙනසුරාදා හොරගොල්ලට ගියා නම්, ඒ ගිය වෙලාවෙ ටිකක් කිට්ටු වෙලා බැලුව නම් එම දස අවුරුදු සැලැස්ම එතුමගෙ මිනී වළ ඇතුළෙ දමා තියෙනව දකින්න පුළුවනි.

**යූ. බී. වන්නිනායක මයා.** (යාපහුව)
*(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)*
(Mr. U. B. Wanninayake—Yapahuwa)

කවුද දැම්මෙ?

පරිපූරක මුදල්

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Daharayake)

ඒක දමල තියෙන්නෙ මේ ආණ්ඩුවයි. මේ ආණ්ඩුව ඒක අහෝසි කර දමා තියෙනවා. මේ මුළු රටටම නියම විධියෙ ටෙලිපෝන් සේවාවක් ඇති කිරීම පිණිස දස අවුරුදු සැලැස්මක් සකස් කර තිබුණා. ඇයි තමුන්නාන්සෙල එවැනි සැලැස්මක් පිළිගෙන වැඩ කරගෙන නොයන්නෙ? [බාධා කිරීමක්] මා වැඩි දුර කතා කරන්නෙ නැහැ. මේ ගරු ඇමතිතුමා තැපැල් සහ විදුලි පණිවුඩ අංශයෙ වැඩ කටයුතු භාර ගත්තෙ ඊයෙ පෙරේදයි. මා මෙසේ කෑ කෝ ගහන්නෙ එතුම සමග තියෙන පුද්ගලික විරුද්ධ කමකටය කියා සිතන්න එපා.

තැපැල් දෙපාර්තමේන්තුව, සාමාන්‍ය මහජනයගෙ එදිනෙදා වැඩ කටයුතුවලට තදින් බල පාන දෙපාර්තමේන්තුවක්. එම නිසා ඉතාමත් කල්පනාවෙන් ඉතාමත්ම ඕනෑකමින් ඉතාමත්ම උනන්දුවෙන් මේ දෙපාර්තමේන්තුවේ සියලුම වැඩ කටයුතු කරගෙන යන්ට ඕනෑ. අද උනන්දුවක් ඇත්තෙත් නැහැ; ඕනෑකමක් ඇත්තෙත් නැහැ; නිකම්ම ඔහෙ ගෙනයන්නත් වාගෙ ගෙන ගියාවෙ, තිබෙනව වාගෙ තිබුණාවෙ, කියන එකයි තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය. එම නිසා අපි ඉල්ලනව නියම සැලැස්මක්. ඒ සැලැස්ම අනුව මේ රටේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු සකස් කරන්ට ඕනෑ. මා ඉදිරිපත් කළ චෝදනාවලට තමුන්නාන්සේගෙන් පිළිතුරු ඉල්ලනවා. තමුන්නාන්සේ කවදද, විදුලි පණිවුඩ ඉක්මණින් යන්ට සලස්වන්නෙ? තමුන්නාන්සේ කවදද, විනාඩි සවල්පයකින් ටෙලිපෝන් ඇමතීමක් ලබා ගන්ට සලස්වන්නෙ? තමුන්නාන්සේ කවදද, තැපැල් කන්තෝරු සේවිංස් බැංකුවේ තැන්පත් කරන මුදල් ඉක්මනින් ලබා ගන්ට දුප්පත් වැසියන්ට ඉඩ සලසන්නෙ? ඒ ප්‍රශ්නවලට නිසි අන්දමට, සෑහෙන සතුටුදායක පිළිතුරු තමුන්නාන්සෙ නොදෙනවා නම්, මේ වැය ශීර්ෂවලට මගේ ඡන්දය නොදෙන බව මතක් කරන්ට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.14

**වන්නිනායක මයා.**
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන්ට යෙදුණා, දැනට සපයා තිබෙන තැපැල් සේවාවේ ඇති දුර්වලකම් හා අයහපත්කම් ගැන කරුණු රාශියක්.

**ගරු පැල්පොල**
(கௌரவ பெல்பொல)
(The Hon. Pelpola)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුන්ට මා ඉතා ආදරයෙන් මතක් කරනව, මේ වැය ශීර්ෂය යටතේ තැපැල් දෙපාර්තමේන්තුවේ කටයුතු සාකච්ඡා කරන්ට ඉඩක් නැති බව. එම නිසා කරුණාකර මේ වැය ශීර්ෂයට අදාළ කරුණු ගැන පමණක් සාකච්ඡා කරන ලෙස මා මතක් කරන්ට කැමතියි. තැපැල් අමාත්‍යාංශයේ කටයුතු ගැන තමුන්නාන්සේලාට සාකච්ඡා කරන්ට බැරි වූ බව මා දන්නව. තැපැල් කටයුතු සම්බන්ධයෙන් කෙරෙන විවේචනවලට පිළිතුරු දෙන්ටත් මා බොහොම සතුටුයි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ අංක 18 දරණ යෝජනාවෙන් ගරු ඇමතිතුමා රුපියල් 16,00,000 කට ආසන්න මුදලක් ඉල්ලා සිටිනව.

**වන්නිනායක මයා.**
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

නියෝජ්‍ය කථානායකතුමනි, අපට අය වැය ලේඛන විවාදයේදීත් අවස්ථාවක් ලැබුණේ නැහැ, තැපැල් අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරන්න. මෙවැනි අවස්ථාවකින්වත් ප්‍රයෝජන නොගෙන.——

**ගරු පැල්පොල**
(கௌரவ பெல்பொல)
(The Hon. Pelpola)

මගේ අකමැත්තක් නැහැ, මා කියන්නෙ මීට අදාළ නැති බවයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy Speaker)

ගරු මන්ත්‍රීවරුන් කෙටියෙන් කථා කරනව නම් හොඳයි.

**වන්නිනායක මයා.**
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා කථා කළේ, දැන් සපයා තිබෙන තැපැල් සේවාවල ඇති දුර්වලකම් ගැනයි. මා කියන්ට අදහස් කරන්නෙ අපේ පළාතේ බොහෝ ස්ථානවලට මෙවැනි පහසුකම් සපයා නොතිබීම ගැනයි. බොහෝ වාරවලදී මේ ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනව. දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය පරීක්ෂණ පවත්වා තිබෙනව; නිගමනවලට බැස තිබෙනව; ඇස්තමේන්තු හදා තිබෙනව. එහෙත් තවම ඒ කටයුතු ක්‍රියාවට පත් නොවී තිබීමයි, කනගාටුවට කරුණ. ඊට නිදර්ශනයක් පෙන්වා දෙන්ට කැමතියි. මගේ කොට්ඨාශයේ අවශ්‍යයෙන්ම විදුලි පණිවුඩ පහසුකම් සැපයිය යුතු තැපැල් කන්තෝරු 3ක් තිබෙනව. ඒවාට විදුලි පණිවුඩ පහසුකම් සැපයීම පිණිස ඇස්තමේන්තු සාදා තිබෙනව. ඇස්තමේන්තු සෑදීමෙන් වැටහෙන්නෙ, ඒ ස්ථානවලට ඒ සේවාවන් අවශ්‍ය බවයි. ඒ පිළිබඳව අවුරුදු කීපයක් කරුණු ඉදිරිපත් කරන ලද නමුත් තවම ඒ පළාත්වාසීන්ට සහනයක් ලැබී නැහැ. අළුත් ඇමතිතුමාටත් මේ ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනව. ඒ තැපැල් කන්තෝරු තුනේ නම් මෙසේයි: ඇහැටුවැව, මහනාන්නේරිය, නාගොල්ලාගම. මේ ස්ථාන තුනට විදුලි පණිවුඩ පහසුකම් සපයන ලෙස, ඒ පළාත්වාසීන්ගේ ඉල්ලීම උඩ, ඇමතිතුමාට මතක් කරන්ට සතුටුයි.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා මතක් කළ අන්දමට, මේ කරුණු ගැන නව ඇමතිතුමාට දොස් කියන්ට පුළුවන්කමක් නැහැ. අළුත් ඇමතිතුමාගේ කාලයේදී මේ අඩුපාඩු හුඟක් දුරට මගහැරෙයි කියා බලාපොරොත්තුවක් තිබෙනව. එසේ වේවා කියා මා ප්‍රාර්ථනා කරනව. මේ වැය ශීර්ෂය යටතේ තැපැල් කටයුතු ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීම සුදුසු නැතැයි ඇමතිතුමා මතක් කළ නිසා මා දීර්ඝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන් කථා කරන්ට යන්නෙ නැහැ. ඇහැටුවැව, මහනාන්නේරිය, නාගොල්ලා ගම යන ස්ථානවලට විදුලි පණිවුඩ පහසුකම් සැපයීමට ගරු ඇමතිතුමා කටයුතු කරනව ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 3.18

**ඒ. අමිර්තලින්ගම් මයා.** (වඩ්ඩුක්කොඩෙයි)
(திரு. ஏ. அமிர்தலிங்கம்—வட்டுக்கோட்டை)
(Mr. A. Amirthalingam—Vaddukkoddai)

கௌரவ உப சபாநாயகர் அவர்களே, தபால், தந்திச் சேவையிலுள்ள சில முக்கியமான குறைபாடுகளைக் கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்கு இச்சந்தர்ப்பத்தில் நான் கொண்டுவர விரும்புகின்றேன்.

சென்ற சில ஆண்டுகளாக "சி" வகுப்பிலுள்ள உப தபாற் கந்தோர்களை "பி" வகுப்புக்கு உயர்த்துவது மிகவும் குறைவாகவே நடைபெற்று வந்திருக்கின்றது. போதிய அளவு வேலைகள் உள்ள, போதிய அளவு புள்ளிகள் பெற்ற "சி" வகுப்பு உப தபாற் கந்தோர்கள் கூட எத்தனையோ ஆண்டுகளாக, "பி" வகுப்புக்கு உயர்த்தப்படாமல் இருக்கின்றன. உதாரணமாக, என்னுடைய தொகுதியிலுள்ள நாகேந்திரமடம் உப தபாற் கந்தோரைப் பற்றி நான் இங்கு குறிப்பிட விரும்புகிறேன்.

**ගරු පැල්පොල**
(கௌரவ பெல்பொல)
(The Hon. Pelpola)

You are now dealing with post offices—[*Interruption*].

**අමිර්තලින්ගම් මයා.**
(திரு. அமிர்தலிங்கம்)
(Mr. Amirthalingam)

I shall deal very shortly with these matters. We did not have an opportunity of discussing these matters earlier.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டப்ளியு. தகனயக்க)
(Dr. W. Dahanayake)

May I suggest, Sir, that we take item Nos. 3 and 18 together because they deal with the same Ministry ?

**ගරු පැල්පොල**
(கௌரவ பெல்பொல)
(The Hon. Pelpola)

I do not mind. I have no objection.

**අමිර්තලින්ගම් මයා.**
(திரு. அமிர்தலிங்கம்)
(Mr. Amirthalingam)

கௌரவ உப சபாநாயகர் அவர்களே, என்னுடைய தொகுதியிலுள்ள இந்த "சி" வகுப்பு உப தபாற் கந்தோர் இரண்டு ஆண்டுகளுக்கு முன் "பி" வகுப்புக்கு உயர்த்தப்பட வேண்டிய தகுதியைப் பெற்றிருக்கின்றது. ஆனால், இன்னும் இந்த உப தபாற் கந்தோரின் தரம் உயர்த்தப்படவில்லை. இதே போல கிராமப் புறங்களிலே எத்தனையோ தபாற் கந்தோர்கள் "சி" வகுப்பிலிருந்து "பி" வகுப்புக்கு உயர்த்தப்படாமல் எத்தனையோ ஆண்டுகளாகக் கிடந்து வருகின்றன. இதனால் கிராம வாசிகள், குறிப்பாக விதவைப் பென்சன் பெறுகின்ற பெண்கள் தம்முடைய பென்சன் பணத்தைப் பெறுவதற்குத் தூரப் பகுதிகளிலுள்ள "பி" வகுப்புத் தபாற் கந்தோர்களுக்குச் செல்ல வேண்டியிருக்கின்றது. ஆகையால் "பி" வகுப்புக்குத் தரம் உயர்த்தப்படுதற்குத் தகுதிபெற்று அவ்வாறு செய்யப்படாமல் இருக்கும் "சி" வகுப்பு உப தபாற் கந்தோர்களையெல்லாம் கௌரவ அமைச்சர் உடனடியாகத் தரம் உயர்த்த வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

இரண்டாவதாக நான் குறிப்பிட விரும்புவது தந்திச் சேவையைப் பற்றியாகும். கௌரவ காலிப் பிரதிநிதி (கலாநிதி டபிள்யூ. தகநாயக்க) அவர்களும் இது பற்றிக் குறிப்பிட்டார்கள். இன்று நூற்றுக்கணக்கான தந்திகள் தபால்மூலம் விநியோகஞ் செய்யப்படுகின்றன. விரைவாக அனுப்புவதாகக் கூறி மக்களிடமிருந்து பணத்தைப் பெற்றுக் கொண்டு, தந்திகளைச் சாதாரண தபால்களையும் விடக் கூடிய காலதாமதத்துடன் விநியோகிப்பது மக்களுடைய பணத்தை கொள்ளை அடிப்பதுபோல்தான் இருக்கும். தந்திகளை விரைவாக அனுப்ப முடியவில்லையென்றால் அத்தந்திகளை அனுப்பியவர்களுடைய பணத்தைத் திருப்பிக் கொடுக்கவேண்டும். அதுதான் நீதி; அதுதான் நேர்மை. அதைவிட்டு, தந்திகளைத் தபால் மூலம் அனுப்பிவிட்டு, தந்தி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමිර්තලිංගම් මයා.]

அடித்து மூன்றும் நாள் கிடைக்கக் கூடியதாக அதனை அனுப்பிவிட்டு விரைவாக அதனை அனுப்புவதற்கு அறவிட்ட பணத்தையும் அரசாங்கம் வைத்துக் கொள்வது ஏழை மக்களின் பணத்தை மோசடி செய்யும்வேலை என்பதைக் கௌரவ அமைச்சருடைய கவனத்துக்கு நான் கொண்டுவர விரும்புகின்றேன். ஆகையால், இவ்வாறு காலதாமதமாகிக் கொடுக்கும் தந்திகளுடைய பணத்தை அரசாங்கம் மக்களுக்குத் திருப்பிக் கொடுக்க வேண்டும்.

இன்னுமொரு விடயத்தை இவ்விடத்தில் நான் குறிப்பிட விரும்புகிறேன். தமிழிலே தந்திகளை எல்லாத் தபாற் கந்தோர்களிலும் அனுப்ப முடியாத நிலை இன்னுமிருந்து கொண்டு வருகின்றது. தமிழ் மாத்திரம் தெரிந்த ஒருவர் எந்தவொரு தபாற் கந்தோருக்கும் சென்று தமிழிலே தாம் அனுப்ப விரும்பும் தந்தியை அத்தபாற் கந்தோர் மூலம் அனுப்பக் கூடிய வசதி செய்து கொடுக்கப்பட வேண்டும். பொது மக்களுக்கு இச் சேவை இருக்கின்றதே தவிர, இச்சேவைகளுக்காகப் பொது மக்கள் இருக்கவில்லை. கௌரவ அமைச்சர் பதவியேற்று சொற்ப காலந்தான். ஆனால் கூடிய விரைவில் எல்லாத் தபாற் கந்தோர்களிலும் தமிழில் தந்தி அனுப்பக் கூடிய வசதியை செய்து கொடுக்க அவர் நடவடிக்கையெடுக்க வேண்டும். இந்த நாட்டில் எல்லா மக்களும் இச்சேவைகளைச் சமமாகப் பெற்று வாழ்வதற்கு அரசாங்கம் நடவடிக்கையெடுக்க வேண்டியது ஒரு பெருங் கடமை யென்பதை நான் இங்கு எடுத்துக் கூற விரும்புகிறேன். இன்னும் ஒரேயொரு விஷயத்தை மாத்திரம் கூறி எனது குறிப்புரையை முடித்துக் கொள்கின்றேன்.

தபால் கந்தோர் சேமிப்பு வங்கியில் பல இலட்சக்கணக்கான ரூபாய்களைத் தமிழ் பேசும் மக்கள் போட்டு வருகின்றார்கள். ஆனால், யாராவது தமிழ்பேசும் மனிதர் தபால் கந்தோர் சேமிப்பு வங்கியிலிருந்து பணத்தைத் திருப்பிப் பெற மனுப் பண்ணினால் அவருக்குச் செல்லும் கடிதம் தனிச் சிங்களத்திலேயே செல்கின்றது. யாழ்ப்பாணத்திலே எனது தொகுதியிலே தபால் கந்தோர்களில் பணம் போட்ட எத்தனையோ ஏழை மக்கள், அப்பணத்தைத் திருப்பியெடுக்க முனையும்போது எவ்வளவோ கஷ்டங்களுக்கு உள்ளாகின்றார்கள் என்பதை நானறிவேன். தலைமைக் கந்தோரிலிருந்து வரும் கடிதங்கள் சிங்களத்தில் இருக்கின்றபடியினால், எந்தக் கந்தோரில் பணத்தைப் பெறலாம், எவ்வளவு பணத்தைப் பெறலாம் என்பதை அறிய முடியாதவர்களாய் அவர்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். தபாற் கந்தோர் சேமிப்பு வங்கியில் பணம் போடுகின்றவர்கள் எந்த மொழியில் கடிதங்கள் எழுதுகின்றார்களோ, எந்த மொழியில் தங்களுக்குப் பதில் அனுப்பும்படி கேட்கின்றார்களோ அந்த மொழியில் எழுத வேண்டியது அரசாங்கத்தினது கடமை; தபாற் கந்தோர் சேமிப்பு வங்கியினது கடமை. இதனைத் தபாற்சேவை அமைச்சர் அவர்கள் கவனித்து இக்குறைபாட்டை நிவர்த்தி செய்து, தமிழ்பேசும் மக்கள் தபாற்கந்தோர் சேமிப்பு வங்கியிலிருந்து இலகுவாகப் பணத்தைப் பெற்றுக் கொள்ளக்கூடிய வசதிகளைச் செய்து கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். இது சலுகையல்ல, இது அம் மக்களின் உரிமை என்பதை அமைச்சர் அவர்களும் தபாற் கந்தோர் சேமிப்பு வங்கியும் கவனத்திற் கொள்ள வேண்டும்.

மக்கள் வங்கியை எடுத்துக் கொள்வோம். அவர்கள் தமிழிலே கடிதங்கள் எழுதுகின்றார்கள். ஆனால், தபால் கந்தோர் சேமிப்பு வங்கி மாத்திரம் சிங்களமே தெரியாத தமிழ்பேசும் மக்களுக்குத் தனிச் சிங்களத்திலேயே கடிதங்களையும் மற்றும் காசுக்கட்டளைகளையும் அனுப்பிவைக்கின்றது. எனவே, இதனை உடனடியாக நிவர்த்தி செய்யவேண்டுமென்று நான் அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

අ. භා. 3.25

**යූ. පී. වයි. ජිනදාස මයා.** (කුණ්ඩසාලෙ)
*(திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலை)*
(Mr. U. P. Y. Jinadasa—Kurdasale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ ජපන් රටින් ගෙන්වූ ස්වයංක්‍රිය යන්ත්‍රයක් මගින් සිංහලෙන් විදුලි පුවත් යැවීමේ ක්‍රමයක් ආරම්භ කර තිබුණා. ඒ කලුගල්ල ඇමතිතුමාගේ කාලයෙයි. මාස කීපයක් ක්‍රියාත්මක කළ ඒ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සිංහල විරෝධී, ඉංග්‍රීසියට පක්ෂ නිලධාරීන් විසින් දැන් [illegible] දමා, තිබෙනව. ගරු ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ගැන දන්නවාද කියා මා දන්නෙ නැහැ. ඒ නිසා වහාම මේ ගැන පරීක්ෂා කර බලා ජපන් රටින් ගෙන්වූ ඒ යන්ත්‍රය මගින් ස්වයංක්‍රිය ක්‍රමයෙන් සිංහලෙන් විදුලි පුවත් යැවීම නැවතත් ක්‍රියාත්මක කරන මෙන් මා ඉල්ලා සිටිනවා. කලුගල්ල ඇමතිතුමාත්, පාර්ලිමේන්තු ලේකම් ටී. බී. තෙන්නකෝන්, දැනට වැඩබලන ඇමතිතුමාත් උත්සව සහිතව සිංහලෙන් විදුලි පණිවුඩ යැවීමේ ඒ ස්වයං ක්‍රිය ක්‍රමය මහනුවර සිට විවෘත කළ අවස්ථාව මට මතකයි. මාස කීපයක් ක්‍රියාත්මක කළ ඒ යන්ත්‍රය ක්‍රියාත්මක වනු දකිමට අකැමැති නිලධාරීන් නිසා, සිංහලට විරුද්ධ නිලධාරීන් නිසා, ඒ යන්ත්‍රය දැන් තල්ලුවී තිබෙනව. ගරු ඇමතිතුමාගේ අවධානය මේ ගැන මා යොමු කර වනව. නැවතත් සිංහලෙන් විදුලි පුවත් යැවීමේ ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කට යුතු සලස්වන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ සමගම සේවිංස් බැංකුව ගැනත් කාරණයක් මතක් කරන්ට තිබෙනව. මේ සේවිංස් බැංකුවේ, ජීවතුන් අතර නැති අයගේත්, මේ රටින් පිටවී ගිය අයගේත්, බැංකු පොත් නැතිවූවන්ගේත් පොත් වලින් වංචා සහගතව මුදල් ලබා ගන්නා නිලධාරීන් පිරිසක් සිටිනවාය කියා මට ආරංචියි. මා නම් කියන්නට කැමති නැහැ. මා දන්නවා දෙපාර්තමේන්තුවේ එක්තරා නිලධාරියෙක් ගැන. ඔහු අද උසස් පෙළේ ධනවතෙක් වී සිටිනව. හොර අත්සන් ගසා, වෙනත් මිනිසුන්, යොදවා මැරුණු අයගේත් රටින් පිටවූ අයගේත් පොත් නැතිවූවන්ගේත් පොත්වල මුදල් විශාල වශයෙන් වංචා සහගත අන්දමින් ලබා ගන්නව. එක්තරා පුද්ගලයෙක්—දෙපාතීමේන්තුවේ ලිපිකාර මහත්මයෙක්—රුපියල් 50,000 ක් පමණ වටිනා ගොඩනැගිල්ලක් සාදා ධනවතෙක් වී සිටින බව මා දන්නව. ඔහු දැනුත් දෙපාර්තමේන්තුවෙ සේවය කරනවද කියා මා දන්නෙ නැහැ. මේ සම්බන්ධව, බැංකු පොත් වලින් මේ විධියට මුදල් වංචා කිරීම පිළිබඳවා පරීක්ෂා කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මං නියෝජනය කරන කුණ්ඩසාලෙ ආසනය තුළ විශේෂ තැපැල් කාර්යාලයක් ඇත්තෙම නැහැ. තියෙන්නෙ ඒ, බී, සී. පන්ති වල තැපැල් කාර්යාල පමණයි. මේ ප්‍රදේශයේ විශෙෂ තැපැල් කාර්යාලයක් නැත් නම් උසස් තත්ත්වයේ තැපැල් කාර්යාලයක් ඇති කරන්නය කියා මා පසුගිය අවුරුදු 4 මුළුල්ලේම ඉල්ලා තිබෙනවා. විශේෂයෙන්ම හුරීකඩුව තැපැල් කාර්යාලය තිබෙන්නෙ මැණික්හින්න නගරය ආශ්‍රිතවයි. ඒ නිසා තමුන්නාන්සේවත් ඒ කාර්යාලය ඉක්මනින්ම විශේෂ තැපැල් කාර්යාලයක් කරාවිය කියා මා බලා පොරොත්තු වෙනව. ඒ ප්‍රදේශවාසීන්ට තැපැල් මාර්ගයෙන් ලොකු මුදලක් ගන්න වුණාම කටුගස්තොට, මහනුවර, වත්තෙගම, නැත්නම් තෙල්දෙණිය තැපැල් කන්තෝරුවලට යන්න සිද්ධ වෙනව. සාමාන්‍ය මිනිසෙකුට රුපියල් දාහක් හමාරක් ඒ විධියට එහා මෙහා ගෙන යාමත් අමාරුයි; ආරක්ෂා කිරීමත් අමාරුයි. මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ සමගම, ලුනුකැටියාමඩිත්ත තැපැල් කාර්යාලයට ටැලිපෝන් හා විදුලි පුවත් සේවා පහසුකම් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඇත්ත වශයෙන්ම තැපැල් දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අද ලොකු ව්‍යාකූල තත්ත්වයක් තිබෙනව. විශේෂයෙන්ම අපේ ප්‍රදෙශ වැනි නොදියුණු ප්‍රදේශවල ලියුම් බෙදීම ආදී වැඩ කටයුතු වලදී මුදල් වංචා කිරීම් බොහොම තදින් කෙරෙනව. සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් හුරීකඩුව තැපැල් කාර්යාලයට රුපියල් 800 ක චැක්පතක් යවා තිබෙනව. දුප්පත් අහිංසක ගැහැණු කෙනෙකුටයි මේ චැක්පත යවා තිබුණේ. ලියාපදිංචි කළ ලිපියක වූ මේ චැක්පත වංචා කර දැන් අවුරුදු දෙකක් ගත වී තිබෙනව. තැපැල් කන්තෝරුව මොනවා කරනවාද කියා මා දන්නෙ නැහැ. මමත් ලියුම් කීපයක් යැව්ව. දැන් ඒ කාරණය පොලිසියට භාර දී තිබෙනව. දැන් පොලිසිය ක්‍රියා කරන්නෙත් නැහැ; තැපැල් කන්තෝරුව ක්‍රියා කරන්නෙත් නැහැ. තමාගේ ස්වාමි පුරුෂයා ගසකින් වැටී මරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජිනදාස මයා.]
යට පත් වූ නිසා මේ දුප්පත් ස්ත්‍රියට ලැබුණු අලාභ මුදලක් මේක. නැැල් කන්තෝරුව මේ සම්බන්ධයෙන් හරියා කාර අන්දමින් ක්‍රියා කරන්නෙ නැහැ. මේ කාරණය ගැනත් ඇමතිතුමාගේ අවධානය යොමු කරවමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ,

අ. භා. 3.29

**ඒ. එච්. මාකන් මාකර් මයා.** (මඩකලපුව දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக் களப்பு இரண்டாம் அங்கத்தவர்)*

(Mr. A. H. Macan Markar—Second Batticaloa)

I find that in the Order Paper items Nos. 3 to 22 deal with Supplementary Estimates which were only presented today and I do not know whether hon. Members would have had sufficient opportunity and time to go through them. However, in view of the fact that the financial year is soon coming to an end, I personally have no objection to these items being taken up for discussion in order that the Supplementary Estimates may be passed in time.

Having regard to the unsatisfactory state of affairs in the Posts and Telecommunications Department during the past several years, I do not know what prompted the Hon. Minister to accept this particular portfolio. I am afraid he is faced with a very uphill task in putting things right in the short time that is left at the disposal of this Government. However, I wish him the best.

The first matter I wish to touch upon is this. Rumours are rife that a fantastic rent is being paid for the offices in Ceylinco House of the Minister of Posts and Telecommunications. It is alleged that something between Rs. 50 to Rs. 60 thousand is being paid by way of rent a year. I do not know whether this is correct, but I would like the Hon. Minister to tell us what rent is being paid so that we may be able to gauge whether it is fair or otherwise.

Then I would refer to the faulty way in which telephones function. Invariably one gets the wrong number even when the dialling is done correctly. This has been the experience of a number of subscribers in the Colombo Town area. I feel, therefore, that the Minister should consider compensating subscribers by reducing the charge on each call that is made. That, I think, is a fair request in view of the fact, as I have just pointed out, that telephones do not function properly; generally a subscriber gets the wrong number.

There have been occasions when, after getting the wrong number several times, one has tried to get in touch with the exchange supervisor in order to make a complaint, but it would appear that she is on " sleeping duty ". I recall a particular Sunday when, after I had got the wrong number several times, I tried to get in touch with the supervisor without success. I held the line for ten to fifteen minutes and, as there was no reply, I got in touch with the lady dealing with trunk calls and communicated to her my complaint only to be told that it was not her business to attend to such complaints.

It would appear that on Sundays particularly these exchange girls and supervisors do not attend to their duties and go " off ". If these ladies are going to attend to their duties in this way on a Sunday, I would ask the Minister to consider an alternative worthwhile Sunday service.

I also find that in regard to my constituency, that is, Batticaloa, letters take two or three days to get there. I would ask the Hon. Minister to take steps to see that letters are delivered the day after they are posted. Recently, after having posted several letters to Batticaloa from Colombo, I went by train to Batticaloa, only to find that the letters which I had posted days before my journey had not reached Batticaloa. It is time that the postal authorities took steps to see that letters are delivered expeditiously.

The other point is with regard to the tampering of mails. Letters containing cheques and other enclosures

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

are often tampered with. I find that the only way to avoid pilfering is not to pin cheques etc. on to letters so that the postal peons or sorters will not be able to suspect that there are cheques, etc., inside envelopes.

I believe that the whole fault lies in the manner of recruitment of postal sorters and peons. When the department requires some personnel of this category they rush to the Employment Exchange to get the necessary employees to fill these positions and the result is that undesirable elements creep into the department. I would suggest that there should be a proper screening before recruitment is made and you can get this done by asking the police to submit a report to you. I think as a result of indiscriminate recruitment undesirable persons have got into the postal service and are responsible, by and large, for most of the destruction of letters, tampering with letters that have taken place, and the losses that have been caused to the department.

I do not wish to speak at great length although there is much to be said with regard to the Postal and Telecommunication Department. I hope and trust that the Hon. Minister will remedy these shortcomings and defects and give us a very efficient postal and telecommunication service in the near future.

අ. භා. 3.36

ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.
(திரு. ஸ்டான்லி மொல்லிகொட)
(Mr. Stanley Molligoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත් කරුණු දෙක තුනක් පිළිබඳව, තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ අවධානය යොමු කරවීමට මම බලාපොරොත්තු වෙනවා. මම දීර්ඝ කථාවක් කිරීමට බලාපොරොත්තු වන්නෙ නැහැ. මා නියෝජනය කරන නිවිතිගල මැතිවරණ කොට්ඨාශය සම්බන්ධ කරුණු දෙක තුනක් පමණයි, මා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නෙ. මේ ගරු ඇමතිතුමා මේ අමාත්‍යාංශය භාර ගත් දින පටන්ම මගේ කොට්ඨාශයේ තිබෙන අඩුපාඩුකම් කීපයක් පිළිබඳව ඒ ඇමති අංශයට මා ලිපි රැශියක් යවා තිබෙනව. එහෙත් ඒ ලිපිවලට තවම සතුටුදායක පිළිතුරක් නොලැබීම ගැන මම කනගාටු වෙනව. ඒ අමාත්‍යාංශයේ සමහර නිලධාරීන් අවුරුදු තුන හතරක් තිස්සේ කීප වතාවක්ම එකම විධියේ වචනවලින් එකම පිළිතුරක් එවා තිබෙන බව කනගාටුවෙන් සඳහන් කරන්න සිදු වී තිබෙනව. ඒ පිළිතුර නම් ඔබ දන්වා එවූ කාරණය පොරොත්තු ලේඛනයෙහි සටහන් කර තිබෙනවය යන්නයි. 1961 මාර්තු මාසයේදී මට ලිපියක් එව්වා, කොලොම්බුගම උප තැපැල් කාර්යාලයට ටෙලිෆෝන් පහසුකම් දීම සම්බන්ධව, ඒ කාරණය පොරොත්තු ලේඛනයෙහි සටහන් කර තිබෙනවය කියා. 1964 දීත් ඒ පිළිතුරමයි, මට එවා තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව මම ගරු ඇමතිතුමාගේ අවධානය කීප විටක්ම යොමු කෙරෙව්වා. මේ කාරණය මේ ගරු සභාවේදී මතු කළ අවස්ථාවේදීත් එය පොරොත්තු ලේඛනයෙහි සඳහන් කර තිබෙනවය කියා මට පිළිතුරු දුන්න. එහෙත් කිසිම ප්‍රතිඵලයක් ලැබුනෙ නැහැ. මේ හේතු නිසා මේ අමාත්‍යාංශයේ සමහර දෙපාර්තමේන්තුවල නිලධාරි මහත්වරුන්ගේ ක්‍රියා කලාපය මම හෙළා දකිනව. ඇත්තෙන්ම මේ නිලධාරීන් අපේ පළාත්වලට ලොකු අගෞරවයක් කරන්නේ, අප ඒ පළාත්වලට අවශ්‍යම දෙයක් ඉල්ලුවමත් සැලකිල්ලෙන් ක්‍රියා නොකිරීමෙන්. හැම අවස්ථාවකදීම ඒ කරුණු පොරොත්තු ලේඛනයේ සඳහන් කර තිබෙනවය කියා සඳහන් කර එවීම ගැන මම කනගාටු වෙනව. තැපැල් කාර්යාංශයෙන් විදුලි සංදේශ කාර්යාංශයෙන් නිලධාරීන්—විශේෂයෙන්ම කොළඹ සිටින නිලධාරීන්—මේ ඉල්ලීම ගැන ඉතාමත් නොසැලකිලිමත්කමින් කටයුතු කරන බව ඉතා කනගාටුවෙන් සඳහන් කරනව.

මා නියෝජනය කරන්නෙ ඉතාමත්ම දුෂ්කර මැතිවරණ කොට්ඨාශයක් ; ගමනාගමන පහසුකම් සහ තැපැල් සේවා පහසුකම් ඉතාමත් අඩු ප්‍රදේශයක්. ලිපියක මාර්ගයෙන් හෝ මේ ගරු සභාවේදී හෝ ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී හෝ මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා නම් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.]

සියල්ලක්ම කර තිබෙන්නෙ ඒ මැතිවරණ කොට්ඨාශය වෙනුවෙනුයි. 1960 අවසාන භාගයේදී නැත්නම් 1961 මුල් භාගයේදී මම කොලොම්බුගම උප තැපැල් කායඝාලයට ටෙලිෆෝන් පහසුකම් ඉල්ලුව. ඒ ගැන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දන්වා එව්වේ ඒ කාරණය පොරොත්තු ලේඛනයේ සඳහන් කර තිබෙනවාය, යන්නයි. 1962 වර්ෂයේදීත්, 1963 වර්ෂයේදීත් ලැබුණේ ඒ පිළිතුරමයි. 1964-65 වර්ෂයේදී ලැබෙන්නෙත්, ඊට පසුව ලැබෙන්නෙත් ඒ පිළිතුරමයි. ඒ තැපැල් කායඝාලය පිහිටා තිබෙන්නේ විශාල ජනගහනයක් ඇති ප්‍රදේශයකයි. වතු යායවල් රාශියක් ඒ ප්‍රදේශයේ තියෙනව. නිවිතිගල තැපැල් කායඝාලය තියෙන්නෙ ඊට වඩා සැතපුම් 6ක් ඈතින්. ඒ ප්‍රදේශයට විදුලි පණිවුඩ යවන්නෙ නිවිතිගල තැපැල් කායඝාලයෙනුයි. ඒ නිසා 1964-65 මුදල් වර්ෂයේදිවත් ඒ උප තැපැල් කායඝාලයට ටෙලිෆෝන් සේවය ලබා දෙන මෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනව. මගේ කොට්ඨාශයේ ටෙලිෆෝන් සේවය අවශ්‍ය තවත් උප තැපැල් කායඝාල රාශියක් තියෙනව. ඒවා "බී" ශ්‍රේණියේ උප තැපැල් කායඝාල. කරන්ගොඩ, ඇලපාත ආදි තැපැල් කායඝාලවලට ටෙලිෆෝන් සේවයක් නැහැ. ඒ පළාතේ අයට විදුලි පණිවුඩයක් ලැබුනොත් ඒ ලැබෙන්නේ තැපැල් මාර්ගයෙන්. සමහර විට දවස් දෙක තුනක් යනව. ඒ කියන්නෙ ඒ පළාතේ නියම අන්දමේ තැපැල් බෙදීමක්වත් නැහැ.

ඊළඟට මා තවත් කරුණක් මතක් කරන්න කැමතියි. උඩ කරවිට උප තැපැල් කාර්යාලය තැපැල් කාර්යාල තත්ත්වයට ගෙනෙන්නය කියා මා ගරු ඇමතිතුමාට ලිපියක් යවා තිබෙනව. උඩ කරවිට උප තැපැල් කාර්යාලය ඉතාම වැඩ අධික තැපැල් කාර්යාලයක්. එය දැනට "ඒ" ශ්‍රේණියේ පවතින එකක්. ඒ ප්‍රදේශයේ ඉතා විශාල ජනගහනයක් සිටිනව. ඒ අවට මධ්‍ය මහා විද්‍යාලයක් හා මාතෘ නිවාසයක් තිබෙනව. එමෙන්ම ග්‍රාමීය ආරෝග්‍යශාලාවකුත් තිබෙනව. ඒ ප්‍රදේශයේ කොම්පැනි සහ වතුත් රාශියක් තිබෙනව. ඒ සියල්ලටමත් වඩා ඒ ප්‍රදේශය දුගී අසරණ ගම්බද ජනතාවක් වාසය කරන ප්‍රදේශයක්. ඒ නිසා ඒ ප්‍රදේශයට නියම සේවයක් වනු පිණිස අඩු වශයෙන් ලබන මුදල් වර්ෂයේදිවත් උඩ කරවිට උප තැපැල් කාර්යාලය තැපැල් කාර්යාල තත්ත්වයට පරිවර්තනය කරන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව. එමෙන්ම කෙහෙල් ඕවිටිගම, දිමියාව හා යක්දෙහිවත්ත කියන ප්‍රදේශවල උප තැපැල් කාර්යාල පිහිටුවන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා තිබෙනව. එයට පිළිතුරක් වශයෙන් මට ලැබුණා 1964-65 වර්ෂයට මුදල් වෙන්වී නැත කියා. 1963-64 මුදල් වර්ෂය ආරම්භයේදීත් මට ඒ පිළිවෙළටම පිළිතුරක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබුණා. ඒ ලැබෙන පිළිතුරු ඉතාම කනගාටුදායකයි. තැපැල් දෙපාර්තමේන්තුවෙන් අපි යම්කිසි සේවයක් බලාපොරොත්තු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනික් කාරණය ලියුම් බෙදන්නන් ගැනයි. මෙහි "ස්පීඩ් ටෙස්ට්" කරනව. අප නියෝජනය කරන කඳුකර ප්‍රදේශවල නාගරික ප්‍රදේශවල වගේ "ස්පීඩ් ටෙස්ට්" කරන්න බැහැ. හැම තැනකම බයිසිකල් එකෙන් යන්න බැහැ. පයිනුයි ගමන් කරන්න ඕනෑ. කඳු හෙල් තිබෙනව; ගංගාවල් තිබෙනව. ඒවායින් එතෙර වී යන්න ඕනෑ. ඒ නිසා ඒ ප්‍රදේශවලට ලියුම් බෙදන්නන් වැඩියෙන් අවශ්‍යයි. නාගරික ප්‍රදේශවල ලියුම් බෙදන්නන් දෙන්නේ ගෙවල් ගණනට. ඒ ප්‍රදේශවල ගෙවල් ගණනට හෝ හැතැප්ම ගණනට දුන්නොත් ඒ පළාත්වල මහජනයාට ලියුම් බෙදීමක් ඇති වන්නෙ නැහැ. දැනට ඇල උප තැපැල් කාර්යාලයේ සේවය කරන, එරබද්ද දොඩගම්මන ආදී ගම්වලට ලියුම් බෙදන අයට දොස් කියන්න අපට බැහැ. ඒ අයට විතරක් ඇවිදින්නට බැහැ. ඔවුන් එක තැනක ලියුම් තබනව.

**ගරු පැල්පොල**
*(கௌரவ பெல்பால)*
(The Hon. Pelpola)

ගරු මන්ත්‍රීතුමා කියන මේ කරුණු සියල්ලටම උත්තර දෙන්න මට ලැබෙන්නෙ නැහැ. මේ කරුණු ගැන සෝදිසි කර බලන්න ඕනෑ. ඒ නිසා කරුණාකර ලිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විල්ලයින් දැනුම් දෙනවා නම් හොඳයි. එබැවින් මෙයට අදාළව කථා කරනවා නම් හොඳයි. එසේ නොකළොත් අද මෙය සම්මත කරගන්න ලැබෙන්නෙ නැහැ.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේත් අපට කථා කරන්න අයිතියක් නැත්නම් අපි කථා කරන්නෙ කොහේද?

**ගරු පැල්පොල**
*(கௌரவ பெல்பொல)*
(The Hon. Pelpola)

මන්ත්‍රීතුමා එහෙම හිතුන්න එපා. කථා කරන්න බැහැ කියා මා කීවෙ නැහැ. ඕනෑ හැටියට කථා කරන්න පුළුවන්. මේ කාරණයට අදාලව කථා කරන්න කියලයි කියන්නෙ.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

වැය ශීර්ෂයට අදාළව තමයි කථා කරන්නෙ.

**ගරු පැල්පොල**
*(கௌரவ பெல்பொல)*
(The Hon. Pelpola)

ඔය කියන කාරණාවලට ගරු මන්ත්‍රීතුමාට මා විසින් උත්තරයක් දෙන්න ඕනෑ. මට ඒ උත්තරය දෙන්න ලැබෙන්නෙ නැහැ. ඔවා ගැන සෝදිසි කර බලන්න ඕනෑ. ඒ නිසා කරුණා කර මෙයට අදාළ දෙයක් කියනවා නම් එයට උත්තර දෙන්නම්.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මා හිතන හැටියට මේ හැම කරුණක් ගැනම පෞද්ගලිකව මන්ත්‍රීවරයෙක් වශයෙන් යෝජනාවක් ඉදිරිපත් කර කථා කරන්නයි අපට තිබෙන්නෙ. අයවැය ලේඛනයේ කාරක සභා අවස්ථාවේදීත් තැපැල් අමාත්‍යාංශය සාකච්ඡාවිට ගත්තෙ නැහැ. ප්‍රශ්නයක් එව්වාමත් ඒ කාර්යාංශයේ නිලධාරීන් ඇමතිතුමාට දෙන්නේ මඟහරින උත්තරයක්. කොලේ වහලයි දෙන්නෙ. අඩු වශයෙන් ඒ කාර්යාංශයේ නිලධාරීන්ට කියන්න ඕනෑ මන්ත්‍රීවරයකුගෙන් යම් ලිපියක් ලැබුණොත් එයට පිළිතුරක් යවන්න කියලවත්. පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇසුවාම උත්තරයක් දෙන්නෙ නැහැ. දැන් මෙතන කථා කළාම කියනව අදාළව කථා කරන්නය කියල. ඒ නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නෙ නැහැ. පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් හැටියට තැපැල් කාර්යාංශයට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනව.

අ. භා. 3.46

**ඒ. රත්නායක මයා.** (වත්තේගම)
*(திரு. ஏ. ரத்னாயக்க—வத்தேகம)*
(Mr. A. Ratnayake—Wattegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළාත ගැන කථා කරන විටත් කියන්ට තිබෙන්නෙ බොහොම සුළු දේවල් පිළිබඳවයි. මේ සම්බන්ධයෙන් ලියුම් රාශියක් ලියා ඒවායින් කිසි ප්‍රයෝජනයක් නොලැබුණු නිසා මන්ත්‍රණ සභාවේදී මේ ගැන කථා කරන්න සිදු වී තිබෙනව. මා නියෝජන කරන කොට්ඨාශයට ටෙලිෆෝන් පහසුකම් අඩුයි. මගේ පෞද්ගලික ටෙලිෆෝනයත් බොහෝ වෙලාවල වැඩ කරන්නේ නැහැ. කලාතුරකින් වෙලාවක පමණයි, එය වැඩ කරන්නේ. ඒ මගින් නුවරට කථා කරන්න නම් බොහොම අපහසුයි. කොහෙත්ම බෑ කීවත් වරදක් නැහැ. මේ පිළිබඳව ඒ ප්‍රදේශවල තවත් ගරු මන්ත්‍රීවරුන්ද පැමිණිලි කර තිබෙන බව මා දන්නවා. ඊයේ මගේ ටෙලිෆෝනය වැඩ කෙළේ මිනිත්තු 5ක් පමණයි. අනික් මුළු කාලයම එය මැරිලා. ටෙලිෆෝන් නෝනලා නම් බොහොම හොඳයි. නමුත් ඒ අයගේ සාමාන්‍ය දැනීම බොහොම අඩුයි. ආර්. එම්. සියාතු කියා මා ටෙලිෆෝනයෙන් කීවොත් "ඒ මොකක්ද?" යනුවෙන් ඒ අය ප්‍රශ්න කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

නවා. ඉතින් පැහැදිලි ලෙස මා ඒක විස්තර කර දෙන්නට ඕනෑ. අකුරු වෙන් වෙන් වශයෙන් කියා විස්තර කර දෙන්නට ඕනෑ. මා "කහල්ල" නමැති ගම ගැන සඳහන් කළහොත් "ඒ මොකක්ද? ගමක්ද? තැපැල් කන්තෝරුවක්ද?" යනුවෙන් ඒ අය ප්‍රශ්න කරනව. "හුලුගඟ" කියා කීවොත් එවිටත් අර විධියටම ප්‍රශ්න කරනවා. එම නිසා ටෙලිෆෝන් සේවිකාවන් වශයෙන් තෝරා ගන්න විට ගම්බද ප්‍රදේශවල නම් ගම් ගැන දැනීමක් තිබෙනවාද කියාත් සොයා බලන්න ඕනෑ. ගම්වල නම් ගැන, පුද්ගලයන්ගේ නම් ගැන අවබෝධයක් නැත්නම් එය සුදුසු මදි. අප නියෝජනය කරන ප්‍රදේශවල සිටින අයගේ නම් ගම් කොළඹ වැනි ප්‍රදේශවල සිටින අයගේ නම් ගම්වලට වඩා වෙනස්. මේ කරුණු ගැන ඒ අය සේවයට පත් කර ගන්න විට විභාග කර බලනවා නම් හොඳයි.

**ගරු ටී. බී. තෙන්නකෝන් (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ වැඩබලන ඇමති)**

*(கௌரவ ரீ. பி. தென்னகோன்—உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக பதில் அமைச்சர்)*

(The Hon. T. B. Tennekoon—Acting Minister of Internal and External Trade and Supply)

ලැටින් දන්නවාද කියා නම් විභාග කර බලනවා.

**ඒ. රත්නායක මයා.**

*(திரு. ஏ. ரத்நாயக்க)*

(Mr. A. Ratnayake)

අප නියෝජනය කරන ප්‍රදේශවල ලැටින් නාම නැහැ. වැඩ බලන ගරු වෙළෙඳ ඇමතිතුමා තැපැල් කටයුතු භාර පාර්ලිමේන්තු ලේකම්වරයා වශයෙන් සිටියදී හුලුගඟට උප තැපැල් කාර්යාලයක් නියම කළා. පසුගිය අවුරුදු දෙක තුන තුළ ඒ සඳහා සම්පූර්ණයෙන්ම මුදල් වෙන් කරන ලද නමුත් කොළඹ මූලස්ථානයෙන් තවම කිසිම දැනුම් දීමක් කර නැහැ. ඒ ප්‍රදේශයෙන් ඒ සඳහා සිදු විය යුතු දේ සියල්ල අවසානයි. දැන් ගේකුත් සොයාගෙන තිබෙනවා. නමුත් මූලස්ථානයෙන් කිසිම දැනුම් දීමක් නැහැ. මෙය බලන ගරු ඇමතිතුමා ඔය තනතුරට පත් වීම ගැන බොහොම සන්තෝෂයි. මෙම තැපැල් කන්තෝරුව දුන් පිනෙන් එතුමා කවදා හෝ ඔවැනි තත්ත්වයේ තනතුරක ස්ථිර වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

නවයාලතැන්නටත් උප තැපැල් කාර්යාලයක් ඉල්ලා ලිපියක් යවන ලද නමුත් කටුගස්තොට තැපැල් කන්තෝරුවක් තිබෙන නිසාත්, නවයාලතැන්න කටුගස්තොටට කිට්ටු නිසාත් තවත් තැපැල් කන්තෝරුවක් වුවමනා නැතැයි කියා තිබෙනවා. එතැන සිට සැතපුම් එකහමාරක් පමණ එහායින් ඇති උඩතලවින්නට නම් තැපැල් කන්තෝරුවක් වුවමනායි. මේ ගැන මට අදම පිළිතුරක් වුවමනා නැහැ. කල්පනා කර බලා උඩතලවින්න ගම ඇතුළට තැපැල් කන්තෝරුවක් සපයා දෙන ලෙස ඉල්ලා සිටිනවා. දැනට කුඹුගල හරහා ටෙලිෆෝන් මාර්ගය වැටී ඇතත් ඒ ගමට ටෙලිෆෝන් නැහැ. අඹතැන්න පසු වූ විට කුඹුගල තිබෙනවා. කුඹුගල ළඟට ගිරාකඹුව තිබෙනවා. ඊළඟට ජම්බුගහපිටිය තිබෙනවා. දැනට කුඹුගලටයි, ගිරාකඹුවටයි, ටෙලිෆෝන් නැති නිසා කරුණාකර ඒ ගැනත් ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඊළඟට බැද්දේගම සහ ගලබොඩවත්ත යන ගම් දෙක සඳහා තැපැල් බෙදීමේ සේවයක් සපයා දෙනවා නම් බොහොම ස්තුතිවන්ත වෙන බව මතක් කරන්නට කැමතියි.

අ. භා. 3.51

**එම්. සිවසිතම්පරම් මයා.**

*(திரு. எம். சிவசிதம்பரம்)*

(Mr. M. Sivasithamparam)

There are one or two small matters I would like to raise with the Hon. Minister. I hope he will grant this indulgence and look into these matters.

There is only one telephone line to Jaffna from Colombo. After the military came to the North most of the time this line is engaged by the military to transmit their messages. I do not know whether they are carrying on private conversations on this line or what they do, but one really finds that most of the time

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the telephone line is busy with conversations that the military carries on with its superiors in Colombo.

I have received complaints that even Members of Parliament have to wait more than one or two hours before they get the priority calls booked by them. Private persons, particularly businessmen who want urgent calls to Colombo, find that they have to wait sometimes three to four hours before they are put through.

I think the Postal Department must ask the military either to have their own telephone line or some other form of communication between Colombo and the military post in Jaffna, or, to confine their conversations to the night or some such odd time when the people normally do not use the telephone. After all, the subscribers pay good money to have these telephone facilities, and they should have a chance to make good use of these facilities according to their convenience and requirements.

The other matter to which I would like to refer is the distortion one finds when telegrams given in Tamil are transmitted. Quite often the sense of the telegrams that are sent is entirely distorted and a different meaning is given to the message when the telegram reaches the person to whom it has been sent.

I know of one instance where the telegram was given in this form in Tamil : "ஆட்களை ஆயத்தப்படுத்து; இரவைக்கு வருகிறேன்" "Prepare the people. I am coming tonight." When the telegram reached the other end it read : "அக்காளை ஆயத்தப்படுத்து; இரவைக்கு வருகிறேன்" "Prepare the sister. I will come tonight."! I think this sort of distortion is something that the Hon. Minister should look into. I do not know how these distortions arise; I do not know what the position is in Sinhala, but in Tamil these distortions appear quite often, and I hope the Hon. Minister will look into the matter.

I would once again re-echo the sentiments expressed by the hon. Member for Vaddukkoddai (Mr. Amirthalingam) that facilities to send telegrams in Tamil at least from areas where there is a fair-sized population of Tamils should be available. For example, in the post office at Pussellawa where there is a sizable proportion of Tamils, there are no facilities to send telegrams in Tamil. I think, if not in all post offices at least in the post offices in areas where there is a sizable proportion of Tamils among the population, such facilities to send telegrams in Tamil should be available.

When I wrote to the Postmaster-General with regard to the lack of facilities to send telegrams in Tamil in the post office at Pussellawa, I was told that it is only when 25 per cent of the population are Tamil-speaking that facilities are provided, and when they calculate this 25 per cent they do not take the stateless people into account. They state, therefore, that Pussellawa is an area where facilities to send telegrams in Tamil could not be provided. I think almost all post offices in areas where there is a sizable Tamil population, particularly in the up-country, should have facilities to send telegrams in Tamil.

අ. භා. 3.55

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
(திரு. பி. எச். பண்டார—பதுளை)
(Mr. B. H. Bandara—Badulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්න අදහස් කරන්නෙ නැහැ. ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කළ යුතු කරුණු දෙක තුනක් පමණයි මට තියෙන්නෙ. අවුරුදු කිහිපයක සිට මවිසින් ඉල්ලන ලද දේවලින් බොහොමයක් මේ දක්වාම ලැබී නැති නිසයි ඒ ගැන මතක් කිරීමට මේ අවස්ථාව උපයෝගි කර ගැනීමට මා කල්පනා කළේ. බදුල්ල ඡන්දදායක කොට්ඨාශයට උප තැපැල් කන්තෝරු කීපයක් ලබා ගන්න අදහසින් අවුරුදු දෙක තුනකට උඩදී සිට ඉල්ලන නමුත් තවම ඒ ඉල්ලීම් ඉෂ්ට වී නැහැ. කෙසේ නමුත් මේ වර්ෂයේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[භාණ්ඩාර මයා.]

වත් ගරු ඇමතිතුමා ලවා මේ අවශ්‍යතාවන් ලබා ගැනීමටයි මා දැන් ඉදිරිපත් වන්නෙ.

මගේ කොට්ඨාශයේ උඩවෙල සහ බිම්අරාව යන ස්ථාන දෙකට උප තැපැල් කන්තෝරු දෙකක් ඉල්ලුවා. ඒ ගැන දිස්ත්‍රික්ක සම්බන්ධිකරණ කාරක සභාවෙ දීත් මතක් කළා. මගේ ඉල්ලීම සාධාරණ බව ප්‍රාදේශික තැපල් අධිකාරි මහත්මයත් පිළිගෙන තිබෙන නමුත් තවම එයින් ප්‍රයෝජනයක් ලැබී නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ මහජනයා මේ තැපැල් කන්තෝරු දෙක ලබා ගැනීමට විශාල උනන්දුවක් දක්වනව. එහෙත් ප්‍රමාද වෙන්න වෙන්න ඒ අය අපට වැඩි වැඩියෙන් කරදර කරනව. සමහර විට ඒ උදවිය හිතනව ඇති මන්ත්‍රීවරයා මේ ගැන සලකන්නෙ නැහැ කියල. ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරන්නෙ නැත්තෙ එසේ කළාම එකක්වත් ඉටු කර ගන්න අමාරු තත්ත්වයක් ඇති වන නිසයි. විශාල ජනගහනයක් ඇති උඩවෙල සහ බිම්අරාව යන ස්ථාන දෙකට උප තැපැල් කන්තෝරු දෙකක් ඉක්මනින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

දෙපැත්තේ තිබෙන ගම් දෙකකටම ලියුම් බෙදන නමුත් ඒ ගම් දෙක මැද තිබෙන ගමට ලියුම් බෙදන්නෙ නැහැ. එය ලොකු අසාධාරණයක්. අනෙක් ගම් වලට ලියුම් බෙදන පණිවුඩකරුවන් ලවාම මේ ගමටත් ලියුම් බෙදන්න පුළුවනි. මේ ගැන ප්‍රාදේශිය තැපැල් අධිකාරි මහත්මාටත් මතක් කර තිබෙන නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. ඒ ගමේ ඉන්න අයට ලියමනක් ලබා ගන්න බදුල්ලේ තැපැල් කාර්යාලයට එන්න ඕනෑ. එහෙම නාවොත් මාස ගණනක් ගියත් ලියමන ලැබෙන්නෙ නැහැ. මලංගමුව ගල්පොත්තාව කියන ගමට ලියුම් බෙදීම ඉක්මනින් කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් ඉල්ලා සිටිනව.

ටෙලිෆෝන් පහසුකම් ලබා ගැනීමට ප්‍රදේශවාසීන් තුළ බලවත් උනන්දුවක් තිබෙනව. අවශ්‍ය උප තැපැල් කන්තෝරුවලට ටෙලිෆෝන් සේවය ලබා ගැනීමට කාලයක සිට ලොකු උද්ඝෝෂණයක් කරන නමුත් එයින් මෙතෙක් ප්‍රයෝජනයක් වෙලා නැහැ. විශාල ඉල්ලීම් ඉදිරිපත් කරන්නෙ නැති නිසා මේ ඉල්ලන දේ අපට දීමට ගරු ඇමතිතුමා උත්සාහ ගන්නවා ඇතැයි මා විශ්වාස කරනව.

බදුල්ලේ සිට කොළඹට ටෙලිෆෝන් ඇමතීමක් ගන්න ගියාම අපට නම් ටිකක් ඉක්මනින් ලැබෙනව. ඒ වුණාට සාමාන්‍ය මහජනයාට නම් පැය හත අටක් ගත වෙනව. ටෙලිපෝන් ඇමතීමක් ලබා ගැනීමට ඒ තරම් වේලාවක් බලාගෙන ඉන්න සිදු වීම විශාල කරදරයක්. ලයින් දෙකක් වැඩ කරන නිසා ප්‍රමාද වන බව මට දැන ගන්න ලැබුණා. කෙසේ හෝ මේ ප්‍රමාදය වළක්වන වැඩ පිළිවෙළක් යොදන හැකියට මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්න කැමතියි. මා ඉදිරිපත් කළ කරුණු කීපය ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වෙනවා ඇතැයි විශ්වාස කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන කිහිපය අවසන් කරනව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

අ. භා. 4.30 වන තුරු රැස්වීම තාවකාලිකව අත්සිටුවනවා.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

**වී. නවරත්නම් මයා. (කයිට්ස්)**
*(திரு. வி. நவரத்னம்—ஊர்காவற்றுறை)*
(Mr. V. Navaratnam—Kayts)

கௌரவ உப சபாநாயகர் அவர்களே, தபால், தந்திச் சேவை அமைச்சர் அவர்களின் கவனத்திற்கு இரண்டொரு விஷயங்களைக் கொண்டுவர விரும்புகின்றேன். எனது தொகுதியிலே சில இடங்களுக்குத்தான் சாதாரண தந்திச் சேவை இருந்து வருகின்றது. சில இடங்கள் தீவுகள். அதாவது அவை கடலால் பிரிக்கப்பட்டிருக்கின்றன; அத் தீவுகளுக்கு செய்திகள் அனுப்பவும் பெறவும் ரேடியோத் தந்தி முறைதான் பாவிக்கப்படுகின்றது. இத் தீவுகளிலிருந்து தந்திகள் அனுப்புவதாயிருந்தால் அதன்பொருட்டு ஒரு நாளில் சில நிமிஷங்களுக்குத்தான் அந்தத் தந்தி முறை பிரயோசனப்படுத்தப்படுகின்றது. முக்கியமாக அனலைதீவு, நெடுந்தீவு என்னும் இரண்டு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தீவுகளிலிருந்தும் ரேடியோத் தந்தி மூலம் தான் செய்திகள் அனுப்பப்படுகின்றன. அங்கு வழங்கி வருகின்ற கருவிகள் மிகவும் பிற்போக்கான கருவிகளாயிருக்கின்ற படியினல், அதனையிட்டு மூன்று வருடங்களுக்கு முன் அரசாங்கத்துக்கு எடுத்துச் சொன்ன பொழுது, high frequency radio transmitters என்று சொல்லப்படுகின்ற கருவிகள் மூன்று வரவழைக்கப்பட்டன. இந்தக் கருவிகள் அனலை தீவிலும் நெடுந் தீவிலும் பாவனைக்கு எடுத்துக் கொள்ளப்படவே வரவழைக்கப்பட்டன. ஆனல், இன்று அவைகளை, கடற் படையினர் தங்கள் தேவைகளுக்காகப் பாவித்து வருகின்றுர்கள் என அறிகின்றேன். ஆனல், இந்தத் தீவுகளிலே அந்தப் பழைய கருவிகள் தாம் இன்னும் பாவிக்கப்பட்டு வருகின்றன. கனம் அமைச்சர் அவர்கள் அந்த இரண்டு தீவுகளுக்குமாக வரவழைக்கப்பட்ட high frequency radio transmitters என்று சொல்லப்படும் அந்தக் கருவிகளை உடனடியாகப் பொருத்தி, அங்கிருந்து பிற இடங்களுடன் தொடர்பு கொள்ளக் கூடியதாகத் தந்திச் சேவை வசதியை சீர்ப்படுத்தி நல்ல முறையில் அமைத்துக் கொடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்ளுகிறேன்.

சிங்கள மக்கள் 'நாகதீப' என்று அழைக்கும் நயினதீவில் high frequency radio transmitters என்ற கருவி இப்பொழுது பாவிக்கப்பட்டு வருகின்றது. அனலை தீவிலும், Delft என்று ஆங்கிலத்தில் அழைக்கப்படும் நெடுந்தீவிலும் இக் கருவிகளைத் தங்களது சொந்த உபயோகத்துக்கெனப் பாவித்து வரும் கடற்படையினருக்கும் தரைப்படையினருக்கும் தேவையான கருவிகளை வரவழைக்க எவ்வளவோ வசதிகள் இருக்கின்றன. சாதாரண தந்திச் சேவைக்காக வரவழைக்கப்பட்ட கருவிகளை இவர்கள் உபயோகிக்கக் கூடாது என்பதை இத்தருணத்தில் எடுத்துக் கூறுவதோடு இக் கருவிகளை இரண்டு தீவுகளுக்கும் கொடுக்க வேண்டும் என்றும் கேட்டுக் கொள்ளுகின்றேன்.

அடுத்ததாக, மண்டைதீவு என்ற இடத்திலும் சென்ற வருஷம் வரையில் radio transmitters தந்திச் சேவை தான் இருந்து வந்தது. அந்த இடத்தில் இப்பொழுது சாதாரண கம்பி மூலம் செல்லும் தந்தி வசதி செய்தி கொடுக்கப்பட்டிருப்பதால் அங்கேயிருந்த radio transmitters என்ற கருவியை எழுவை தீவில் கொண்டுபோய் அமைக்க வேண்டும் என்று யாழ்ப்பாண மாவட்ட இணைப்புக்குழுவில் தீர்மானமும் நிறைவேற்றப் பட்டிருக்கின்றது. அத் தீர்மானம் இதுவரை கௌரவ அமைச்சருக்கு அனுப்பப்பட்டிருக்கும் என்றே நினைக்கின்றேன். அதன்படி கௌரவ அமைச்சர் அவர்கள் மண்டைதீவில் இருந்து எடுக்கப்பட்ட radio transmitters கருவியை மிகவிரைவில் எழுவை தீவில் அமைத்துக் கொடுப்பதற்குத் தேவையான நடவடிக்கைகளை துரிதமாகவும், காலதாமதமின்றியும், எடுக்க வேண்டும் என்றும் கேட்டுக் கொள்ளுகின்றேன்.

கௌரவ உப சபாநாயகரவர்களே, 'ஸீ' கிரேட் உப தபாற் கந்தோர்கள் நகரங்களிலும், நகரங்களுக்குப் பக்கத்திலும் இருப்பதால் எவ்வளவோ வேலைத் தாமதம் ஏற்படுகின்றது. சில நெருக்கடியான இடங்களிலுள்ள 'ஸீ' கிரேட் உப தபாற்கந்தோர்கள் மக்களின் தேவைக்காகப் பிரயோசனப்படுவதில்லை. எனது தொகுதியிலுள்ள 'ஸீ' கிரேட் உப தபாற்கந்தோர்கள் மக்களின் தேவையைப் பூர்த்தி செய்யக்கூடியதாக இல்லை. சுருவில் என்ற கிராமத்தில் 'ஸீ' கிரேட் உப தபாற் கந்தோர் ஒன்று இருக்கின்றது. அதனை 'பி' கிரேட்டாக உயர்த்துவதாக அரசாங்கம் கூட மூன்று வருஷங்களுக்கு முன் தீர்மானித்தது. ஆனல் இதுவரையில் அது சம்பந்தமாக எவ்வித நடவடிக்கையும் எடுத்ததாகத் தெரியவில்லை. எனவே, சுருவில் கிராமத்திலுள்ள உப தபாற்கந்தோரை மாற்றியமைப்பதோடு நின்றுவிடாமல் எனது தொகுதியிலுள்ள மற்றைய உப தபாற்கந்தோர்களையெல்லாம் "பி' கிரேட்டுக்கு தரமுயர்த்தி, டெலிபோன் வசதி செய்து கொடுக்க வேண்டும் என்று கேட்டுக்கொள்ளுகின்றேன்.

புங்குடுதீவில் இறுப்பிட்டி என்ற ஒரு இடமிருக்கின்றது. இறுப்பிட்டி உப தபாற் கந்தோருக்கு டெலிபோன் வசதி செய்து கொடுக்கப்பட வேண்டுமென்று அங்குள்ள மக்கள் எவ்வளவோ முறைகள் கேட்டுக் கொண்டிருக்கின்றுர்கள். அங்குள்ள மக்கள் வசதியானவர்கள். டெலிபோனை நாளாந்தம் பாவிக்கக் கூடியவர்கள். கொழும்பில் தொழில்களில் ஈடுபட்டுள்ளவர்கள். அவர்கள் கொழும்புக்கு டெலிபோன் செய்ய வேண்டுமானல் 4, 5 மைல் தூரம் நடந்து தான் வேறு உப தபாற்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[வீ. நவரத்தினம் மயா.]

கந்தோர்களுக்குப் போக வேண்டியிருக்கின்றது. எனவே, இறுப்பிட்டியிலுள்ள 'ஸீ' கிரேட் உப தபாற்கந்தோரை 'பி' கிரேட்டுக்கு தரமுயர்த்தி, டெலிபோன் வசதியும் உடனடியாக ஏற்படுத்திக்கொடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

எனது தொகுதியிலுள்ள முக்கியமான பட்டினம் Kayts என்று சொல்லப்படும் ஊர்காவற்றுறையாகும். அங்கிருந்து டெலிபோன் மூலம் ஏதாவது தொடர்பு கொள்ள வேண்டுமானால், அதற்கான எக்சேஞ் யாழ்ப்பாணத்தில் தான் இருக்கின்றது. ஊர்காவற்றுறையிலிருந்து ஒரேயொரு line (லைன்) தான் இரண்டு எக்சேஞ்களுடனும் தொடர்பு கொள்ளுகின்றது. அந்த ஒரு கம்பியின் மூலம் தான், டெலிபோனில் தந்திகளை அனுப்பும் சில உப தபாற்கந்தோர்கள் தந்திகளை அனுப்பி வருகின்றன. சாதாரணமாக ஒரு தபாற் கந்தோர் தந்திகளை டெலிபோன் மூலம் அனுப்ப ஆரம்பித்தால் அரை மணி, முக்கால் மணி நேரத்துக்கு மேற் பிடிக்கும். இதனால், யாழ்ப்பாணத்துடன் தொடர்பு கொள்ள அனேக முறைகள் நான் இரண்டு, மூன்று மணி நேரத்துக்கு மேற் காத்திருக்க வேண்டிய நிலை ஏற்பட்டிருக்கின்றது. முக்கியமாகச் சில உத்தியோகத்தர்களோடு அல்லது அரசாங்க அலுவலகங்களோடு தொடர்பு கொள்ள சுமார் மூன்று அல்லது நான்கு மணி நேரம் காத்திருக்க வேண்டி இருக்கிறது. யாழ்ப்பாணத்திற்கும் ஊர்காவற்றுறைக்கும் இடையிலுள்ள தொலைபேசித் தொடர்பை இரண்டு இணைப்புக்கள் மூலம் நடாத்தும் படி நாம் பல ஆண்டுகளாக வற்புறுத்திக் கொண்டு வந்திருக்கிறோம். தற்பொழுது ஒரு இணைப்பு மூலம் நடைபெறும் இந்தச் சேவையைத் திருத்தியமைக்க இதுவரை எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்பட வில்லை. இந்த விடயத்தை உடனடியாகக் கவனிக்க வேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களை நான் மிகவும் விநயமாகக் கேட்டுக் கொள்ளுகிறேன். கௌரவ அமைச்சர் அவர்கள் ஊர்காவற்றுறை யாழ்ப்பாணம் தொலைபேசித் தொடர்பை இரண்டு இணைப்புக்கள் கொண்ட தொலை பேசித் தொடர்பாக விரைவில் மாற்றித் தர வேண்டும்.

அடுத்ததாக ஊர்காவற்றுறை தபாற் கந்தோரைப் பற்றிச் சில வார்த்தைகள் கூற விரும்புகிறேன். இத்தபாற் கந்தோர் இந்தத் தொகுதியிலேயே மிக முக்கியமான ஒரு தபாற் கந்தோராகும். இந்தக் கந்தோர் நூறு, நூற்றைம்பது வருட காலப் பழமை வாய்ந்த கட்டடமொன்றில் இயங்கிக்கொண்டிருக்கின்றது. கந்தோரின் ஒரு புறம் கந்தோர் அதிபதியின் விடுதியாகவும் உள்ளது. ஆனால் இத் தபாற் கந்தோர் அதிபதி இந்த விடுதியில் குடியிருப்பதில்லை. அவர் வேறொரு இடத்திலிருந்து தினசரி பஸ் மூலமாகவோ அல்லது வேறு மார்க்கமாகவோ வந்து போய்க் கொண்டிருக்கிறார். இந்தத் தபாற் கந்தோர்க் கட்டடத்திற்கென அருகிலுள்ள நிலத்தை அரசாங்கம் பயன்படுத்தலாம். இதற்கான தீர்மானம் ஏற்கனவே எடுக்கப்பட்டும் புதிய கட்டடத்தை கட்டுவதற்காக இதுவரை எந்தவிதமான நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட வில்லை. ஊர்காவற்றுறைத் தபாற் கந்தோருக்கான புதிய கட்டடம் அவசியமானதொரு தேவையாக இருக்கிறது. வேலணை தபாற் கந்தோரும் அரசாங்கத்திற்குச் சொந்தமான ஒரு கட்டடத்தில் நடைபெற வேண்டியது அவசியமானதாகும். இது சம்பந்தமாகவும் முன்னைய தீர்மானங்களுக்கமைய நடவடிக்கைகள் எதுவும் எடுக்கப்படவில்லை. இந்தக் குறைகள் எல்லாவற்றையும் கௌரவ அமைச்சர் அவர்கள் உடனடியாகத் தனது கவனத்திற்கெடுப்பார் என்று நம்புகிறேன்.

අ. භා. 4.41

**එල්. බී. ජයසේන මයා.** (බිංගිරිය)
*(திரு. எல். பி. ஜயசேன—பிங்கிரிய)*
(Mr. B. L. Jayasena—Bingiriya)

නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල් හා විදුලි සන්දේශ අමාත්‍යාංශය යටතේ ඇති මේ පරිපූරක ඇස්තමේන්තුව ගැන හරි හැටි විස්තර සඳහන් වී නොතිබීම අඩු පාඩුවක් හැටියට මා මුලින්ම සඳහන් කරන්න කැමතියි. විශේෂයෙන්ම අලුත් අමාත්‍යාංශය පිහිටුවා ඇති ගොඩනැගිල්ල පිළිබඳව, ඒ ගෙවල් කුලී පිළිබඳව ගිය වියහියදම් වෙන වෙනම සකස් වුණා නම් වඩාත් හොඳය කියා මම අදහස් කරනවා.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය ගැන අපි ඒ තරම් දුරට සාකච්ඡා කළ යුතු නැහැ. ඒ මොකද ? එය නොමිලේ සේවය කරන දෙපාර්තමේන්තුවලින් යුක්ත අමාත්‍යාංශයක් නොවන නිසයි. තැපැල් කාර්යාලයක් පිහිටුවීමෙන් බලාපොරොත්තු වශයෙන් අවශ්‍ය සේවාවක් මහජනයාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉටු කරන ගමන්ම ඒ සේවාවට අවශ්‍ය ආදායමක් ලබා ගැනීමයි. විදුලි සන්දේශ හෝ විදුලි පණිවුඩ හෝ යැවීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවන්නේ නොමිලේ සේවයක් ලබා දීමට නොවෙයි. එය මහ ජනයාට අවශ්‍ය දෙයක් මුදල්ගෙවා ලබා ගැනීම පිණිස ඇති කර තිබෙන ක්‍රමයක්. එම නිසා නොමිලේ කෙරෙන සේවාවක් හැටියට ඒ සේවාව දුර්වල වී තිබෙනවා නම් එය දෙපාර්තමේන්තුවේ හෝ අමාත්‍යාංශයේ හෝ දුර්වලකමක් හැටියට අපි පිළිගන්න ඕනෑ.

මේ රටේ තැපැල් හා විදුලි සන්දේශ සේවාව පවත්නේ ඉතාමත් නොදියුණු තත්ත්වයකයි. අවශ්‍ය බොහෝ ස්ථානවල තැපැල් කාර්‍යාල නැහැ. තිබුණත් තිබෙන්නෙ "සී" පංක්තියේ සුළු තැපැල් කාර්‍යාල පමණයි. මෙවැනි "සී" වර්ගයේ තැපැල් කාර්‍යාලවලින් පළාතේ අවශ්‍යතාවන් කොහෙත්ම ඉටු වෙන්නෙ නැහැ. ඒ වාගේම බොහෝ ප්‍රදේශවල ලියුම් බෙදීම කෙරෙන්නෙ නැහැ. මේ වර්ගයේ තැපැල් කාර්‍යාලවලින් ලියුම් ලැබීමේදී සති ගණන්, මාස් ගණන් ප්‍රමාද වෙනවා. හැතැප්ම ගණන් මග ගෙවා ඒ තැපැල් කාර්‍යාලවලට යාමට මහජනයාට අපහසු නිසා ලියුම් ලබා ගැනීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ කාරණය සම්බන්ධයෙන් ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇත කියා බලාපොරොත්තු වෙනව.

තැපැල් හා විදුලි සංදේශ සේවාව රජයේ මුදල් වැය වීමට පමණක් සීමා වූ දෙපාර්තමේන්තුවක් නොවන නිසා, එය පුළුල් කර සකස් කිරීමට පුළුවන්කම තිබෙනව. මුදල් නැත කියා කිව්වාට එය පිළිගන්න අපි ලැහැස්ති නැහැ. අය වැය දෙකෙන්ම යන් දෙපාර්තමේන්තුවලදී ඒ කථාව අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව අදත් තිබෙන්නෙ මීට අවුරුදු පණහකට හැටකට පමණ පස්සට ගිය තත්ත්වයකයි. අනික් රටවල තැපැල් හා විදුලි පණිවුඩ සේවාවන් පිළිබඳව සසඳා බලන විට අපට ඒ බව හොඳින්ම පෙනී යනවා.

වත්තේගම ගරු මන්ත්‍රීතුමා (ඒ. රත්නායක මයා.) සඳහන් කළා වාගේ, අපට ලැබී තිබෙන පෞද්ගලික ටැලිපෝනය වුවද ක්‍රියාත්මක වන්නේ කලාතුරකිනුයි. එය ක්‍රියාත්මකව පවතින්නේ සමහර විට අපට අවශ්‍ය නැති අවස්ථාවලදීයි. අවශ්‍ය අවස්ථාවලදී නම් කවදාවත් ක්‍රියාත්මකව පැවතුනේ නැහැ. කොළඹට යම්කිසි වුවමනාවක් සඳහා ටෙලිපෝන් පණිවුඩයක් ලබා ගැනීමට අවශ්‍ය අවස්ථාවලදී ඒ මධ්‍යස්ථානයෙන් පණිවුඩය ලැබෙන්න කලින් කොළඹට සාමාන්‍යයෙන් මෝටර් රථයකින් පැමිණ ඒ කාර්යයත් ඉටු කර ගෙන ආපසු යන්නටත් පුළුවනි. ඒ නිසා එවැනි ටැලිපෝනයක් තිබීමෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ. මේ විධියට ප්‍රමාද ඇති වන්නේ මොන හේතූන් නිසාද කියා විස්තර කරන්න අමාරුයි. නමුත් ඊට හේතුව වශයෙන් කෙළින් උත්තරයක් දෙන්න පුළුවන්, මේ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ඉතාමත් ප්‍රමාදය, ඒ වාගේම දුර්වලය කියා.

ඒ වාගේම මේ අවස්ථාවේදී මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. නාත්තන්ඩියේ සිට වැලිපැන්නගහමුලට යන මාර්ගයේ විදුලි පණිවුඩ කණු දෙකක් ඇත් අවුරුද්දක පමණ සිට පහත වැටී තිබෙනවා. ඒ ගැන ලියා යැව නමුත් ප්‍රතිසංස්කරණය කර නැහැ. යම්තම් වැහි පොදක් ගැහුවොත්, එහෙම නැත්නම් සාමාන්‍ය හුළඟක් හැමුවොත්, හිටි ගමන්ම ටෙලිෆෝන් මාර්ග අක්‍රියාත්මක වෙනව. මෙනිසා අපේ පෞද්ගලික ටෙලිෆෝන් යන්ත්‍ර පමණක් නොවෙයි, තැපැල් කාර්‍යාලවල ටෙලිෆෝන් යන්ත්‍ර පවා ක්‍රියා විරහිත වෙනව.

තවත් එක කාරණයක් ගැන කියන්න තියෙනව. 1963-64 මුදල් වර්ෂයේදී කලියපිටියෙ නාගොල්ලාගොඩට ටෙලිෆෝන් සේවාවක් ඇති කිරීම සඳහා මුදල් වෙන් කළා. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලැබී තියෙනව. මෙවැනි සේවා දෙකක් එකවර සකස් කරන්නයි, කියා කළේ. බෝගමුල්ල උප තැපැල් කාර්‍යාලයට දෙන ටෙලිෆෝන් සේවය තමා පළමු වැන්නයි. දෙවැන්න, මගේ කොට්ඨාශයෙ පිහිටි නාගොල්ලාගොඩ උප තැපැල් කාර්‍යාලයට දෙන ටෙලිෆෝන් සේවයයි. බෝගමුල්ල සේවය විවෘත වුනා. තාමවත් නැහැ මගේ කොට්ඨාශයේ ටෙලිෆෝන් සේවාව සම්බන්ධයෙන් වැඩ කටයුතු කෙරුණේ. මේ සම්බන්ධයෙන් ලියුම් පිට ලියුම් ලියා තිබෙනව; මුණ ගැසී කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]

තිබෙනව; දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කර තිබෙනව; අද වන තුරු කිසිම උත්තරයක් නැහැ. පසුගිය දිනක විදුලි සංදේශ කටයුතු පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු ජයසේකර මහත්මයා පෞද්ගලිකව හමුවෙලත් මේ ගැන මතක් කළා. උන්නැහෙ කීව, "මේක අනුමත වෙලා තියෙන එකක්; නමුත් අතපසු වෙලා තියෙනව; ඉක්මනින් ක්‍රියාවේ යොදවන්න පුළුවනි" කියා. මුදල් වෙන් කර වැඩ අවසන් වී ඇති මෙම ටෙලිෆෝන් සේවය මේ අවුරුද්දෙවත් හැකි පමණ ඉක්මනින් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

අපේ ඡන්ද කොට්ඨාශය බොහොම පිටිසරයි. එම නිසා ටෙලිෆෝන් සේවා පහසුව අප කොට්ඨාශවලට ඉතාම අවශ්‍යයි. අවශ්‍ය ප්‍රදේශවලට එම පහසුව ලබා දෙන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව. වීරපොකුණට සම්පූර්ණ ටෙලිෆෝන් සේවයක් ලබා දීම පිණිස යන මුළු වියදම දරන්න එක්තරා වතු යායක අයිතිකාරයින් කොටසක් කැමති වී සිටිනව. ඒ පිළිබඳ ලියවිලි මට භාර දුන් පසු මම ඒවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළා. නමුත් ඒ පිළිබඳව තාමත් උත්තරයක් ලැබී නැහැ. මුදල් වියදම් කොට මුදල් උපයා ගන්න දෙපාර්තමේන්තුවක් හැටියට මෙම දෙපාර්තමේන්තුව හඳුන්වා දෙන්න ඕනෑ. එම නිසා වැඩ අතපසු වන්න හේතුවක් නැහැ, විධිමත්ව වැඩ කෙරෙනව නම්. මෙම දෙපාර්තමේන්තුවෙ වැඩ නිසියාකාර කෙරෙනව නම්, පාඩු වෙන්නෙ නැහැ; ලාබ ලැබිය යුතුයි.

බිංගිරිය ඡන්දදායක කොට්ඨාශයෙ සමහර ප්‍රදේශවලට තවමත් ලියුම් බෙදෙන්නෙ නැහැ. එවැනි ප්‍රදේශවල ලියම් බෙදීම සඳහා පියන්වරුන් පත් කිරීමට යෝජනා කර ලැයිස්තු එවලත් තියෙනව. පසගිය වර්ෂයෙ කීව, ඒ කටයුත්ත සඳහා මෙම වර්ෂයෙ මුදල් වෙන් කරනවාය කියා. දැන් ඒ පිළිබඳ තත්ත්වය කුමක්ද කියන්න මා දන්නෙ නැහැ. පසුගිය මුදල් වර්ෂයෙ ඇතැම් ඡන්දදායක කොට්ඨාශවලට ලියම් බෙදන්නන් පත් කිරීම නොකරුණා නම්, ඒ ගැන පරීක්ෂා කර බලා අත්‍යවශ්‍ය ප්‍රදේශවලට එම නිලධාරීන් පත් කරන හැටියට මා ඉල්ලා සිටිනව.



විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට අයිති කටයුතු සඳහා ඉදිරිපත් කරන ඇස්තමේන්තු බොහොම අධික වියදම් යන ඒවා බව කියන්න සිදු වී තිබෙනව. සැතපුම් 3ක විදුලි පණිවුඩ සේවයක් ආරම්භ කිරීම සඳහා රුපියල් 23,000 කට ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණා. උපකරණ යනාදිය සඳහා කොතරම් මුදලක් වැය කළත් සැතපුම් 3 ක් සඳහා මෙතරම් මුදලක් වියදම් වේය කියා සිතන්න බැහැ. මේ විධියට අධික ලෙස මුදල් වැය කළ යුතු ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමෙන් සහ වැඩ ප්‍රමාද කිරීම සඳහා ඇතැම් නිලධාරීන් ගන්න උත්සාහයන් නිසා මෙම කටයුතුවල තත්ත්වය ඉතා දුර්වල වී තිබෙනව. විශෙෂයෙන්ම බිංගිරිය වැනි පිටිසර ප්‍රදේශවල තැපැල් සේවය සහ විදුලි පණිවුඩ සේවය දියුණු කිරීම සඳහා මේ වර්ෂයේදී හෝ සුදුසු පරිදි ක්‍රියා කරන්න කල්පනා වේවා කියා ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 4.50

**ලක්ෂ්මන් ද සිල්වා මයා.** (බලපිටිය)
(திரு. லக்ஷ்மன் டி சில்வா—பலப்பிட்டிய)
(Mr. Lakshman de Silva—Balapitiya)

මේ අංශය සම්බන්ධයෙන් මාද වචන සවල්පයක් කථා කළ යුතුව තිබෙනව. පසුගිය අවුරුදු තුන හතර තුළ ගම්බද ප්‍රදේශවල විදුලි පණිවුඩ සේවය යනාදී සේවාවන් දියුණු කිරීම උදෙසා තරමක සේවයක් කෙරී තිබෙන බව කියන්න පුළුවනි. නමුත් මෙම දෙපාර්තමේන්තුව මගින් එම සේවාවන් හරියාකාර ඉටු කර නැති බව කියන්ට සිදු වී තිබෙනව.

විශෙෂයෙන්ම අම්බලංගොඩ තැපැල් කන්තෝරුවෙ ටෙලිෆෝන් සේවාව ගැන කියන්න ඕනෑ. එහි සිට ගාල්ලට හෝ කොළඹට කතා කරන්න "ටෙලිෆෝන් කෝල්" එකක් ගන්න සමහර විට දින තුනේ හතරේ බලා සිටින්න වෙනව. අපට රජයෙන් දී තිබෙන ටෙලිෆෝනයෙන් කිසි ප්‍රයෝජනයක් ගන්න බැරුව දින තුනේ හතරෙ අපි ඉඳල තියෙනව. මේ තත්ත්වය සම්බන්ධව මා සොයා බැලුව. අවුරුදු 50ක් විතර පරණ "බෝඩ්" එකක්ලු, අම්බලන්ගොඩ කන්තෝරුවෙ තියෙන්නෙ. එතන සේවය කරන පිරිසගෙ කිසි වරදක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහි සේවය කරන අය ඉතා උනන්දුවෙන් අපට එම "ටෙලිෆෝන් කෝල්ස්" යනා දිය ලබා දීමට සැම තිස්සෙම සූදානමින් සිටිනව.

මට ආරංචි වී තිබෙනවා, කුරුණෑගලින් අස් කරන ලද බෝඩ් එකක් අම්බලන්ගොඩ ට සවි කරන්න යනවාය කියා. කුරුණෑගල ට එපා වූ බෝඩ් එක අම්බලන්ගොඩට හොඳ වන්නේ කොහොමද කියා මම අහනවා. අවුරුදු ගණනක් කුරුණෑගල වැඩ කරන ලද, එහි ක්‍රියා විරහිත වූ බෝඩ් එකක් අම්බලන්ගොඩ සවි කිරීමෙන් අම්බලන්ගොඩට සේවයක් සිදු වෙයිද? ඔය විදියටද, අපට සේවය කරන්නෙ?

බලපිටියේ නියෝජිතයා හැටියට මම ඉල්ලා සිටියා බලපිටියේ තැපැල් කන්තෝරුවෙන් ඒ ප්‍රදේශයට ලියුම් බෙදන්නය කියා; නමුත් එසේ කරන්න බැරිය කියා මට ලියුමක් එවා තිබෙනවා. මන්ත්‍රීවරයකු වුවත් මට ලියුම් ලැබෙන් නේ දවල් 11 ට පමණයි. අම්බලන්ගොඩ තැපැල් කන්තෝරුව මගේ නිවසේ සිට සැතපුමකට වඩා දුර නැහැ; නමුත් මට ලියුම් ලැබෙන්නේ දවල් එකොළහමාරට පමණ.

කන්දෙගොඩ උප තැපැල් කාර්යාලයක් තිබෙනවා. ඒ උප තැපැල් කාර්යාලයෙන් ලියුම් බෙදන්නයයි අපි ඉල්ලා තිබෙනවා. තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තියක් තිබෙනවා; අපි කොයි විදියේ ඉල්ලීමක් කළත් එය ඉටු කරන්න බැරිය කීමයි, ඒ ප්‍රතිපත්තිය. අපි යවන ඉල්ලීම්වලට, කරන්න පුළුවන්ය කියා කවදාවත් උත්තරයක් ලැබෙන්නේ නැහැ. කළුගල්ල ඇමතිතුමා තැපැල් කටයුතු භාරව සිටියදී නම් නිලධාරීන් කුමක් කිව්වත්, ඒ ඇමති තුමාවත් කිව්වා, කර දෙන්නම්ය කියා. හැබැයි, අවුරුද්දක් දෙකක් ගියාට පසුවයි, ඒවා ඉටු වූයේ. කල් ගිහින් හරි ඒ වැඩ ඉටු කර දීම ගැන අපි කළුගල්ල ඇමති තුමාට ස්තුතිවන්ත වෙනවා.

තැපැල් කන්තෝරු විවෘත කරන විට "සී" ශ්‍රේණියෙන් නොව "බී" ශ්‍රේණි යෙන් එක වරම පටන් ගන්නයයි අපි ඉල්ලා තිබෙනවා. නමුත් අපට ලැබුණු උත්තරය කෙලින්ම බැරිය කියන එකයි. කවදාවත් පුළුවන්ය කියා උත්තරයක් වශයෙන් ලැබෙන්නේ නැහැ. ඒ විදියේ තත්ත්වයක් මේ දෙපාර්තමේන්තුවේ තිබීම ගැන අපි කනගාටු වෙනවා.

තැපැල් දෙපාර්තමේන්තුව එක්තරා විදියක වෙළඳ ආයතනයක්. වෙළඳාමේ නියුක්ත පෞද්ගලික වෙළඳ මහත්වරු ළඟට යම් කිසි කාරණයක් සඳහා ගියොත් ඒ මහත්වරු බොහොම ආදරයෙන් බොහොම නිහතමානීකමින් කථා කර ඒ කරුණ ඉටු කරනවා; නමුත් රජයේ දෙපාර්තමේන්තුවක් වෙළඳ ව්‍යාපාරයක් වශයෙන් කටයුතු කරන අවස්ථාවේදී රජයේ නිලධාරි මහත්වරු ඒ විදියට කල්පනා කර කටයුතු නොකිරීම ඉතාමත් කනගාටුවට කාරණයක්. ඒ නිලධාරීන් සිටින්නේ ඒ රාජකාරි කටයුතු කර රජයට මුදල් හම්බ කර දීමට බව ඔවුන් සිතේ තබා ගත යුතුයි. යම් කෙනෙක් යම් දෙයක් කරන්නටයයි කී විට ඒ ගැන උනන්දු වෙන් හා නිහතමානී ලෙස සැලකිල්ලක් දක්වා කටයුතු කළ යුතුයි. එවැනි නිලධාරීන් සිටිනවා නම් අපේ ගම්බද ප්‍රදේශවල මහජනයාටත් හොඳ සේවයක් ලබා දෙන්න පුළුවනි.

වැලිතර උප තැපැල් කාර්යාලයට ටෙලිෆෝන් එකක් ලබා දෙන්නයයි මම අවුරුදු තුනක් වේලේම ඉල්ලා තිබෙනවා. බලපිටියේ අභ්‍යාස විද්‍යාලයට එතැන දොර කඩින් ටෙලිෆෝන් කම්බි ඇද තිබෙනවා. එතැනට ටෙලිෆෝන් එකක් දීමට වුවමනා කරන්නේ කම්බි දෙකක් ඇදීමත් තව කණුවක් හෝ දෙකක් සිටුවීමත් පමණයි. ඊට පසු යන්ත්‍රයක් දෙන්න පුළුවනි. නමුත් ඒ ගැන කිසිත් සැලකිල්ලක් දක්වා නැහැ. මෙතන කෝටි ගණන් මුදල් පාස් කළත් අපට වැඩ කෙරෙන්නේ ඒ විදිය ටයි. අපි මේවා පිළිබඳව කොපමණ ලියුම් ලිව්වත් බීරි අලියට වීණා ගායනා කරන්නා වගෙයි. ඒවා ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. අපේ ප්‍රදේශයට වහාම හොඳ ටෙලිෆෝන් සේවයක් ලබා දෙන්න යයි මම ඉල්ලා සිටිනවා.

අපට කොළඹට හෝ ගාල්ලට "ටෙලිෆෝන් කෝල්" එකක් දවසේ දෙකේ තුනේ ගන්න බැරි අවස්ථා එමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ද සිල්වා මයා.]

ඇති වෙනවා. හයියෙන් හුළඟක් හැමුවොත්, නැති නම් ටිකක් වැස්සොත්, "ටෙලිෆෝන් කෝල්" එකක් ගන්න ලැබෙන්නේ නැහැ. ඌරගස්මන්හන්දියේ උප තැපැල් කන්තෝරුවක් තිබෙනවා. එතැන සුමානෙට දවස් 4 ක් "කෝල්ස්" ගන්න බැහැ. මහ ඉදුරුවේ සහ ඉදුරුවේ උප තැපැල් කන්තෝරුවල කොහොමවත්ම "කෝල්" එකක් ගන්න බැහැ. මේවා රෙපයාර් කිරීමට යවන අයගෙන් සමහර දෙනාට ඒවා කරන්න දැනීමක් ඇත්තෙත් නැහැ. හැබැයි, හොඳට වැඩ කරන හොඳ දැනුමක් ඇති කෙනෙක් ඒ ප්‍රදේශවල සිටියොත් කොහොම හරි ඒ තැනැත්තා වෙනත් ප්‍රදේශයකට මාරු කර හැරීමේ ප්‍රතිපත්තියක් තිබෙනවා. ඔහු මාරු කර යවා වැඩ නොතේරෙන කෙනෙක් ඒ වෙනුවට එවනවා. ඔය විධියේ ප්‍රතිපත්තියක් ගෙන යන බව නොකියා බැහැ. පළපුරුද්දෙන් පෙනී ගොස් තිබෙන සත්‍යයක් මා කියන්නෙ. අපේ අළුත් තැපැල් ඇමතිතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනව, පරණ ක්‍රමය අමතක කර හොඳ සේවයක් මේ රටට ලබා දීමට ක්‍රියා කරන්න කියා. "සී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරු කොතැනකවත් පිහිටුවන්ට වුවමනා නැහැ. "බී" ශ්‍රේණියේ ඒවා මිස "සී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරු පිහිටුවීමෙන් කිසිම ප්‍රයෝජනයක් නැහැ.

උප තැපැල් කන්තෝරුවලට තැපැල් මහතුන් පත් කරන විට ඒ සඳහා ජ්‍යෙෂ්ඨ සමතුන් තෝරා ගැනීම ප්‍රතිපත්තියක් හැටියට සලකනවා නම් හොඳයි, කියන එක මගේ අදහසයි. උප තැපැල් කාර්යාලවල සේවය කරන තැපැල් මහත්වරුන්ට තැපැල් දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවයට බැදෙන්ට අද පහසුකම් සලසා නැහැ. සමහරවිට ඒ උදවිය අවුරුදු විසිපහක්—තිහක් සේවය කළත්, අන්තිමේදී හිස් අතින් ගෙදර යන්ටයි සිදුවී තිබෙන්නෙ. වෙනත් රජයේ සේවකයන්ට නම් විශ්‍රාම වැටුප් ආදිය ලැබෙනව. එහෙත් උප තැපැල් කාර්යාලවල සේවය කරන මේ පිරිසට එවැනි පහසුවක් නැහැ. මෙසේ සේවය කර ඉවත්ව යන උදවියට ප්‍රයෝජනවත් වන විධියේ වැඩ පිළිවෙළක් රජය මගින් සකස් කරන්ට ඕනෑ. එසේ නැත්නම් අවුරුදු ගණනක් උප තැපැල් කාර්යාලයක සේවය කිරීමෙන් පසු—මා හිතනව, ජ්‍යෙෂ්ඨ සමතුන් මේ සඳහා බඳවා ගන්නව නම් ඒ වැඩ පිළිවෙළ ඇති කරන්ට පුළුවනි කියා—රජයේ තැපැල් කාර්යාලවල—උප තැපැල් කාර්යාලවල නොවෙයි—සේවයට ඒ උදවියට ඇතුළත් විය හැකි ක්‍රමයක් සකස් කිරීම යෝග්‍ය බව නව ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි.

අ. භා. 4.58

**එස්. ජේ. වී. චෙල්වනායගම් මයා. (කන්කසන්තුරේ)**

*(திரு. எஸ். ஜே. வீ. செல்வநாயகம்—காங்கேசன்துறை)*

(Mr. S. J. V. Chelvanayakam—Kankesanturai)

*கௌரவ உப சபாநாயகர் அவர்களே, நான் இரண்டு விஷயங்களைப் பற்றிப் பேச விரும்புகின்றேன். முதலாவது விஷயம் காங்கேசன்துறைத் தபால் கந்தோரைப் பற்றியது. நாலு, ஐந்து ஆண்டுகளுக்கு முன் காங்கேசன்துறைத் தபாற் கந்தோரைப் புதிதாகக் கட்டுவதற்கு, கட்டாயமாக ஒரு காணியை அரசாங்கம் கையேற்று, கட்டடச் செலவுக்கு வரவு செலவுத் திட்டத்திலும் பணம் ஒதுக்கியிருந்தது. அப்படியிருந்தும் இன்னும் அந்தத் தபாற் கந்தோர்க் கட்டடம் கட்டப்படவில்லை. காங்கேசன்துறை பெரியதொரு பட்டினமாக இருந்து வந்திருக்கிறது. இரண்டு ஆசுப்பத்திரிகள் அங்கிருக்கின்றன. சீமெந்துத் தொழிற் சாலை அங்கிருக்கிறது. இன்னும் பல ஸ்தாபனங்களும் அங்கிருக்கின்றன. ஆகையால், கூடிய விரைவில் இந்தத் தபாற் கந்தோரைக் கட்டி முடிக்கும்படி நான் கேட்டுக்கொள்ளுகிறேன்.*

*இரண்டாவதாக, கொழும்புப் பட்டினத்திலே, பெருவாரியான தமிழ் பேசும் மக்கள் வாழும் இந்தப் பட்டினத்திலே தமிழில் தந்தி அனுப்ப முடியாதிருக்கின்றது. மத்திய தந்தி நிலையத்தில் மாத்திரந்தான் இப்பொழுது தந்திகளைத் தமிழில் ஏற்றுக் கொள்ளுகிறார்கள். ஏனைய இடங்களிலெல்லாம் தந்திகளைத் தமிழில் ஏற்றுக் கொள்ள மறுக்கிறார்கள். முன்பு கொள்ளுப்பிட்டித் தபாற் கந்தோரிலும் தமிழில் தந்திகளை ஏற்று வந்தார்கள். ஆனால், இப்பொழுது அங்கும் தமிழில் தந்தி அனுப்ப முடியாதிருக்கின்றது. கொழும்பில்,*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

குறிப்பாக கொள்ளுப்பிட்டித் தபாற் கந்தோரிலும் வெள்ளவத்தைத் தபாற் கந்தோரிலும் தமிழில் தந்திகளை ஏற்பதற்கு ஒழுங்குகள் செய்ய வேண்டுமென்று கௌரவ அமைச்சரைக் கேட்டு எனது பேச்சை முடித்துக் கொள்ளுகிறேன்.

අ. භා. 5.1

**එල්. බී. දසනායක මයා.** (ගම්පොළ)
*(திரு. எல். பி. தஸநாயக்க—கம்பளை)*
(Mr. L. B. Dassanayake—Gampola)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ තැපැල් හා විදුලි පණිවුඩ සේවා සම්බන්ධයෙන් කරුණක් දෙකක් මතක් කරන්ට කැමතියි. සෑම මන්ත්‍රීවරයෙක්ම ටෙලිෆෝන් සේවාවේ අඩුපාඩුකම් සම්බන්ධව කථා කරනවා. අද අපට දුරකථනයෙන් කථා කරන්ට පැය ගණනක් මිඩංගු කරන්ට සිද්ධ වෙනවා. මුළු ලංකාවේම මේ විධියේ බරපතළ තත්වයක් ඇති වී තිබෙන හෙයින් මහජනයාට ටෙලිෆෝන් පහසුකම්වලින් ප්‍රයෝජන ගන්ට අපහසු වී තිබෙන බව පෙනී යනවා. මහනුවර දිස්ත්‍රික්කයේ —විශේෂයෙන් ගම්පොළ ප්‍රදේශයේ—තත්ත්වයත් මේ වගේම බව කනගාටුවෙන් මතක් කළ යුතුව තිබෙනවා. අළුත් ඇමතිතුමා ගම්පොළ—

**ටී. බී. ජයසුන්දර මයා.** (උඩුනුවර)
*(திரு. ரி. பி. ஜயசுந்தர—உடுநுவர)*
(Mr. T. B. Jayasundera—Udunuwara)

එහෙ අළුතෙන් දෙකක් හදල තිබෙනව, නේද?

**දසනායක මයා.**
*(திரு. தஸநாயக்க)*
(Mr. Dassanayake)

පළාතේ කෙනකු නිසා මේ ප්‍රශ්න ඉක්මනින් නිරාකරණය වෙයි කියා ඒ පළාතේ ජනතාව තුළ බලාපොරොත්තුවක් තිබෙනවා. මට පෙනෙන හැටියට නම් ගම්පොළ හා මහනුවර සිට කොළඹට දුර කථනයෙන් කථා කරන්ට යොදා තිබෙන "ට්‍රංක් ලයින්" කම්බි ප්‍රමාණවත් නැහැ. එක "ඔටෝ එක්ස්චේන්ජ්" එකකට ටෙලිෆෝන් දෙතුන් සියයක් දෙනව. තවත් එකකට තව දෙතුන් සියයක් දෙනව. ඔය ආදී වශයෙන් එක් එක් හුවමාරු ස්ථානයකට ටෙලිෆෝන් දෙතුන් සියය සම්බන්ධ කර පසුව ඒවා කොළඹට සම්බන්ධ කර තිබෙනව. කොළඹට සම්බන්ධ කර තිබෙන "ට්‍රංක් ලයින්" කම්බි කොළඹට කිට්ටුවන්ට, කිට්ටුවන්ට අඩු වෙනව. කොළඹට එන විට දෙක තුනයි තිබෙන්නෙ. ඒ නිසයි, මහජනයාට අද ටෙලිෆෝන් පහසුකම් නියම අන්දමට නොලැබෙන්නෙ. මේ ගැන මහජනයාගෙ කලකිරීම කෙතරම්ද කිවහොත් මුදල් නොගෙවා ටෙලිෆෝන් ගලවාගෙන යන්ට යයි කියනව. මීට කාරණය කුමක්දැයි විදුලි කාර්මික අංශය මගින් සොයා බලනව නම් මේ කරුණු සත්‍ය බව පෙනී යාවි.

ලංකාවේ ටෙලිෆෝන් සේවය සාදා තිබෙන්නෙ ඉතා පැරණි ක්‍රමයටයි. ඉතා පැරණි ක්‍රමයේ උපකරණයි ඒ සඳහා යොදා තිබෙන්නෙ. මා හිතන්නෙ කොල්ලුපිටියේ තිබෙන සී. ටී. ඕ. එක වැනි ඒවා කවදා හෝ කඩාගෙන වැටුණොත්, මේ රටේ කිසිම වැඩක් කර ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා ලංකාවේ ටෙලිෆෝන් සේවය ගැන අනික් ඇමතිවරුන්ටත් කියා ඔවුන්ගේත් ආධාරය ඇතිව මුළු රටේම ටෙලිෆෝන් සේවය ප්‍රකෘතිමත් කිරීමේ මාර්ගයක් ඇති කරන්නට ඕනෑ වී තිබෙනවා. ටෙලිෆෝනයකින් බලාපොරොත්තු වන්නේ ඈතට කථා කරන්නයි. එය කර ගන්න ලැබෙන්නෙ නැත්නම්, ටෙලිෆෝන් එක කුත් ළඟ තබා ගෙන ටෙලිෆෝන් කෝල් එකක් ගන්න පැය තුන හතරක් බලා ඉන්න වෙනවා නම්, එය භයානක අපරාධයක්. ඒ නිසා ඒ ගැන අලුත් ඇමතිතුමා පරීක්ෂා කර බලා ටෙලිෆෝන් සේවාව යථා තත්ත්වයට ගෙනෙන්නට මාර්ගයක් සකස් කරනවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ සමගම තවත් කාරණයක් කියන්න ඕනෑ. බලපිටියෙ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ "සී" වර්ගයේ උප තැපැල් කාර්යාලයකින් මේ ලෝකයේ දෙයක් සිදු වන්නෙ නැහැ. මහජනයා කෑ ගහන විට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දසනායක මයා.]

"සී" වර්ගයේ උප තැපැල් කාර්යාලයක් අරිනව. ඉන් රුපියල් 10ට වැඩි පෝස්ටල් ඕඩර් මාරු කරගන්න පුළුවන් කමක් නැහැ. බැංකු පොතෙන් ගන්න පුළුවන් වන්නෙත් රුපියල් 10 යි. බැංකු පොතට දමන්න පුළුවන් වන්නෙත් රුපියල් 10යි. ඒක තිබෙන්නෙ මුද්දර විකුණන්න පමණයි. මනි ඕඩරයක් මාරුකිරීම වැනි වැදගත් සේවයක් ලබා ගන්න බැහැ. "සී" වර්ගයේ තැපැල් කාර්යාල ඇති කරන්නෙ මහජනයා රැවටීමට පමණයි. ඒ නිසා "සී" වර්ගයේ තැපැල් කන්තෝරු විවෘත කිරීම නතර කර ඒ වෙනුවට "බී" වර්ගයේ තැපැල් කන්තෝරු අරිනවා නම් එයින් මහජනයාට යහපතක් සිදු වෙනව. මුදල් තත්ත්වය ගැන බලන විට ඒ සඳහා ටිකක් අමාරුකම් තිබෙන බව පෙනෙනව. එහෙම නම් "සී" වර්ගයේ තැපැල් කන්තෝරු නැත්තටම නැති කරන එක හොඳයි.

ගරු බලපිටියේ මන්ත්‍රීතුමා කී විධියට තැපැල් දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට අද දක්වාම නානාප්‍රකාර වෘත්තීන්හි යෙදෙන අය තැපැල් දෙපාර්තමේන්තුවේ සිටිනවා. තැපැල් මහත්වරුන් හැටියට, උප තැපැල් මහත්වරුන් හැටියට, පියන් මහත්වරුන් හැටියට, ලියුම් බෙදන්නන් හැටියට, ටැලිග්‍රෑම් ගෙන යන්නන් හැටියට, ඔය අන්දමින් නොයෙක් අන්දමේ වෘත්තීන්හි යෙදෙන අය විශාල සංඛ්‍යාවක් එහි රාජකාරිය කරනවා. නමුත් ඔය මුළු දෙපාර්තමේන්තුවේම සේවය කරන අයගෙන්—යම්කිසි විධියක තත්ත්වයක් තිබුණත්—බරපතළ වගකීමක් අරගෙන, ආණ්ඩුවේ භාණ්ඩත් ප්‍රවේශම් කරගෙන, ආණ්ඩුවේ මහ තැපැල් කාර්යාලවල කෙරෙන්නට ඕනෑ වැදගත් සේවාවකුත් කරන, උප තැපැල් මහත්වරුන්ට ඔවුන් අස්වී යන අවස්ථාවේදී කිසිම පිළිසරණයක් නැහැ. අඩු වශයෙන් අර්ථ සාධක අර මුදලක්වත් නැහැ. පසුගිය කාලයේදී ඇමතිවරුන් කීප දෙනෙක් අර්ථ සාධක අරමුදලක් ගැන සාකච්ඡා කර, කොමිටි පත් කර, යම් යම් වාර්තා ආදියත් ගෙන්වා ගෙන, එවැන්නක් ඇති කිරීම පිළිගෙන තිබෙන බව මා දන්නවා. නමුත් අද වන තුරුත් එය ක්‍රියාත්මක වී නැහැ. අවුරුදු 30ක් පමණ "ඒ" ග්‍රේඩ් තැපැල් කන්තෝරුවක උප තැපැල් මහත්මයෙක් වශයෙන් සේවය කර යම්කිසි දවසක බැරි වීමකින් රුපියල් 5ක් අඩු වුණොත්, පරීක්ෂක මහත්මයෙක් ඇවිත් රුපියල් 5ක් අඩුයි කියා දැන ගත්තොත්, ඔහු අස් කරනව. ඒ උප තැපල් මහත්වරු සිටින්නෙ ඒ තරම් භයානක තත්ත්වයක. උප තැපැල් මහත්වරුත් සමගම භයානක ප්‍රපාතයකට ඇද වැටෙන තවත් කොටසක් සිටිනවා. ඒ උප තැපැල් මහත්වරුන්ට සහාය වෙන්න සිටින "සබ්ස්ටිටියුට්ස්" කියන කොටසයි. ඔවුන් සේවයේ යොදවා ගන්නේ උප තැපැල් මහත්වරුන් විසින්මයි. එසේ කර ඔවුන්ගේ මාර්ගයෙන්ම පඩි ගෙවනව. අඩු වශයෙන් තැපැල් කන්තෝරුවක පුරප්පාඩුවක් සඳහා ඉල්ලන විටකවත් ඔවුන්ට කිසිම අයිතියක් ඒ වෙනුවෙන් ලැබෙන්නෙ නැහැ. අද ලංකාවේ තැපැල් කන්තෝරු, උප තැපැල් කන්තෝරු 3000ක් පමණ තිබෙනවා. මේ විධියට වැඩ කරන "සබ්ස්ටිටියුට්ස්" කියන අයත් 3000ක් පමණ සිටිනවා. ඔවුන් ඒවාට ගොස් සිටින්නෙ විශාල බලාපොරොත්තුවකිනුයි. ඔවුනුත් ඇප බඳින්නට ඕනෑ; සමහර විට උප තැපැල් මහත්වරුන්ගේ වැඩ ඔක්කොමත් බාර ගෙන කටයුතු කරන්නත් වෙනව. නමුත් ඔවුන්ට ලැබෙන වේතනය බොහොම අඩුයි. ඒකත් ස්ථිර වේතනයක් නොවෙයි. තැපැල් මහත්මයාට හිතුණොත් දෙනව; නැත්නම් නැහැ. ඔන්න ඔය විධියේ පැටලිලි සහිත තත්ත්වයකයි ඒ පිරිස සිටින්නෙ. අනාගතයේ පත්වීම් දෙන අවස්ථාවේදී ඒ උදවිය ගැන සැළකිලිමත් වෙනවා නම් මීට වඩා ප්‍රයෝජනයක් අත් වෙනව. දැන් කෙරෙන ක්‍රමයට වඩා එය හොඳයි.

ඊළඟට මගේ ගම්පොළ කොට්ඨාශය සම්බන්ධයෙන් මට නොතේරෙන කරුණු දෙකක් තුනක් තිබෙනව. දැන් අවුරුදු 4½ කට 5 කට පෙර බෝවල කියන ගමේ බෝවලපුර නමින් තැපැල් කන්තෝරුවක් විවෘත කරන තත්ත්වයට කටයුතු කෙරුණා. තැපැල් මහත්මයෙකුත් පත් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනකක් තබා ඔහු ඇපත් බැන්ද. මා සිතන්නෙ එවකට තැපැල් ඇමති වශයෙන් සිටියෙ මරික්කාර් මහත්මය. නමුත් ඒ තැපැල් කාර්යාලය පිහිටුවීම නැවැත්තුව. මා ඒ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න මාර්ගයෙනුත් වෙනත් නා නා ප්‍රකාර මාර්ගවලිනුත් ක්‍රියා කළා. නමුත් අද වනතුරු මට ඒ සම්බන්ධයෙන් කිසිම පිළිතුරක් ලැබී නැහැ. මේ තැපැල් කන්තෝරුව විවෘත කරනවාද නැද්ද කියා මා දන්නෙ නැහැ. තවම නම් විවෘත කරන සංඥවකුත් නැහැ.

ඊළඟට මේ මෑතදී, දැන් අවුරුදු 1½ කට පමණ පෙර මුල්ගම කියන ගමට තැපැල් කාර්යාලයක් සම්මත කළා. තැපැල් මහත්මයෙකුත් පත් කළා. පසුව ඔහු ග්‍රාම සේවක තනතුරකට පත් වී ගියා. ඊළඟට නැවත වරක් ඉල්ලුම් පත්‍ර කැඳවා තැපැල් මහත්මයෙක් තෝරා ගත්තාලු. මා දන්නෙ නැහැ. නමුත් දැන් මාස 7 ක් 8 ක් ගත වී තිබෙනව. එක්කෝ තෝරා ගත් අයට පත්වීම දෙන්න ඕනැ. නැත්නම් අලුතෙන් කෙනෙකු පත් කරන්න ඕනැ. තාම ඒ පත්වීම දී නැහැ. මේ උප තැපැල් මහත්වරුන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාර ගෙන සම්මුඛ පරීක්ෂණ තැබුවාට පසු ඒ පරීක්ෂණයෙන් පත් කිරීමත් අතර විශාල කාල පරිච්ඡේදයක් ගත වන්නෙ ඇයි? මේකෙ වැදගත් රහසක් ඇති. අන්න ඒක ගැන ඇමතිතුමා පරීක්ෂා කරන්න. ඒ ඒ ප්‍රදේශවල අධිකාරිවරුන් මේ පත්වීම් පිළියෙළ කර කොළඹට එවනව. නමුත් කොළඹ කන්තෝරුවෙ ඒව අවුරුදු ගණන් පල් වෙනව. ඒ ඇයි? සමහර විට අවුරුදු ගණනක් පල් වී පත්වීම ලැබෙනව. අසවලා තෝරා පත් කරන්න ලැස්තිය කියා කොළඹින් දන්වා එවවත් ප්‍රාදේශීය කාර්යාලයෙන් දන්වනතුරු එය ස්ථිර නැහැ. මේ විධියෙ ඇද වැටෙන ගතියක් අද තිබෙනව. අභ්‍යන්තරයෙ, සැක උපදවන තත්ත්වයක් තිබෙනව. ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

මා නියෝජනය කරන ගම්පොල ඡන්ද දායක කොට්ඨාශය ගැන තමන්නාන්සේ දන්නව. කලින් මන්ත්‍රීවරයා හැටියට තමන්නාන්සේයි ගම්පොල කොට්ඨාශය නියෝජනය කළේ. එහි බොහොම ඈත ප්‍රදේශයක් තිබෙනව නිල්ලඹ කියා. නිල්ලඹ "බී" ශ්‍රේණියෙ තැපැල් කාර්යාලයක් තිබෙනව. ඒ වාගේම නාරන්විටත් හුන්දෙනියෙත් "බී" ශ්‍රේණියෙ තැපැල් කාර්යාල තිබෙනව. මේ තැපැල් කාර්යාල තුනටම ටෙලිෆෝන් සේවා පහසුකම් ඉතාමත් අවශ්‍ය වී තිබෙනව. ඒ පහසුකම් ලබා දෙන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනව.

අවසාන වශයෙන් මට තවත් කාරණයක් මතක් කරන්ට තිබෙනව. ගම්පොල අලුත් තැපැල් කාර්යාලය සාදන්න පෙර පරණ තැපැල් කාර්යාලයක් තිබුණා. අවුරුදු දෙකහමාරකට නැත්නම් තුනකට පෙරයි ඒ පරණ තැපැල් කාර්යාලය අලුත් ගොඩනැගිල්ලට ගෙන ගියෙ. නමුත් පරණ ගොඩනැගිල්ල තවම එහෙමමයි. කිසිම රාජකාරි වැඩකට ඒ ගොඩනැගිල්ල යොදා නැහැ. ඒක වෙනින් දෙපාර්තමේන්තුවකට අයිති වෙන්න යනවාය කියා මට ආරංචියි. ඒ කෙසේ වෙතත්, එවැනි වැදගත් ගොඩනැගිල්ලක් අවුරුදු තුනක්ම බල්ලන්ටත් වවුලන්ටත් ලගින්න ඉඩ දී තිබෙනව. ඊටත් වඩා රෑ කාලවලදී ඒ ගොඩනැගිල්ල වෙන වෙන අකටයුතුවලට යොදා ගන්නව. ඒ නිසා ඒ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මොකක් හෝ යම් වැඩ පිළිවෙළක් තිබෙනවා නම් එය ක්‍රියාත්මක කරන හැටියට හෝ මහජන ප්‍රයෝජනයක් අත් වන දෙයකට මේ ගොඩනැගිල්ල යොදන හැටියට හෝ ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

අ. භා. 5.12

**ඇල්බට් මයා.**

*(திரு. அல்பேட்)*

(Mr. Albert)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කොට්ඨාශයේ අඩුපාඩුකම් පිළිබඳව මා විශේෂයෙන්ම වචන කීපයක් කථා කරන්ට බලාපොරොත්තු වෙනව. මුළු ගාලු දිස්ත්‍රික්කයම තැපැල් සේවාව, ටෙලිෆෝන් සේවාව සම්බන්ධයෙන් මතා දුම් ප්‍රදේශයක් වගේය කියා ඒ දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීන් දෙදෙනෙකුම දැන් කරුණු ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන් මේ සම්බන්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

යෙන් සතියකට කලින් මා ගරු ඇමතිතුමාටත් පැමිණිලි කළා. කොටින්ම මා සිටින ප්‍රදේශයම ටැලිපෝනයෙන් පණිවුඩයක් ගන්න බැහැ. අපිට ටැලිපෝනයෙන් පණිවුඩයක් ගන්න පුළුවන් සතියකට එක දවසක පමණයි. ඒ නිසා මෙවැනි දුරකථන සේවයක් පවත්වාගෙන යාම රජයටත් කරදරයක් ; අපටත් කරදරයක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙ වැඩ සම්පූර්ණයෙන්ම මහජනයගෙ වැඩ. ඒවා සම්පූර්ණයෙන්ම නැති වෙලා තියෙනව ටෙලිපෝන් සේවයේ අඩුපාඩුකම් නිසා. රජයත්, බොරුවට අපරාදේ වියදමක් දරනව ටෙලිපෝන් සේවයක් තබාගෙන ඉන්නවය කියල. බලාපොරොත්තු වන සේවය එයින් ලැබෙන්නෙම නැහැ. ඒ නිසා ඒ ප්‍රදේශයෙන්ම මේ සේවය අස් කර දමා නැවතත් අපට පරණ විධියටම වැඩ කරගෙන යන්න ඉඩ හරින්න. එතකොට අපට ටෙලිපෝන් සේවය ගැන බලාපොරොත්තුවක් නොතබා අපේ වැඩ කටයුතු පරණ පුරුදු විධියටම කරගෙන යන්න පුළුවන් වේවි.

1960 වර්ෂයේදී, එවකට හිටපු තැපැල් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා තල්ගස්වලට ස්වයංක්‍රිය ටෙලිෆෝන් මධ්‍යස්ථානයක් දෙන බව ප්‍රකාශ කළා. ඒ වගේම 1962-63 ආදායම් වර්ෂය තුළදී ඒ සඳහා මුදල් වෙන් කරන බවකුත් කියා සිටියා. ඒ කොයි හැටි වෙතත් අද වන තුරු වුණේ මොකක්දැයි අපට දැනුමක් නැහැ. වරින්වර මේ ගැන මතක් කර සිටි නමුත් එයින් ප්‍රයෝජනයක් ලැබී නැහැ. දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කාරක සභාවේදිත් මේ ගැන මතක් කළ නමුත් කිසිම වැඩක් වුණේ නැහැ. අපේ ඉල්ලීම් ගැන කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. මේ තත්ත්වය ඇති වීමට හේතුව ඇමතිවරුන් වෙනස් වීමයි. අන්තිමට හිටියෙ වැඩක් හරියාකාර කරන්න බැරි ඇමතිවරයෙක් වෙන්න ඇති. දැන් අලුත් ඇමතිතමා මේ ගැන කරුණාවෙන් සොයා බලා දුර්වලතාවත් මග හරවා වැඩ කිරීමට පටන් ගන්නවා ඇතැයි අප බලාපොරොත්තු වෙනව. කලින් හිටපු ඇමතිතමා කිසිම වැඩක් කළේ නැහැ. මුළු ලංකාවෙම තැපැල් සේවය සම්පූර්ණයෙන්ම කාලා දැම්මෙය කියන්න පුළුවනි. වගකීම පිළිබඳව කලින් තිබුණ හොඳ හැඟීම සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනව. ලක්ෂ ගණන් කෝටි ගණන් මුදල් වංචා ඇති වුණත්, තැපැල් මලුවලින් විශාල මුදල් ප්‍රමාණයන් නැති වුණත් මේ අවාසනාවන්ත යුගයෙදි බව පෙනෙනව.

ලියුම් බෙදීමේ සේවයත් කිසිසේත්ම සතුටුදායක නැහැ. රටේ ජනගහණය ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙනවා වගේම මා නියෝජනය කරන කොට්ඨාශය තුළත් ජනගහණය අවුරුදු පතා වැඩි වෙනව. ජනගහණය වැඩි වීමත් සමගම අනුක්‍රමයෙන් ගෙවල් සංඛ්‍යාවත් වැඩි වෙනව. ඒ අනුව මිනිසුන්ගේ වුවමනාවල් වැඩි වීමත් සවාභාවික දෙයක්. එතකොට වඩ වඩා හොඳ තැපැල් සේවාවක් ඇති වෙන්නත් ඕනැ. ඒ වෙනුවට ඇති වෙලා තියෙන්නෙ ඊට වඩා බොහොම වෙනස් තත්ත්වයක්. කලින් යම්කිසි තැපැල් පහසුකම් තිබුණා නම් දැන් ඒවත් නැති වෙලයි තියෙන්නෙ. දිවිතුරු වැලිවිටියෙ තැපැල් කන්තෝරුවෙන් ලියුම් බෙදන්නෙ නැහැ. බද්දේගම තැපැල් කාර්යාලයෙන් තමයි ලියුම් බෙදන්නෙත්. එය තිබෙන්නේ මගේ ආසනයේ මායිමේ සිට හැතැප්ම දෙකක් එහායිනුයි. ඒ නිසා මේ ගැන විශේෂයෙන් සලකා බලන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනව.

අපේ ප්‍රදේශයේ පාඨශාලාචාර්යවරුන්ට රජයෙන් ලැබෙන වැටුප් මුදල් ලබා ගැනීමේදීත් බොහොම ලොකු අපහසුකම්වලට මුහුණ පාන්න සිද්ධ වෙනව. රජයෙන් පඩි ගන්න ගුරු මහත්වරුන්ට, මුදල් පරිහරණය කරන්නන්ට, හැතැප්ම විස්ස තිහ ඈත යන්න සිද්ධ වෙනව. පාඨශාලාවට අවශ්‍ය මුදල් ගෙන එන්න බොහොම දුර යන්න සිද්ධ වීම ලොකු කරදරයක්. පළමුවැනි ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයයක් හැටියට අපට තිබෙන්නෙ ඇල්පිටිය උප තැපැල් කාර්යාලය පමණයි. පිටිගල හැතැප්ම දහයක් එහා තිබෙන්නෙ. පළමුවැනි ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයක් එහාට දිය යනව තිබුණේ මීට අවුරුදු දහයකට ඉස්සරයි. ලක්ෂ ගණන් මුදල් ගෙන යන්න සිද්ධ වෙලා තියෙන්නෙ හැතැප්ම දහසයක් දුර ඉඳලයි. තැපැල් කන්තෝරුවට ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොස් මුදල් දෙන්න ක්‍රමයක් සලස්සනවා නම් සහනයක් ඇති වන බව කියන්න කැමතියි.

මුදල් තැන්පත් කිරීමේදීත්, මුදල් ආපසු ගැනීමේදීත් අපහසුකම් රාශියකට මුහුණ පාන්න සිද්ධ වෙනව. බෙන්තර තැපැල් කාර්යාලය ගැන මා කලිනුත් කිව්වා. එතන පළමුවැනි ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයක් තිබෙනව. ඒ වුණාට පාරේ යන කෙනෙකුට එවැනි තැපැල් කාර්යාලයක් තිබෙන බව දැනගන්න විධියක් නැහැ. වෙන දෙයක් තබා ඒක තියෙන තැන පෙනෙන්නෙවත් නැහැ. යම්තම් මුඩුක්කුවක් වගේ තැනක තමයි ඒක තියෙන්නෙ. මේ ගෙට අවුරුදු 30 ක් පමණ බදු ගෙවා තිබෙනව. ඒ මුදලින් ඉඩම් අක්කර දහයක් අරන් තැපැල් කාර්යාලයක් හදන්න ඉඩ තිබුණා. ඒ වුණාට ඒ ගැන සලකා නැහැ. ඒ නිසා වහාම මේ ගැන පරීක්ෂා කර බලා මීට වඩා සුදුසු ස්ථානයකට මෙම තැපැල් කාර්යාලය ගෙන යන මෙන් මා ඉල්ලා සිටිනව. පළමුවැනි ශ්‍රේණියේ තැපැල් කාර්යාලයයක් ඒ විධියට තිබීම ඉතාමත් කණගාටුදායක කාරණයක් බව මතක් කරන්න සිදු වී තිබෙනව.

ලියුම් බෙදා හරින්නන්ගෙ අඩුකම තදින්ම බල පාන්න පටන්ගෙන තිබෙනව. ඒ ගැනත් වහාම පරීක්ෂණයක් පවත්වා නිසි ලෙස කටයුතු කරන මෙන් මතක් කරන්න ඕනැ. මීට වඩා යමක් කියන්න අදහස් කරන්නෙ නැහැ. අවසාන වශයෙන් මා ඉල්ලා සිටින්නෙ උප තැපැල් කාර්යාලවල සේවය කරන උප තැපැල් මහත්වරුන්ගෙ අනාගතය ගැන යමක් කරන ලෙසයි. ඒ අයටත් යම්කිසි තත්ත්වයක් ඇති කරන්න ඕනැ. කාලයක් තිස්සේ සේවය කර විශ්‍රාම ගන්න කාලය වන විට පිළිසරණයක් දිය හැකි තත්ත්වයක් තිබිය යුතුයි. ඒ ගැනත් අවධානය යොමු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනව. විදුලි පණිවුඩ හුවමාරු සේවයේ තිබෙන දුර්වලකම් බොහොම ඉක්මනින් අවසන් වේවායි ප්‍රාර්ථනා කරන අතරම දෙවියන්ට පඬුරක් අද රෑට බඳින්න බලාපොරොත්තු වන බවත් මතක් කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.





අ. භා. 5.18.

ජයසුන්දර මයා.
(திரு. ஜயசுந்தர)
(Mr. Jayasundera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පරිපූරක ඇස්තමේන්තුව යටතේ වචන සවල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනව. තැපැල් කන්තෝරු ඒ ඒ ශ්‍රේණිවලට උසස් කිරීම පිළිබඳවයි, මා විශේෂයෙන් අදහස් සවල්පයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නෙ.

තැපැල් කන්තෝරු උසස් කිරීමේ දී අපේ කඳු උඩරට ප්‍රදේශ වැනි නොදියුණු ප්‍රදේශ ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනැ. දැනට ඒ ප්‍රදේශවලට "සී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට යුනිට්ස් 10,000 කුත්, "බී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට යුනිට්ස් 15,000 කුත්, "ඒ" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට යුනිට්ස් 25,000 කුත් වුවමනා කරනව. මේ විධියෙන් තැපැල් කන්තෝරු උසස් කිරීම නිසා අපේ පළාත්වලට ලොකු කරදරයකට මුහුණ පාන්න සිදු වී තියෙනව. අපේ ප්‍රදේශයේ "සී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට යුනිට්ස් 10,000 ක් ලබා ගැනීම අමාරුයි. අවුරුදු 4 ක් තිස්සේ නොයෙකුත් කරදර මධ්‍යයේ උත්සාහ කළත් ඒ තත්ත්වය ඇති කර ගන්න පුළුවන්කමක් නැහැ. පිං පඩි ගන්න හැතැප්ම 4, 5 දුර ගෙවා "ඒ" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට එන්න ඕනැ. මීට කලින් සිටි ගරු සිරිවර්ධන ඇමතිතුමාගෙනුත් අප ඉල්ලා සිටියා, තැපැල් කන්තෝරු උසස් කිරීමේ වැඩ පිළිවෙළ වෙනස් කරන ලෙස. මහනුවර දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදී අපි ඉල්ලා සිටියා, "ඒ" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට යුනිට්ස් 15,000 කුත් "බී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට යුනිට්ස් 7,500 කුත්, "සී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරුවකට යුනිට්ස් 5,000 කුත් අවශ්‍ය හැටියට සලකන ලෙස. එසේ ගණින් බලා සෑම තැපැල් කන්තෝරුවක්ම ඉක්මනින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසුන්දර මයා.]

උසස් කර දීමට වැඩ පිළිවෙළක් යොදන ලෙස අපි ඉල්ලා සිටියා. තවම ඒ ගැන කිසිම උත්තරයක් අපට ලැබී නැහැ. කොයි තරම් ඇවිටිලි කළත් බැරිබව දන්වන නව මිසක් වෙන කිසිම පිළිතුරක් එවන්නෙ නැහැ. ගරු ඇමතිතුමා කලින් නියෝග කළා මේ තැපැල් කන්තෝරු ඉතාමත් ඉක්මණින් උසස් කරන ලෙස. නමුත් තවම ඒ ගැන වැඩ නොකිරීම ගැන මම කනගාටු වෙනවා. අද විදුලි පණිවුඩ සේවා දෙපාර්තමේන්තුවත්, තැපැල් දෙපාර්තමේන්තුවත් දියුණුවෙන් දියුණුවට නොව පස්සෙන් පස්සට යන, අද රටට ගැළපෙන්නෙ නැති දෙපාර්තමේන්තු දෙකක් බවට පත්වී තිබෙනව. නොයෙකුත් රටවල් අළුත් විධියේ දේ ඇති කර දියුණු වන අවස්ථාවේදී ලංකාවේ තිබෙන මේ දෙපාර්තමේන්තු පස්සට යනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොයෙකුත් මන්ත්‍රීවරුන් පැමිණිලි කළ හැටියට කොළඹ සිට පිට ප්‍රදේශයකට ටෙලිෆෝන් පණිවුඩයක් ගන්න පැයක් හමාරක් ගත වෙනව. නොයෙකුත් ප්‍රමාද දෝෂ නිසා ටෙලිෆෝන් පාවිච්චි කරන මහත්වරුන්ගෙන් පැමිණිලි රාශියක් ලැබෙනව. පිට පළාතකට ටෙලිෆෝන් පණිවුඩයක් ඉක්මණින් ගැනීමට පුළුවන් වන විධියට ක්‍රමයක් යොදන ලෙස මා ඉල්ලා සිටිනව. නිලධාරීන් ජපන් රටට හෝ එංගලන්තයට යවාවත් මේ සඳහා පුහුණු කරවා ගන්න ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. හැතැප්ම 70 ක් දුර ප්‍රදේශයකට ටෙලිෆෝන් පණිවුඩයක් ගන්න පැය දෙකක් තුනක් ඉන්න වෙනව නම් ඒකෙ තේරුමක් නැහැ. ඒ නිසා මේ සඳහා ඉක්මන් වැඩ පිළිවෙළක් යෙදීම ඉතාමත් අවශ්‍යයි.

ඒ ඒ පළාත්වල වැඩ ඒ ඒ පළාත් වල කායඖලවලින්ම කර ගැනීමේ වැඩ පිළිවෙළක් ඇති කිරීමට ඇමතිතුමා පසුගිය දිනවල තීරණය කළා. දැන් තියෙන පිළිවෙළ අනුව පිට ප්‍රදේශයකට වුනත් ටෙලිෆෝන් එකක් ලබා ගන්න වුවමනා නම්, ඒ ගැන තක්සේරු කරල ඒ විස්තර කොළඹට එවල නැවත ඒවා ඒ ප්‍රදේශයට ගිහින් ටෙලිෆෝනය ලබා ගන්න අවුරුදු 2 ක් 3 ක් ගත වෙනව. ඒ විධියේ වැඩක් සඳහා සාමාන්‍ය කෙනකුට අවුරුදු දෙක තුනක් ගත වන අතර අපටත් ඒ දෙපාතීමේන්තුවෙන් වැඩක් කරවා ගන්න අවුරුද්දක් හමාරක් ගත වෙනව. මේ දෙපාතීමේන්තුවේ වැඩ කටයුතු ලෙහෙසියෙන් සහ ඉක්මනින් කරන්න නම් ඒ ඒ පළාත්වල වැඩ ඒ ඒ පළාත්වල කාර්යාලවලින් කර ගැනීමට පුළුවන් පිළිවෙළක් යොදන්න ඕනෑ. එ වැනි වැඩ පිළිවෙළක් යෙදීමට ගරු ඇමතිතුමා තීරණය කර තිබුණු නමුත් යම් යම් බලපෑම් නිසා වන්නට ඇති, දැන් එය අතපසු කර තිබෙනව. එය එසේ අතපසු කර තිබෙන්නෙ මක්නිසාද, ඒ වැඩ පිළිවෙල ඉක්මනින් ක්‍රියාවේ යොදවනවාද, කියා මම දැන ගන්න කැමතියි. ඒ ඒ පළාත්වල කටයුතු ඒ ඒ පළාත්වල කාර්යාලවලින් ම කර ගැනීමට කටයුතු සලස්වනව නම් මහජනයාට හොඳ සේවයක් ඉක්මනින් ලබා ගැනීමට පුළුවන් වෙනව. ඒ නිසා ඒ ඒ පළාත්වල වැඩ ඒ ඒ පළාත්වල කාර්යාලවලින් ම කිරීමට වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යොදවන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

මගේ ප්‍රදේශයේ "ඒ" ශ්‍රේණියේ තැපැල් කන්තෝරු තිබුණත් අංග සම්පූර්ණ තැපැල් කන්තෝරු නැති නිසා නොයෙකුත් අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වී තිබෙනව. අවුරුදු තුන හතරක් තිස්සේ අප ඉල්ලා තිබෙනව, හංදෙස්ස වැනි මධ්‍යස්ථානයක අංග සම්පූර්ණ තැපැල් කන්තෝරුවක් ඇති කරන ලෙස. ඒ ඉල්ලීම ක්‍රියාවේ යොදන ලෙස ඉල්ලන අතරම ගරු ඇමතිතුමාගෙන් මෙන්ම තැපැල් දෙපාතීමේන්තුවේ නිලධාරි මහත්වරුන් ගෙනුත් මා ඉල්ලා සිටිනව, මහජනයාට හොඳ සේවයක් ලබා දීමට ඉක්මනින් වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස.

අ. භා. 5.23

**ජයසිංහ මයා.**

*(திரு. ஜயசிங்ஹ)*

(Mr. Jayasinghe)

Mr. Deputy Speaker, let me first wish the Hon. Minister well in his new capacity as Minister of Posts and Telecommunications. We are aware that the telecommunication system as it exists today is a very old system

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

not capable of handling the increased services of the day. I do hope that in the near future, with the completion of the new exchange, he will be able to give us a better service. But there are certain remedies that he may be able to effect even under the present system, particularly the allocation of telephones.

For the Western Province, for our area, we have an Assistant Commissioner of Education at Gampaha. His office serves Negombo, Katana, Chilaw, Wattala, Kelaniya, Dompe, Veyangoda, Ja-Ela and other electorates which are around that area. As a matter of fact, about a month ago I was with the hon. Member for Gampaha at this education office, and we found that the assistant commissioner has no telephone. He looks after about ten or fifteen electorates, but his office has not been installed with a telephone, I do hope the Hon. Minister will look into this matter. Apart from that, it was only the day before yesterday, that a very nasty accident was averted in my electorate. We had to rush a vehicle for the use of the electrical linesman. There is a sub-station and linesmen's quarters at Hendala to look after the leprosy hospital, factories in the neighbourhood, and so on. I understand that they made an application for a telephone well over two years ago. There was a break-down in the electricity service and there was a live wire fallen on the main Hendala road. It could have caused very serious injuries to the people using that road. There was no way of contacting the electrical repair service station because there was no telephone connection to the sub-station. I hope the Hon. Minister will take this matter up early.

There is then another matter I wish to bring to the notice of the Hon. Minister, and that is regarding telephone fees. I know the Hon. Minister of Finance in his Budget Speech said that many of the old taxes which were unjust would be removed. When he was on this side of the House, he was a vehement opponent of the enhanced telephone tax, and I wonder if the Hon. Minister will be able to take up this matter with the Hon. Minister of Finance and see whether the subscriber's fee of Rs. 500 for a telephone cannot be adjusted.

There is also this matter of trunk calls even in our area which is only about six or seven miles from Colombo. We have an auto-exchange, but after the auto-exchange was installed, it is very difficult to get a trunk call. The auto-exchange serves us to speak freely in Wattala, but if somebody in Wattala wants to speak to someone in Kurunegala they think that because we are served with an auto-exchange we do not deserve much notice to be taken of. I hope the Hon. Minister will look into this matter also.

Another matter I wish to bring to the notice of the Hon. Minister is in regard to the various unions in the Postal Department. The Hon. Minister is reported to have made a statement, which I saw in the press, saying that there are far too many unions and it is not possible to deal with so many unions ; he had said that he would prefer if they all formed one union, and so on. I must say that many of the workers who belong to those unions work under what I would call abnormal conditions. Some of them probably get a little more than what they should get when compared with what others get, but, by far and large, the majority of them are forced to work under very trying circumstances. Their duties make them go out in all types of weather. They are open to all types of risks and, I must say, their demands are in most cases fair and reasonable. To attempt not to settle these demands merely because " there are too many unions " and on the ground that one does not know which union to deal with, is not going to solve the problems.

These are essential services which must always be looked after well because the community at large depends to a great extent on the efficient running of these services. I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]

would like to know from the Hon. Minister whether he has now been able to bring about some co-ordination among these unions with regard to the demands put forward by them, whether he is conducting any negotiations with them or whether he is prepared to consider their demands at all. Some of the champions of these demands—the erstwhile champions of these demands—are no longer with them, but that is no reason for us to be complacent. If the demands are just and fair, irrespective of who champions them, it is my belief that those demands should be granted.

I also want to take up the question of temporary services in the Postal Department. There are various types of temporary and casual services such as sub-post masters and substitute delivery peons—a whole host of them. It is time that something was done about this matter. In this department there are temporary employees who have been working for long periods of time and who due to some mishap or other cannot continue to do so and so have nothing to look forward to in the future. I would ask the Hon. Minister to at least give such employees some form of preference when vacancies in the department are filled. If you say that for any particular post the minimum qualification is S. S. C., then, let a person who has served in the department as a temporary or casual worker for a certain period, though he may not have the necessary qualification but has something close to it, say, J. S. C., be given some form of concession. I am aware that this question of employing casual and temporary workers has been taken up by the Hon. Minister of Finance, but I find that it has not been in any way effective in this Ministry. I would like to know whether casual and temporary employees in this Ministry are now being made permanent. I would like a categorical answer from the Hon. Minister, because the Hon. Minister of Finance has given a ruling on this. I would like to know how far this ruling has been given effect to in this Ministry.

අ. භා. 5.32

**අමරානන්ද රත්නායක මයා.** (පස්සර)
*(திரு. அமரானந்த ரத்னாயக்க—பஸ்ஸறை)*
(Mr. Amarananda Ratnayake—Passara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 20 වැනි ශත වර්ෂයේ සිටින අපට අපේ කටයුතු ඉතා ඉක්මනින් කර ගන්නට ඕනෑ. නමුත් ටෙලිෆෝන් සේවයේත්, තැපැල් සේවයේත් දුර්වලතාවක් තිබෙනවා නම් අපට අපේ කටයුතු එසේ ඉක්මනින් කර ගන්නට බැරි වෙනවා. මේ සේවා දෙක දුර්වල නම් අපේ කටයුතු ටිකින් ටික හෝ පස්සට යනවා. මේ සභාග ආණ්ඩුව තැපැල් කටයුතු සඳහා වෙනම ඇමතිවරයකු පත් කිරීම ගැන මා ඉතාමත් සන්තෝෂයි. මෙසේ කිරීම නිසා ඒ ඇමතිවරයාට තමාගේ සම්පූර්ණ කාලය මේ අංශය දියුණු කිරීම සඳහා පමණක් යොදන්නට පුළුවනි. නව ඇමතිතුමා මේ රටේ තැපැල් සේවය හා ටෙලිෆෝන් සේවය දියුණු තත්ත්වයකට ගෙන ඒමට ක්‍රියා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා. මේ තාක් තැපැල් සේවය වෙනත් අමාත්‍යාංශයක කොටසක් වශයෙන් තිබීම නිසා මේ අංශයට වැඩි සැලකිල්ලක් ලැබුණේ නැහැ. තවමත් මේ අංශය නොදියුණු තත්ත්වයක පවතින්නේ ඒ නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ටෙලිෆෝන් සේවාව ගැන ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකුම කරුණු ඉදිරිපත් කළා. ගාල්ල, බලපිටිය, උඩුනුවර, අනුරාධපුරය, යන කොයි ප්‍රදේශවලත් ටෙලිෆෝන් සේවාව දුර්වල තත්ත්වයක තිබෙන බව මීට පෙර කරන ලද කථාවලින් අපට පැහැදිලි වුණා. ටෙලිෆෝන් සේවාව දුර්වල වී තිබීම ගැන නිලධාරීන් කැඳවා විශේෂ සාකච්ඡාවක් පවත්වා ඒ සම්බන්ධයෙන් කටයුතු දැ තීරණය කොට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැබිනට් මණ්ඩලයෙන් විශේෂ අවසරය ලබාගෙන අවශ්‍ය මුදල් නිසි පරිදි වියදම් කරමින් මේ සේවය දියුණු කරන ලෙස මා අලුත් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙසේ කිරීම මේ රටට කරන සේවයක් බව මතක් කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඌව පළාතේ සිට කොළඹට ටෙලිෆෝන් පණිවුඩයක් ගැනීමට පැය දෙක තුනක් ගත වෙනවා. වරප්‍රසාද ලැබූ පිරිසක් වූ මන්ත්‍රීවරුන්ටත් ඒ විධියේ තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වෙනවා නම් සාමාන්‍ය මිනිසුන්ට මුහුණ පාන්නට සිදු වන තත්ත්වය කෙබඳු විය හැකිද? ඇත්තෙන්ම බදුල්ලේ සිට කොළඹට ටෙලිෆෝන් පණිවුඩයක් ගැනීම සඳහා පැය දෙකකටත් වැඩි කාලයක් ගත වෙනවා. සමහර විට මේ කාලය තුළ පස්සර සිට මෝටර් රථයකින් බදුල්ලට ගොස් වුව මනා කාරණය කරගෙන ආපසු එන්නටත් පුළුවනි. දැනට බදුල්ලේ සිට කොළඹ දක්වා තිබෙන්නේ ටෙලිෆෝන් මාර්ග දෙකයි. මෙය කිසි සේත්ම ප්‍රමාණවත් නැහැ. ටෙලිෆෝන් මාර්ග තුන හතරක් වත් බදුල්ලේ සිට කොළඹට තිබිය යුතුයි. එසේ වුණොත් තමයි, ඒ ප්‍රදේශයේ ජනතාවට මේ මගින් නියම සේවයක් සැලසෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන ප්‍රදේශයේ දුර බැහැර උප තැපැල් කාර්යාල දෙකකට පසු ගිය කාලයේදී ටෙලිෆෝන් සැපයීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම උප තැපැල් කාර්යාලයක් විවෘත කරන අවස්ථාවේදීම ඒ උප තැපැල් කාර්යාලයට ටෙලිෆෝන් සේවා පහසුකම්ද සැලසිය යුතුයි. මේ පිළිබඳව තීරණයකට බැස මුදල් වෙන් කොට ක්‍රියා කරනලෙස මා ඉල්ලා සිටිනවා. ඇත්තෙන්ම දියුණුව කරා ගමන් කිරීමට අප වීර්ය කරන අවස්ථාවේදී ඒ විධියට ක්‍රියා කිරීම අවශ්‍යයි.



මැදවලගම "බී" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයක් තිබෙනවා. හදිසි පණිවුඩයක් ගෙන යෑම සඳහා මේ තැපැල් කාර්යාලයේ සිට සැතපුම් හතක් පයින් ගමන් කරන්නට සිදුවී තිබෙනවා. මේ තැපැල් කාර්යාලයට ටෙලිෆෝන් පහසුකම් නොමැති වීම ලොකුම පාඩුවක් වී ඇති හෙයින් හැකි තරම් ඉක්මනින් මේ ස්ථානයට ටෙලිෆෝන් පහසුකම් සපයන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. "සී" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයකින් සේවයක් නොවන තරමයි. "සී" ශ්‍රේණියේ තැපැල් කාර්යාල තිබෙන්නේ දුර බැහැර ප්‍රදේශවලයි.

ඒ "සී" ශ්‍රේණියේ තැපැල් කාර්යාල ඇති ප්‍රදේශවල, මහජන ආධාර ලබා ගන්නා අය—සාමාන්‍ය ව්‍යවහාර වචනයෙන් කියනවා නම් පිං පඩි ලබා ගන්නා අය—20ක් 30ක් පමණ ඉන්නව. යන්න එන්න බැරි තත්ත්වයක සිටින ඒ උදවිය තමන්ට ලැබෙන රුපියල් පහ, දහය, හෝ පහළොව ලබා ගැනීම පිණිස නගරයේ ඇති තැපැල් කාර්යාලයට යන්න ඕනෑ. එම නිසා මහජන ආධාර ලබා ගන්නා උදවියට ඒවා "සී" ශ්‍රේණියේ තැපැල් කාර්යාල වලින් ලබා ගැනීම පිණිස නීති රීති සංශෝධනය කරනවා නම් ඉතාමත් හොඳය කියා මා කල්පනා කරනවා. එපමණක් නොව, සාමාන්‍යයෙන් ගම් ප්‍රදේශවලට අවශ්‍ය සියලුම සේවාවන් ලබා ගැනීමට නීති රීති සකස් කරනවා නම් හොඳයි. ඒ වාගේම ප්‍රදේශයේ ගුරු මහත්වරුන් කීප දෙනෙක් ඉන්නවා. ඒ අයට නියම වෙලාවට පඩි ගන්න ක්‍රමයක් නැහැ. එම නිසා ගමක උප තැපැල් කාර්යාලයක් තිබෙනවා නම් ඒ අවශ්‍යතාවන් සියල්ලම ඉටු වන විධියට කටයුතු කරන්න ඕනෑ. "සී" ශ්‍රේණියේ වේවා, "බී" ශ්‍රේණියේ වේවා, "ඒ" ශ්‍රේණියේ වේවා, ගමේ පිහිටි ඒ ඕනෑම වර්ගයක උප තැපැල් කාර්යාලයකින් කරන්නට පුළුවන් අත්‍යවශ්‍ය සේවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

වන් ඉටු කර ගැනීමට හැකි වන සේ නීති රීති සකස් කරන ලෙස මම විශේෂයෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ආරවකුඹුර, ආගරවාතැන්න, මාරියඇද්ද සහ මීදුම්පිටිය යන ගම්වල පිහිටි උප තැපැල් කාර්යාල සම්බන්ධයෙන් මගේ ඉල්ලීම බල පාන බව සඳහන් කරන අතර, ඒ තැපැල් කාර්යාලවලින් මා කලින් සඳහන් කළ ගම්වලට අවශ්‍ය සියලුම සේවාවන් ඉටු කරවා දීමට ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ප්‍රදේශවලට කිට්ටුම උප තැපැල් කාර්යාලය පිහිටා තිබෙන්නේ හැතැප්ම පහක් පමණ ඈතිනුයි. ජනගහනය අතින් බලන විටත් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. තවත් ස්ථාන තිබුණත් ඉතාමත් අවශ්‍ය ස්ථාන හතරක් පමණයි මම සඳහන් කෙළේ. ඒ ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා මම නැවතත් ඉල්ලනවා.

ඊළඟට තවත් වැදගත් කරුණක් නම් මදුල්සිමා උප තැපැල් කාර්යාලය කෙදිනකවත් සිංහලෙන් විදුලි පණිවුඩ භාර නොගැනීමයි. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වී තිබෙනවලු. නමුත් එතැන සිටින ස්ථානාධිපති තැන ද්‍රවිඩ මහත්මයෙක් නිසා සිංහල මහජනතාවට අවශ්‍ය විදුලි පණිවුඩ සිංහලෙන් යවන්න ඉඩක් නැහැ. මදුල්සිමා උප තැපැල් කාර්යාලයට යැවීම පිණිස බදුල්ලෙන් සිංහල විදුලි පණිවුඩ භාර දුන් අවස්ථාවලදී කියන්නෙ මදුල්සිමා උප තැපැල් කාර්යාලය සිංහලෙන් භාර නොගන්නා බවයි. මෙය පුදුම සහගත වැඩක්. දිස්ත්‍රික් සුපර්වයිසර් මහත්මයත් පුදුම මනුෂ්‍යයෙක්. මේ ගැන පැමිණිලි කළාට කිසිම උනන්දුවක් දක්වන්නෙ නැහැ.

ඒ වාගේම මැටිගහතැන්න උප තැපැල් කාර්යාලය ගමේ මධ්‍යස්ථානයකට ගෙන යන්නය කියා අවුරුදු තුනක් තිස්සේ එම

පරිපූරක මුදල්

මහජනතාව ඉල්ලනවා. අභ්‍යන්තර හා බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ වැඩ බලන ඇමතිතුමා කලින් තැපැල් උප ඇමති වශයෙන් සිටි කාලයේ දී එතුමා ඒ ස්ථානයට එක් කරගෙන ගොස් ඒ ගමේ මහජනතාව විඳින හිරි හැර කරදර පෙන්වා දුන්නා. ඒ ගැන වග විභාග කරන්න යන පරීක්ෂකවරුන් පුදුම මිනිස්සු. ඒ මහත්වරුන්ට ඒ තැපැල් ස්ථානාධිපති තැන හොඳ සැලකිල්ලක් දක්වනවාය කියා මට ආරංචියි. ඒ නිසා මහජනතාව විඳින හිරි හැර ගැන ඒ පරීක්ෂකවරු හරි හැටි රපෝර්තු එවන්නෙ නැහැ. සථිර ලේකම්තුමාටත් මේ ගැන දන්වා තිබෙනවා. ඒ නිසා මැටිගහතැන්න උප තැපැල් කාර්යාලය ගමේ මධ්‍යස්ථානයක පිහිටුවීම සඳහා ක්‍රියා කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් නැවතත් වරක් ඉල්ලා සිටිනවා. එම ගම්වැසියන්ගේ ඉල්ලීම සාධාරණය කියා බදුල්ලේ දිසාපතිතුමාත් පස්සර ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරීතුමාත් සඳහන් කර තිබෙනවා. ඒ නිසා ඒ කාරණය ගැන ඉතාමත් ඉක්මනින් කටයුතු කරන ලෙස ගෞරවයෙන් ඉල්ලනවා.

පෞද්ගලික ටෙලිෆෝන් ලබා ගැනීම සඳහා බදුල්ල, පස්සර කීප දෙනෙක්ම ඉල්ලා තිබෙනවා. සමහර අය මුදල් පවා බැඳ තිබෙනවා. පෞද්ගලික ටෙලිෆෝන් දීමේදී විශාල දූෂණ සිදු වෙනවා. ඒ දූෂණ කෙරෙන බව මම දන්නවා. මම නම් ගම් කියන්න යන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ ටෙලිෆෝන් එකක් ඉල්ලා එක් තැනැත්තෙක් මුදල් පවා බැන්ද. නමුත් අවුරුද්දක් පමණ කල් ගත වීත් එය ලැබුනේ නැහැ. ඒ අතර ඒ ප්‍රදේශයේ තැපැල් කාර්යාලයේ කෙනෙක් ගිහින් ඒ මුදලාලි හමු වී අසවල් විදියේ සැලකිල්ලක් කළොත් ටෙලිෆෝනයක් ඉක්මනින් ලබාගන්න පුළුවන්යයි කියා තිබෙනවා. ඒ විදියේ විශාල දූෂණ සිදු වෙනවා. ඔවුන්ට සැලකිල් ලෙස නොකෙරුණොත් අසවල් දේ නැත, කම්බි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත, යනාදිය කියා පමා කරනවා. හැබැයි, යම් කිසි විදියක සංග්‍රහයක් කළොත් ඉක්මණින් ලබාගන්න පුළුවනි. ඒ නිසා මේ ගැන විභාගයක් පවත්වා ඒ ප්‍රදේශවාසීන්ට කරදරයක් නැතිව ටෙලිපෝන් ලබා ගැනීමට විධිවිධාන සලස්වන මෙන් මම ඉල්ලා සිටිනවා.

උප තැපැල් ස්ථානාධිපතිවරුන් වෙනුවෙන් මීට වඩා සැලකිල්ලක් දැක්විය යුතු යයි ගරු මන්ත්‍රීවරුන් විසින් කරන ලද ඉල්ලීම ගැන මාත් එකඟ වෙනවා. ඔවුන්ට ලැබෙන මුදල හොඳටම මදි. මගේ මිත්‍ර මහත්මයෙක් සිටිනවා, උප තැපැල් ස්ථානාධිපති කෙනකු හැටියට. ඔහු ඉල්ලා අස්වෙන්න වුවමනායයි මා සමඟ කිව්වා. මන්ද? ලැබෙන රුපියල් 75 හොඳටම මදි නිසයි. ඒ රුපියල් 75 න් 15 ක් ගෙවල් කුලී වශයෙන් ගෙවන්න ඕන. හදිසියක දී අසනීප වුවොත් වැඩ බලන තැනැත්තාට රුපියල් 10 ක් 15 ක් ගෙවන්න ඕන. මාසෙ අන්තිමට බැලුවාම ඔහුට ඉතුරු වන දෙයක් නැහැ. හැබැයි, සමහර උප තැපැල් කාර්යාලවල ස්ථානාධිපතිවරුන්ට මාසෙකට රුපියල් 700, 600, 500 ආදී වශයෙන් ලැබෙනවා. සමහර විට ඒ අයට වැඩ වැඩි ඇති. ඒ අතර විශාල තැපැල් කන්තෝරුවල ස්ථානාධිපතිවරුන්ටත් ඒ තරම් මුදලක් නොලැබෙන තැන් තිබෙනවා. ඒ නිසා මේ ගැන සොයා බලා නියම පඩි ක්‍රමයක් ඔවුන් වෙනුවෙන් සකස් කරන මෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඔවුන් විශ්‍රාම ගන්න විට යම් කිසි සහනදායක වැඩ පිළිවෙලක්ද තිබිය යුතු බව ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කිරීමට කැමතියි.

මා දීර්ඝ වශයෙන් කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ කරුණු ඉදිරිපත් කිරීමට මට අවස්ථාවක් දීම ගැන තමුන්නාන්සේට ස්තුතියි.

අ. භා. 5.45

**ටී. විලියම් ප්‍රනාන්දු මයා.** (නුවරඑළිය)

*(திரு. ரி. வில்லியம் பெர்னாண்டோ—நுவரெலியா)*

(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා වූයේ රජයේ විදුලි සන්දේශ අංශය ගැනයි. තවමත් ටෙලිෆෝන් සේවාව පෞද්ගලික සමාගමක් මඟින් පවත්වා ගෙන යන කොට්ඨාශයක් ලංකාවේ තිබෙන බව ප්‍රකාශ කිරීමට සිදු වී තිබෙන්නේ කනගාටුවෙනුයි. නුවරඑළිය කොට්ඨාශයට අයත් තලවාකැලේ, ආගරපතන, පිලිකුල්ව්රි, ඩයගම, දිඹුල, ආදී ප්‍රදේශවලට ඇත්තේ වෝකර් ඇන්ඩ් ග්‍රීග් සමාගම මඟින් පවත්වාගෙන යන ටෙලිෆෝන් සේවයක්. ඒ සමාගම මඟින් පවත්වාගෙන යන එම සේවය සඳහා ඇත්තේ ලෝකයේ ටෙලිෆෝන් සේවය ආරම්භ වූ අවධියේ තිබුණු උපකරණයි. අනික් සෑම ප්‍රදේශයකම වාගේ රජයේ ටෙලිෆෝන් සේවාවන් තිබියදී මේ ප්‍රදේශයේ පමණක් මෙවැනි පෞද්ගලික සේවාවක් තිබීම යෝග්‍ය නැති බව ඇමතිතුමා පිළිගන්නවා ඇති. කොළඹ ආසන්න ප්‍රදේශවල තිබෙන තත්ත්වය නරක නම් පෞද්ගලික සමාගමක් මඟින් ඉතා පැරණි උපකරණ යොදා පවත්වාගෙන යන සේවාවෙහි තත්ත්වය ගැන මා කිය යුතු වන්නේ නැහැ. එම සේවයෙන් හරියට වචන පැහැදිලිව ඇසෙන්නේවත් නැහැ. එය ඉතාමත් දුර්වල තත්ත්වයකයි තිබෙන්නේ. ඒ නිසා අනික් ප්‍රදේශවල මෙන් මේ ප්‍රදේශයේද එම සේවාව රජයේ සේවාවට සම්බන්ධ කර රජයෙන් පවත්වාගෙන යන මෙන් මම ඉල්ලා සිටිනවා. මා හිතන හැටියට අවුරුදු කීපයකට පෙර තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව ඒ සඳහා එහි ඉඩම් පවා වෙන් කරවා තිබෙනවා; නමුත් තවමත් එහි වැඩ ආරම්භ කර නැහැ. තවමත් වෝකර් ඇන්ඩ් ග්‍රීග් සමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ගමෙනුයි, එම සේවය පවත්වාගෙන යන්නේ. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. නුවරඑළිය කොට්ඨාශයේ ඉදි කිරීමට යෝජිත උප තැපැල් කාර්යාල කීපයක් තියෙනවා. දිස්ත්‍රික් සම්බන්ධික රණ කොමිටියෙදිත් ඒවාට ප්‍රමුඛත්වය දී තිබෙනවා. මහගස්තොට ගජබා පුරය, කඳපොල විජයබා පුරය, බෝගහවත්ත සහ කිරිමැටිය යනාදි ප්‍රදේශ ඒ ගණයට වැටෙනවා. එම ප්‍රදේශවල ජනගහනය ඉතා සීග්‍රයෙන් නැගීගෙන යනව, අළුත් ජනපද යෝජනා ක්‍රමය උඩ. මේ ප්‍රදේශවලට අවශ්‍ය උප තැපැල් කාර්යාල ඉතා ඉක්මණින් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

නුවරඑළි නගරය ඉතා දියුණු නගරයක්. එහි බොහෝ දෙනෙක් දුර කථන ඉල්ලා තිබෙනව. එම ඉල්ලීම් අප්‍රමාදව ඉටු කිරීමෙන් තමයි, රජයට බදු වශයෙන් මුදලක් ලැබෙන්නෙ. එක්තරා මහත්මයකුගෙ ඉඩමකට උඩින් විදුලි කම්බි ඇදීමට සිදු වී තිබෙන නිසා මෙම කාරණයෙහිදී විශාල අවහිරයක් ඇති වී තිබෙනවා. "ග්‍රෑන්ඩ් හොටේල්" එක පිටිපස්සෙන් පිහිටි යුරෝපිය මහත්මයෙකුට අයිති පෞද්ගලික ඉඩමක් උඩින් විදුලි කම්බි අදින්න දෙන්නෙ නැහැ. එම නිසා දුර කථන ඉල්ලා සිටින කාටත් අවහිරයක් වෙලයි තියෙන්නෙ. දැන් යෝජනා කර තිබෙනව එම හරියෙ පොළොව යටින් විදුලි කම්බි අදින්න. ඒ සඳහා රුපියල් 8,000 ක් පමණ වියදම් වේවි. එම මූලික වියදම දරා ඒ විදුලි කම්බි ඇද්දොත් විශාල කොටසකට දුර කථන ලබා දෙන්න පුළුවනි; ඒ මගින් ලොකු ආදායමක් ලබා ගන්නත් පුළුවනි. ඒ ගැනත් ඇමතිතුමාගෙ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

රජය මගින් සම්පූර්ණයෙන්ම පාලනය වන ටෙලිෆෝන් මාර්ග මේ රටේ තිබෙන අතර පෞද්ගලික සමාගම් මගින් පවත්වාගෙන යන මාර්ගද තිබෙන බව මා නැවත වරක් මතක්කරනව. හැකි තරම් ඉක්මණින් ඒවා රජයට පවරාගෙන ඒවා රජයේ අංශයටම ඒකාබද්ධ කරගෙන කටයුතු කිරීමට ලබන වර්ෂය තුළදී හෝ උත්සාහ දරන හැටියට ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 5.50

**එල්. ද එස් ඒ. ගුණසේකර මයා.** (කලවාන)

(*திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர—களவான*)

(Mr. L. de S. A. Gunasekera—Kalawana)

තැපැල් දෙපාර්තමේන්තුවෙ විදුලි සංදේශ අංශය සම්බන්ධ ව කරුණු ටිකක් ඉදිරිපත් කරන්න තියෙනව. ඉතාම පැරණි කාලයකට අයත්, යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන නිසා විදුලි පණිවුඩ අංශය අබලන් වී තිබෙන බවයි, හැම මන්ත්‍රීවරයෙකුගෙම අදහස වුණේ. පෞද්ගලික වශයෙන් හෝ වේවා, රජයේ දෙපාර්තමේන්තුවලට වේවා ටෙලිෆෝන් පණිවුඩයක් ලබා ගන්න වුව මනා වූ විට අපට පැය ගණන් බලා ඉන්න සිදු වී තිබෙන බව රහසක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවෙදි පමණක් නොවෙයි, ශ්‍රාවස්තියෙදිත් අපේ ෆේඩරල් පක්ෂයෙ මන්ත්‍රීවරුන් ටෙලිෆෝන් පණිවුඩයක් ඉල්ලුවාම —කොළඹ සිට යාපනයට, මඩකලපුවට හෝ කන්කසන්තුරේට හෝ වේවා ඉල්ලුවාම—එසේ ඉල්ලා සිටිනවත් සමගම "ටිකක් අල්ලාගෙන ඉන්න" නැතිනම් "Just hold the line" කියා විනාඩි දෙක තුනකදී ඒ අයට එම සේවාව ලබා දෙන බව අප දැක තිබෙනවා.

**එස්. එම්. රාසමානික්කම් මයා.** (පද්දිරිප්පු)

(*திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு*)

(Mr. S. M. Rasamanickam—Paddiruppu)

What is the reason for it? You must be annoying the telephone girls.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

ඒක තමයි මගේ ප්‍රශ්නය.

What is the reason ? That is why I am asking why preference is given to Federal M.Ps.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

You must be annoying the telephone girls.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

I know that at "Sravasti" whenever a Federal M.P. books a call, they say, "Just hold the line", and they get the line in three or four minutes. I do not know why. That is my point.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

The telephone girls are becoming Federalist-minded.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

You are enjoying by night.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

They must be avoiding you by night.—[*Interruption*]. Some people at "Sravasti" are very dangerous at night. That must be the reason why they avoid such people.

**සිරිල් මැතිව් මයා. (කොලොන්න)**
*(திரு. சிறில் மதியூ—கொலன்ன)*
(Mr. Cyril Mathew—Kolonna)

Your line is always engaged at night.



**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

I do not know whether my line is engaged or whether others' lines are engaged.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙපාර්තමේන්තු නිලධාරීන් දාවල් කාලයට වගේ රාත්‍රී කාලයට ටෙලිෆෝන් සේවාවක් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. එසේ තිබෙද්දීත් රාත්‍රී කාලයේ අපි ටෙලිෆෝන් පණිවුඩයක් ඉල්ලුවොත් පැයකට පැය එකහමාරකට ඒ ලයින් එක ලැබෙන්නෙ නැහැ. සමහරවිට දවාලටත් මේ අන්දමට සිදු වෙනව. දැනට අවුරුදු 1½ කට විතර උඩදී, ටෙලිෆෝන් පණිවුඩයක ආරවුලක් නිසා මට ටෙලිෆෝන් පණිවුඩ නොදී, මට විරුද්ධව රත්නපුර කාර්යාලයේ වර්ජනයක් ගෙන ගියා. ඒ සිද්ධිය ඇති වුණේ මෙහෙමයි. මා දිනක් "රජයේ ප්‍රමුඛ සේවා" ටෙලිෆෝන් පණිවුඩයක් උදේ 9.50 ට ඉල්ලුවා, රත්නපුරයේ සිට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට. එදා සෙනසුරාදා දිනයක්. සවස 2.10 ට මට ටෙලිෆෝන් කර මේ විධියට ඉංග්‍රීසියෙන් කිව්ව: "432, 432, 2244 is ringing, no answer; shall I cancel the call ?" මගෙන් ඇහුවෙ ඔය විධියටයි. මම ඒ අවස්ථාවේදී මෙහෙම ඇහුව: "Can you please just tell me the time that I booked the telephone call ?" එවිට මට කිව්ව: "No use of of the time that you booked the call, 2244 is ringing, no answer; shall I cancel the call ?" එවිට මා කිව්ව: "This is the M. P. for Kalawana speaking, can you tell me the time I booked the call ? මා ඒ අවස්ථාවෙ ඇසුව "මම කෝල් එක ඉල්ලා සිටියෙ උදේ 9.50 ටයි, දැන් 2.10 යි ප්‍රමාද වුණේ ඇයි" කියා. එවිට කියනව: "You are not the only person who has booked 'official' private calls. There are so many others."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

එදා සෙනසුරාදා දිනයක්. ඔය කථාව උඩ මට දවස් ගණනක් "කෝල්" දුන්නෙ නැහැ. පිටින් එන ඒවවත් දුන්නෙ නැහැ. පසුව ඒ පිළිබඳව විභාගයක් කළා. මොනව උනාදැයි මා දන්නෙ නැහැ. දන්නම් රත්නපුර කාර්යාලයෙන් පුද්ගලිකව මට යහපත් සේවයක් ලැබෙනව. විභාගයේ ප්‍රතිඵල ගැන ඒ නිසා මා සොයා බැලුවෙ නැහැ. රත්නපුර මහ කන්තෝරුවේ සිට මගේ ගෙදරට හැතැප්ම භාගයකට වඩා දුර නැහැ. එහෙත් දවස් 10 ක් විතර මගේ ටෙලිෆෝන් එක ක්‍රියා විරහිතව තිබුණා. එය ක්‍රියා විරහිත වුණේ සෙනසුරාදා දිනකයි. ඊට පසු සඳුදා මා ටෙලිෆෝන් කර කියන තුරු ඒක අලුත්වැඩියා කළේ නැහැ. එහෙත් අපට ටෙලිෆෝන් ලබා දී තිබෙන්නෙ, රජයේ ප්‍රමුඛ සේවා වශයෙන්. දුර ප්‍රමාණය හැතැප්ම ½ කට වඩා වැඩි නැහැ. මෙයට හේතුව මේකයි. විදුලි කම්බි ඇද තිබෙන පාර දෙපස රබර් ගස් කොස් ගස් ආදී නොයෙකුත් ගස් වර්ග තිබෙනව. ඒවා කපා එළි කර නැහැ. විශේෂයෙන්ම ඉඩම් හිමියන්ගේ බලපෑම උඩ රබර් ගස් කපන්නෙ නැහැ. ඒ නිසා සමහර අවස්ථාවල කෝටු කෑල්ලක් විදුලි කම්බියක රුඳී තිබුණොත් "කෝල්" එකක් ගන්නට බැරි වෙනව. එවිට ඒ ලයින් එක ක්‍රියා විරහිත වෙලාය කියනව. ඒ නිසාම කම්කරුවනුත් වැඩිපුර ගන්නට සිදු වෙනව. අර ගස් කපා දමනවා නම් හුඟක් දුරට මේ කරදර මඟ හැරෙනව.

මට රාජකාරි ටෙලිෆෝන් එකක් ගවරගිරියෙ තැපැල් කන්තෝරුවෙන් දුන්නා. ඒ අවස්ථාවේදී බොහොම අපහසුකම් කියා හිටියා. මෙතරම් ගස් කපන්නට ඕනෑ, මෙතරම් වියදම් කරන්නට ඕනෑ, කියා කිව්වා. නමුත් ටෙලිෆෝන් සේවය ලබා දුන්නා. ගස් කැපීම ආදිය සඳහා එක වුන්ට් හැදුවා. මෙපමණ මුදලක් ඕනෑය, මෙපමණ ප්‍රමාණයක් වියදම් වෙනවාය, කියා කිව්වා. නමුත් ඒ එක ගහක්වත් තවම කපා නැහැ. කලවානේ සී. ආර්. බී. කන්තෝරුවට ටෙලිෆෝන් තිබෙනවා, පොලිසියට තිබෙනවා, ගවරගිරියේ තැපැල් කන්තෝරුවට තිබෙනව. ඒ ටෙලිෆෝන් මාසයකට දවස් තුනක්වත් වුවමනා විධියට පාවිච්චි කරන්න පුළුවන් තත්ත්වයක නැහැ. එයට හේතුව අවට තිබෙන රබර් ගස්වල අතු නොකපා තිබීමයි. ටැලිෆෝන් සේවාව වැනි සේවයක් කලවාන වැනි නොදියුණු ගම්බද පළාත්වලට තිබෙන්නටම ඕනෑය කියා අපි බලාපොරොත්තු වෙනව. නමුත් වර්ග සැතපුම් දෙසිය ගණනක් තිබෙන කලවාන කොට්ඨාශය වැනි කොට්ඨාශයක තවම තැපැල් කන්තෝරු තුනකට පමණයි ටෙලිෆෝන් සේවාව තිබෙන්නෙ. සාමාන්‍ය විධියටවත් තිබෙන්නෙ එයින් දෙකකට පමණයි. අනික හැතැප්ම 4½ කට එහා තිබෙන තැපැල් කන්තෝරුවකට සම්බන්ධයි. මෙතන ටෙලිෆෝන් එක ඉස්සූ විට හැතැප්ම 4½ කට එහා තිබෙන තැපැල් කන්තෝරුවේ වදින්න ඕනෑ. ඊට පසුව එතනිනුයි ගන්නට පුළුවන් වන්නෙ. එහෙම නැතිව ඉලක්කම් කරකවා "කෝල්" එකක් ගන්නට බැහැ. එවැනි ටෙලිෆෝන් එකක් තමයි ගවරගිරියට ලබා දී තිබෙන්නෙ. ඒ නිසා ටෙලිෆෝන් සේවාවලින් නගරබද අයට ලබා දී තිබෙන පහසුකම් කලවාන වැනි ප්‍රදේශවල ජීවත් වන අපත් බලාපොරොත්තු වෙනව. ගම්බදවත් සිටින්නෙ මිනිස්සු; නගරවලත් සිටින්නෙ මිනිස්සු. සෑම මිනිහෙකුටම එක හා සමානව සලකනවා නම්, විශේෂයෙන් නගරබද අයට හැම වරප්‍රසාදයක්ම ලබා දී තිබෙන්නෙ ඇයි? ලියුම් බෙදීම හොඳට තිබෙනවා; හොඳ අංග සම්පූර්ණ තැපැල් කාර්යාල තිබෙනවා; ලියුම් බෙදන්නපියන්වරු සිටිනවා; ටෙලිෆෝන් සේවාවන් හොඳට තිබෙනවා; වාහන පහසුව තිබෙනවා; ආරෝග්‍යශාලා පහසුව තිබෙනවා; ඔය ආදී පහසුකම් තිබෙනවා. කලවාන වැනි ගම්බද පළාත්වලට ඒ කිසි එකක් නැත්තේ ඇයි? ඒ නිසා අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන් අපට හොඳ ටෙලිෆෝන් සේවයක්වත් ලබා දෙන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. වර්ග සැතපුම් දෙසිය ගණනක් තිබෙන මේ කොට්ඨාශයේ මහජනයා ජීවත් වන්නේ ඉතා දිළිඳු තත්ත්වයකින්. වාහන පහසුකම් නැහැ. පාරවල් නැහැ. ඒ නිසා අඩු වශයෙන් ටෙලිෆෝන් සේවා පහසුකම්වත් අපිට ලබා දෙන්න.

වැද්දාගම තැපැල් කන්තෝරුවට ටෙලිෆෝන් පහසුකම් දෙනවාය කියා පොරොන්දු වුණේ 1960 අවුරුද්දෙයි. නමුත් තවමත් අපි ටෙලිෆෝන් බලාපොරොත්තුවෙන් ඉන්නව. තවමත් ඒ ටෙලිෆෝන් පහසුකම් දී නැහැ. පොතුපිටියෙ ආරෝග්‍යශාලාවටත් ටෙලිෆෝන් සේවයක් නැහැ. ඇත්ත වශයෙන්ම ටෙලිෆෝන් පහසුකම් නැති ආරෝග්‍යශාලාවක් ලංකාවේ තිබෙනවා නම් එය තිබෙන්නේ කලවාන කොට්ඨාශයේය කියා මා මතක් කරන්ට සතුටුයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
නැහැ, නැහැ, තව තියෙනව.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)
පොතුපිටියෙ ආරෝග්‍යශාලාවට තවමත් ටෙලිෆෝන් සේවයක් ලබාදී නැහැ. එවැනි ස්ථානවලටවත් ටෙලිෆෝන් පහසුකම් සැලසීම දෙපාර්තමේන්තුවෙ යුතුකමක්. විශේෂයෙන්ම දැනට අවුරුදු හතරකට පමණ පෙර සැතපුම් 10 කට වැඩි දුරක් පයින් යන්න තිබුණ ඒ ආරෝග්‍යශාලාවට යන්න. නමුත් තවමත් ඊට ටෙලිෆෝන් සේවාවක් ලබාදී නැහැ. ඒ වාගේම දෙල්ගොඩ කොලනියෙ තැපැල් කාර්යාලයක් තිබෙනව. රාජ්‍ය වැවිලි මණ්ඩලයෙ කර්මාන්තශාලාවකුත් දෙල්ගොඩ තිබෙනව. කරුණා කර මේවාට ටෙලිෆෝන් පහසුකම් ලබා දෙන්න.

විශේෂයෙන්ම කලවාන වැනි ප්‍රදේශවල ටෙලිෆෝන් සේවය අඩපන වුණාම ඒවා නැවත සකස් කිරීම දවස් ගණන් ප්‍රමාද වන්නෙ මොන හේතුවක් නිසාද කියා මා රත්නපුර ශාඛාවෙ විදුලි සන්දේශ භාර නිලධාරී මහත්මයාගෙන් ඇසුව. ඒ අවස්ථාවේදී ඒ මහත්මයා කියා සිටියේ, කලවාන කොට්ඨාශයටය කියා අපිට වෙන මම කෙනෙක් පත් කරන්න පුළුවන් කමක් නැත, මක්නිසාද, කෙනෙකු පත් කරන්න නම් ඒ පැත්තට ටෙලිෆෝන් දහයකට වැඩි ගණනක් තියෙන්න ඕනෑ කියායි. ඇත්ත වශයෙන්ම ඒ කොට්ඨාසවලට ටෙලිෆෝන් දහයක්වත් නැහැ. ඒ නිසා පියුන් කෙනෙකුවත් දමන්න බැහැ. ඒ ටෙලිෆෝන් මාර්ගයක් අබලන් වුණොත් රත්නපුරයෙන්, ඇලෙන් නැත්නම් කිරිඇල්ලෙන් කවුරුහරි එනතුරු බලාගෙන ඉන්න ඕනෑ. ආදායම් පාලක නිලධාරීතුමාගෙ කාර්යාලයෙන් මාසෙකට දවස් දෙකක්වත් ටෙලිෆෝනයෙන් වැඩක් කරගන්න බැහැ. ඇයි, ටෙලිෆෝනය ගත්තොත් කියනව, Out of order කියා. පොලීසියෙත් තත්ත්වය ඒ විධියයි. ඇත්ත වශයෙන්ම සමහර ස්ථානවල ටෙලිෆෝන් යන්ත්‍ර අයින්කර ගත්තා. කලවාන පළාත් පාලන ආයතනයෙ, වී. සී. කාර්යාලයෙ, ටෙලිෆෝන් එකක් තිබුණා. අනේ අපට මේකෙන් වැඩක් නැහැ, මේක ආපසු ගන්නය කියා එය ආපසු භාර දී තිබෙනව. ඒ නිසා විශේෂයෙන්ම මේ ගැන සොයා බලන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. කොමිසමක්වත් පත් කර මේ ගැන සොයා බලන්න. මේ ටෙලිෆෝන් දෙන්න ඒ අය කළ ඇස්තමේන්තු අරන් බලන්න. මේ මේ මාර්ගවල මේ මේ ගස් කපන්න තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

වාය, මේ මේ අවහිර තිබෙනවාය, ඒ නිසා මෙපමණ වියදමක් යනවාය කියා කළ ඇස්තමේන්තු ගෙන බලන්න. ඒ ඇස්තමේන්තුවල මුදල් වියදම් කර තිබෙනවාද කියා බලන්න. මොන ක්‍රමයකට මේවා දුන්නාද කියා මා දන්නෙ නැහැ. ගවරගිරි යට ටෙලිෆෝන් මාර්ගය දමනා අවස්ථාවෙ මේ මේ ගස් කැපිය යුතුය කියා ලකුණු කළා. නමුත් ඒ ගස් එකක්වත් කපා නැහැ.

ඒ වාගේම පෞද්ගලික අංශයෙන් බොහෝ දෙනෙක් ටෙලිෆෝන් ඉල්ලා සිටින බව මා දන්නවා. අවුරුදු දෙක තුනක සිට නොවෙයි, අවුරුදු දහයක දොළහක සිටම ටෙලිෆෝන් බලාපොරොත්තුවෙන් දහස් ගණන් කොළඹ සිටින බව අපි දන්නවා. නමුත් මට කොළඹ සම්බන්ධයෙන් නොවෙයි, මගේ ප්‍රදේශය සම්බන්ධයෙනුයි වැඩි කැක්කුමක් තිබෙන්නෙ. අපේ රත්නපුර දිස්ත්‍රික්කය ගැනයි කැක්කුමක් තිබෙන්නෙ. රත්නපුරේ සමහර රජයේ කාර්යාලවලට පවා ටෙලිෆෝන් සේවයක් නැහැ. නමුත් මාස හත අටකට පෙර ඇමූ සයිවර් කඩවලට නම් ටෙලිෆෝන් දී තිබෙනවා. රත්නපුරේ තැපැල් කන්තෝරුව ඉස්සරහ සයිවර් කඩේ බිහිවී මාස හත අටකට වඩා නැහැ. නමුත් ටෙලිෆෝන් එකක් දී තිබෙනවා. වඩේ, තෝසෙ තියෙන කඩේට, ටෙලිෆෝන්. ඒ වුණාට ආණ්ඩුවේ කාර්යාලවලට ටෙලිෆෝන් සේවය ලබා දී නැහැ. මෙන්න මේවා ගැන දැන ගන්න ලැබීම කනගාටුදායකයි. රත්නපුරයේ ටෙලිෆෝන් සේවය අඩපණ වෙන්න හේතුව මොකක්ද කියා ඇහුවම ලැබුණු පිළිතුර අවුරුදු තිහකට හතළිහකට ඉස්සර වෙලා ගෙනා මැෂින් එකක් පාවිච්චි කරන නිසාය කියන එකයි. ටෙලිෆෝන් නොම්මරයක් ඉල්ලන්නෙ බින්දුවයි, එකේ ඉලක්කමයි කරකවලයි. ඒ ඉලක්කම් දෙක කැරකෙව්වම බල්බ් එක පත්තු වෙන්නෙ නැතිලු යන්ත්‍රය පරණ නිසා. මේ ගැන සොයා බලා රත්නපුරයට අලුත් මැෂින් එකක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අලුතින් තැපැල් කන්තෝරු විවෘත කිරීම නතර කර තිබෙනවය කියා මට දැන ගන්න ලැබී තිබෙනවා. එවැනි තීරණයක් ගත්තෙ කුමන හේතුවක් නිසාදැයි මං දන්නෙ නැහැ. තව තවත් තැපැල් කන්තෝරු වුවමනා කරනවා. ඇයි අලුතින් තැපැල් කන්තෝරු විවෘත කිරීම නතර කළේ ?

**ඒ. සී. එස්. හමීඩ් මයා.** (අකුරන දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. ஸீ. எஸ். ஹமீத்—அக்குறணை இரண்டாம் அங்கத்தவர்)*

(Mr. A. C. S. Hameed—Second Akurana)

ඒක බොහොම වාසි වැඩේ. තව තවත් ඉල්ලන්න ඕනෑ.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**

*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*

(Mr. L. de S. A. Gunasekera)

ඔව්, අපි දන්නවා මරික්කාර් උන්නැහෙත් තැපැල් කන්තෝරු අරින්න බොහොම සමර්ථ කෙනෙකු හැටියට ප්‍රසිද්ධ බව.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

මරික්කාර් මහත්මයා අපේ කාණ්ඩාය මෙ කෙනෙක් නොවෙයි. උන්නැහේ එස්. එල්. එෆ්. පී. එකේ හිටපු කෙනෙක්. අපෙ පක්ෂයේ නොවෙයි.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**

*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*

(Mr. L. de S. A. Gunasekera)

ඒ වුණාට සිංහලයෙක් නොවෙයි ; තම්බියෙක්. තමුන්නාන්සෙගෙ ජාතියට අයිති කෙනෙක්.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

කවුරු වුණාම මට මොකද ඉතින් ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)
Order, please !

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)
Mr. Marikkar belongs to the S. L. F. P.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)
And he belongs to your race.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)
How many people in your party got caught to the Bribery Commission. Do not make that sort of remark.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)
කරුණා කරල තමුන්නාන්සෙ වාඩි වෙන්න. අපට දැන් අල්ලස් කොමිෂම ගැන කථා කරන්න වුවමනාවක් නැහැ. මා කියන්නෙ නගරබද ප්‍රදේශවලට තව තවත් තැපැල් කන්තෝරු නුදුන්නට අපට කමක් නැති බවයි. කලවාන ඡන්දදායක කොට්ඨාශය වර්ග හැතැප්ම 247 ක් විශාලයි. මුළු කොට්ඨාශයටම තිබෙන්නෙ තැපැල් කන්තෝරු දෙළහක් පමණයි. "ඒ" ශ්‍රේණියේ තැපැල් කන්තෝරු දෙකකුත්, "බී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරු දෙකකුත්, "සී" ශ්‍රේණියේ තැපැල් කන්තෝරු අට කුත් පමණයි අපට තියෙන්නෙ. "සී" ශ්‍රේණියෙ ඒවා මොනවටද තියෙන්නෙ ? ඒවා උසස් කරන්නෙ නැත්තෙ ඇයි ? කොළඹ, නුවර, ගාල්ල වැනි ප්‍රධාන නගරවල් අවට අංග සම්පූර්ණ "ඒ" ශ්‍රේණියෙ තැපැල් කන්තෝරු මෙන්ම "බී" ශ්‍රේණියෙ තැපැල් කන්තෝරුත් පසු ගිය අවුරුදු හය හත ඇතුළත දී තිබෙන බව මට දැන ගන්න ලැබී තිබෙනවා. අංග සම්පූර්ණ තැපැල් කන්තෝරු තිබෙන ප්‍රදේශ වලටම තව තවත් උප තැපැල් කන්තෝරු දෙන නමුත් නොදියුණු ප්‍රදේශවලට නියම සේවයක් දෙන්නෙ නැහැ. තැපැල් පහසු කම් වැඩි වැඩියෙන් අපට වුවමනා කරනවා. මේ සේවය ලාභයක් බලාපොරොත්තුවෙන් කළ යුත්තක් නොවෙයි. මහජන සේවයක් කරන්න බලාපොරොත්තු වෙනව නම් ලාභය ගැන නොව සේවය ගැන කල්පනා කළ යුතුය කියායි මා කියන්නෙ. කලවාන කොට්ඨාශයට තවත් තැපැල් කන්තෝරු හතරක්වත් ලබා දෙන මෙන් ඉල්ලා සිටි මින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 6.11

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
Mr. Deputy-Speaker, the Member for Kalawana made an important revelation or confession.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)
It is a fact.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
He said that the Federal Party Members of Parliament get favourable treatment from the telephonists both in regard to their night calls as well as their day calls.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)
Especially for night calls.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
I am not surprised that the Member for Kalawana has not received this treatment. If the Federal Party Members have received any

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමාණික්කම් මයා.]

preference at all from the telephonists in the Central Telegraph Office, it must be really due to their decency and gentlemanly behaviour in the use of the lines because I can understand the Member for Kalawana disturbing the telephone girls during night and day and even harassing them to the point of striking.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

I have never had telephone calls at night.

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

So I am not surprised that he should have such complaints to make. But if he wants to get his calls quickly he should contact the Federal Party Members who will tell him the secret of it, that is, join the Federal Party.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

I never go after them and trouble them.

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

That is by the way. With regard to the Ministry of Posts, it deals with the day-to-day activities of the people. It is the one department which is most in contact with the people in their day-to-day life. So much so, it is not surprising that there should be criticism of the activities of the department, its shortcomings and even its inability to cope with the volume of work that it has to face.

It is easy to criticise but still I am not really going to pay them a compliment as such. But I must say there is one fact that must be realized, namely, that the volume of work both in the telecommunications section and in the postal section has increased by such leaps and bounds that the departments and the Ministry are unable to cope with the situation. So we should now sit and think of ways and means of not only modernizing and streamlining the administration but also providing labour-saving devices, the necessary personnel and equipment to deal with the situation adequately. I should think that that is the problem of the postal services.

About ten years ago, I think, we had almost half the number of telephones that we have today. Then the volume of traffic through the postal services was not so heavy as it is now. So that in reality we have got to face the new situation and find ways and means of meeting it. That, I think, is the task before the Minister.

The Posts and Telecommunications Department has two branches. One deals with the postal services ; the other, with the telecommunication and engineering services. I believe, of late, if I am informed correctly, there is a tussle going on between these two sections. There is non-cooperation and a lack of co-ordination between these two sections. That is one of the reasons why the postal and the telecommunication services have not been properly co-ordinated and administered efficiently. If I may say so, there is a difference of opinion as to whether the Post Master-General himself should control the engineering section or the engineering section should act independent of the Post Master-General. These two heads of departments have not been getting on well departmentally in that there is no co-operation between the engineering section and the postal section and its head. I think that is one of the reasons why there is a certain amount of inefficiency in the department. I have no doubt that if this aspect is tackled properly the Hon. Minister will be able to improve the service to some extent.

With regard to the telephone services I must agree with what many other hon. Members of this House

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

have said about inefficiency in the service. In the case of both local calls in places where no automatic systems exist and trunk calls, there is not only a delay but also a lack of courtesy on the part of those who operate the telephone services. Both long-distance and short-distance calls take so much of time that one could even motor up to the place one wishes to call and return before the call is put through.

A few days ago I wanted to put through a call from Kalawanchikudi to Kalmunai which is only a distance of about eight miles. It was an urgent call in which I wanted to contact the officer-in-charge of the Kalmunai station. I booked the call from the Batticaloa Post Office. It took me almost 1½ hours to get the call. It was only a matter of eight miles and one must appreciate and understand the annoyance and inconvenience caused by such delay to a Member of Parliament, who is always fighting for time when he is in his electorate, if he cannot get a call quickly.

The Hon. Minister may investigate these matters and see if the switch boards are inadequately staffed or if there is inefficiency in the post offices where telephone services are being operated.

It is very rarely that one gets a trunk call within half an hour or forty-five minutes; sometimes it takes about two or three hours. When one books a call to a Government office from an outstation sometimes when the call comes through one finds that the office is either closed for lunch or closed for the day. The Hon. Minister should probe into the cause of such delay.

I should like to make a few observations in regard to the problems that exist in my own constituency and district and I hope the Hon. Minister will take note of them and deal with them during the next financial year. First and foremost I shall refer to the trunk line between Colombo and Batticaloa. Between these two stations there is only one trunk line and it has to accommodate the calls from Colombo to Batticaloa North, Batticaloa South, including all post offices, and even the Gal Oya area so much so that this fact is trotted out generally as a reason for trunk call delays: the postal authorities say they have only one line to operate through and that, as a result, these calls get delayed. I would request the Hon. Minister to act on the suggestion already made that an additional line be provided from Colombo to Batticaloa. There is only one trunk line existing and it is unable to cope with the volume of traffic between the entire Batticaloa and Amparai Districts and Colombo. That is a matter that the Hon. Minister might consider before the next financial year.

Coming on to my own constituency, there was a request made for a sub-post office to be built at Kalawanchikudi. The present post office is housed in a rented out building and is in such a dilapidated condition that the postal workers have threatened to strike if a suitable building is not provided for them. I made an effort to find a new building to house the post office and informed the department accordingly, but as a result of the department failing to make arrangements with the landlord in regard to the question of rent, the landlord had given the house on rent to some other party. Now the post office continues to be in the same old building and is likely to collapse as soon as the rains begin. Not only that, unless arrangements are made to find an alternative building the postal department may be faced with a strike by the postmaster and the staff. I would therefore ask the Hon. Minister to provide for a new post office at Kalawanchikudi at least in the next financial year. There is an extent of land belonging to the Government which has been reserved for the post office, and the department could commence work

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

on it by building the post office first. As far as quarters for officers are concerned, they could be built in the subsequent years.

With regard to the upgrading of sub-post offices, there are many sub-post offices in my area which are 'C' grade sub-post offices and which can very well be upgraded into 'B' grade sub-post offices. The tussle in regard to the upgrading of 'C' grade sub-post offices is due to these sub-post offices being allowed to function within limited resources and with limited functions. For instance, they do not issue money orders ; they are allowed to issue postal orders only ; they are not allowed to deal with the payment of salaries to teachers ; they are not allowed to deal with the payment of public assistance and they do not deal with insured letters, so much so that the people from these areas have to go to the next big post office to avail themselves of these facilities. Thus these 'C' grade sub-post offices are handicapped as a result. One of the requirements laid down by the department is that when a sub-post office asks to be upgraded it must show a certain number of unit requirements. These 'C' grade sub-post offices cannot earn units because they are not allowed to do that work.

I have one or two sub-post offices in my area. In one place there are 130 people who draw public assistance and they have to go 5 miles to get that assistance.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

Shame, shame !

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

If these sub-post offices are upgraded they will, within a few months, earn not only the required units, but double and treble the unit requirements.

I would wish particularly to mention Kurumbanweli sub-post office which is a 'C' grade sub-post office, 6 or 7 years old. If this sub-post office is upgraded today it will earn a sufficient number of units to have it upgraded as an 'A' grade sub-post office. One of the reasons put forward by the department when I wrote to them was that these sub-post offices do not earn enough units. I will assure you, Sir, that there are not only people who draw public assistance, but also people who draw their T. B. allowances, and there are also more than half a dozen schools whose staff could be paid their salaries at this sub-post office. Therefore, I would earnestly request the Hon. Minister to look into the requirements of this sub-post office.

Then there are also Palukamam, Dittodai and Kodikala sub-post offices in my area which have really reached the unit mark to be upgraded and I hope that without delay you will upgrade them.

The next question is with regard to telephone facilities to sub-post offices in my area. There are three sub-post offices which require telephone facilities. This matter was discussed at the District Co-ordinating Committee of the Batticaloa Kachcheri and the co-ordinating committee has given priority to this. The first one is Muthalaikuda Sub-Post Office which is just half a mile from the main telephone line that runs to Kalmunai, so that the additional line you need to connect this sub-post office is just about half a mile in length and the balance lines can be run on the existing lines that go to Kakkoddicholai Sub-Post Office. This will not involve much of an expenditure.

Then at Kurumppanveli there is another sub-post office. This sub-post office is about three-fourths of a mile from the main telephone line, and once it is upgraded it too should be provided with telephone facilities.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

The other sub-post office is at Palukman. It also needs just about half a mile of additional line to be connected to the main line. This sub-post office too should be provided with telephone facilities; it can be done with very little expenditure.

The fourth one is Kodekaly Sub-Post Office which is on the main Batticaloa-Kalmunai line. Telephone lines are running by this sub-post office and telephone facilities can be provided in this case also without much expenditure.

If you cannot attend to all these sub-post offices at once please draw up a priority list and attend to them at least during the next financial year.

Before concluding I must once again say that the Hon. Minister is faced with a very difficult task because this is a department which needs very careful handling. As the volume of work is very great it is difficult to develop it. The demand on this department is very great, and the telephone system is almost archaic and out of date. We cannot keep pace with the advanced countries in the matter of replacing equipment and so on. So I hope the Hon. Minister will try and do a good job of it and give a better service to the people.

There is one other point I wish to refer to in connection with this. Particularly on Sundays and public holidays the telephones are always out of order, and this is a matter the Hon. Minister should look into seriously. From Saturday night till Monday morning, in the outstations the lines are out of order. When we ask for a trunk call they say the lines are out of order. Generally, on public holidays the lines are out of order. I do not know whether this is done purposely or somebody is meddling with the instruments, or whether there is none to look after the maintenance of the lines. I would request the Hon. Minister to kindly look into this and the other points raised by me, and see that a better service is provided.

අ. භා. 6.31

**කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුරය)
*(திரு. கே. பி. ரத்னயக்க—அனுராதபுரம்)*
(Mr. K. B. Ratnayake—Anuradhapura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාත් මේ අමාත්‍යාංශය ගැන වචන කීපයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනව. නව ඇමතිතුමා ඉතාමත් වගකිවයුතු බැරෑරුම් කටයුත්තක් භාරගෙන තිබෙන බව මුලින්ම මතක් කරන්නට ඕනෑ. මේ අමාත්‍යාංශයට අයත් වන්නේ එක දෙපාර්තමේන්තුවක් වුවත් සේවක සංඛ්‍යාව හා වැඩ කටයුතු දෙස බලන විට මෙය ඉතාමත්ම විශාල වූත් මහජනයාට ඉතාමත් අගනා සේවාවක් කරන්නාවූත් දෙපාර්තමේන්තුවක් බව පෙනී යනවා. ඉකුත් අවුරුදු කීපය තුළදී මේ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු නොයෙකුත් අන්දමේ විවේචනයන්ට භාජනය වී තිබෙනවා. රටේ දේශපාලන තත්ත්වය අනුව යම් යම් අවස්ථාවන්හිදී ඇමතිවරුන් මාරු වුණත් මෑත අවුරුදු දෙකක පමණ කාලය තුළදී මේ දෙපාර්තමේන්තුව පිළිබඳව ඇති වී තිබෙන කරදරවලට එක්තරා හේතුවක් නම් විටින් විට තැපැල්පතිවරුන් පත් වීම හා මාරු වී යෑමයි. ඇමතිවරුන් මාරු වුණත්, දෙපාර්තමේන්තු ප්‍රධානයා විටින් විට මාරු කරන්නට ගියහොත් වැඩ කටයුතුවලට අවහිර සිදු වෙනවාය යනු මගේ හැඟීමයි. එම නිසා නව තැපැල්පතිතුමා දීර්ඝ කාලයක් යනතුරු රඳවාගෙන මේ දෙපාර්තමේන්තුවේ තිබෙන කරදර මඟහරවා ගැනීමට ක්‍රියා කරන ලෙස මා නව ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දීර්ඝ කාලයක් එතුමා රඳවාගෙන දැනට තිබෙන කරදර මඟහරවා කටයුතු කරගෙන යන්නට ඉඩ දෙන්න. දෙපාර්තමේන්තුවක වැඩ කටයුතු සාර්ථක ලෙස කරගෙන යන්නට නම් එහි සේවකයන්ගේ අඩුපාඩු මඟහරවා ඔවුන් සතුටු කිරීම අවශ්‍යය. සේවකයන්ගෙන් නිසි සේවයක් ලබා ගත හැක්කෙ ඔවුන් සතුටු කිරීමෙනුයි. මේ දෙපාර්තමේන්තුවේ කොපමණ අඩුපාඩු තිබුණත් මෙහි සිටින සුළු සේවක පිරිසද ඉතාමත් කරදරකාරී තත්ත්වයක පසුවන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. බී. රත්නායක මයා.]

බව අමතක කරන්නට බැහැ. නිවාස පහසු කම් හා අන්‍ය දෙපාර්තමේන්තුවල සේවක යන්ට තිබෙන වෙනත් පහසුකම්ද මේ දෙපාර්තමේන්තුවේ සේවකයන්ට නැහැ.

මට කථා කරන්නට ලැබී ඇති කාලය සීමා වී තිබෙන නිසා මා නියෝජනය කරන ප්‍රදේශය ගැනත් වචන දෙක තුනක් කියන්නට කැමතියි. ටෙලිෆෝන් සේවා වේ ඇති අඩුපාඩු ගැනත්, වෙනත් නො යෙකුත් අඩුපාඩු ගැනත් මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කරුණු ප්‍රකාශ කළා. ඒ වගේම සමහර විට නිලධාරීන්ට දෝෂාරෝපණය කරන්නට යෙදුණා. ඒ ගරු මන්ත්‍රීවරුන් කී කථා ගැන කල්පනා කර බලන විට ඇත්ත වශයෙන් මා නම් ඉතාමත්ම වාසනාවන්තයයි කියන්නට පුළුවනි. මට නම් ටෙලිෆෝන් පණිවුඩ යක් ගැනීම සඳහා පැය දෙක තුනක් ඉන්නට සිදු වන්නෙ නැහැ. මෙය මගේ වාසනාවක් හැටියට සලකනවා.

අනුරාධපුරයේ පූජනීය ප්‍රදේශය වෙන් කොට නව නගරයක් පිහිටවූ අවස්ථාවේ දී පූජනීය නගරයේ තිබුණාට වඩා ටෙලි ෆෝන් පහසුකම් නව නගරයේ ඇති කර තිබෙනවා. නමුත් පූජනීය ප්‍රදේශයේ තිබුණු තමතමන්ගේ කන්තෝරු හෝ නිවාස හෝ නව නගරයට ගෙනාවාට පසුව ඒවාට තිබුණු ටෙලිපෝන් සේවා තවමත් ඒ අයට ලබා ගන්නට පුළුවන් වී නැහැ. මේ කාරණය ගැන හිත යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනව. ගරු ද සොයිසා සිරිවර්ධන ඇමතිතුමා තැපැල් ඇමති වශයෙන් සිටියදී අනුරාධපුරයේ තැපැල් කාර්යාලය බැලීමට ගිය අවස්ථාවෙහි එහි තිබුණු අඩු පාඩු පෙන්වා දෙන්නට යෙදුණා. ඒ ඇමති තුමාට පෙන්වා දුන් අඩුපාඩු විස්තර සහිතව දැන් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඒවා අමාත්‍යාංශයේ ලියවිලිවල සටහන් වී ඇති. අනුරාධපුරයේ තැපැල් කාර්යාලයේ ටෙලිෆෝන් පුවරුවෙහි ඇති අඩුපාඩු හා තවත් අඩුපාඩු ගැන තැපැල් ස්ථානාධිපති තුමාත්, අනිකුත් සේවකයනුත් කරුණු ඉදිරිපත් කළා. කරුණා කර හැකි ඉක්ම නින් ඒ අඩුපාඩු සම්පූර්ණ කර දෙන්නැයි

මා නියෝජනය කරන කොට්ඨාශයේ එක කෙළවරක මහාවිලච්චිය නමින් ගොවි ජනපදයක් තිබෙනවා. එහි ජනගහනය දහදාහකටත් අධිකයි. මේ ගොවි ජනපද යට උප තැපැල් කාර්යාල දෙකක් ඇතත් ටෙලිෆෝන් සේවා නැහැ. හදිසියකට රෝගියකු අනුරාධපුරයේ මහා රෝහලට ගෙන යාමට වුවමනා වූ විට යම් කෙනකුට කාර් එකක් සොයා ගැනීමට අනුරාධපුර යටම එන්න සිදු වෙනව. ඒ නිසා ඒ ගොවි ජනපදයට ඉක්මනින්ම ටෙලි ෆෝන් සේවයක් ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනව. දැනට ඒ පාරේ හැතැප්ම 8ක් පමණ දුරට ටෙලිෆෝන් සේවය තිබෙන නිසා තව හැතැප්ම 12ක් පමණයි, ඒ සේවය දීර්ඝ කළ යුතුව තිබෙන්නෙ. විලච්චිය පාරෙම උළු කර්මාන්තශාලා වක් දැනට ඇති කරල තියෙනව. තව මාස දෙකකින් පමණ එය විවෘත කරනව. ඒ උළු කර්මාන්තශාලාවට ටෙලිෆෝන් සේවය දෙන අතර විලච්චිය ව්‍යාපාරයටත් ඒ සේවය දෙන ලෙස මම ඉල්ලා සිටිනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රදේශයට උප තැපැල් කන්තෝරු රාශි යක් අවශ්‍ය වී තිබෙනව. මා සඳහන් කළ තරමටම ගරු ඇමතිතුමාට ඒ උප තැපැල් කන්තෝරු සපයන්නට බැහැ. නමුත් ඒ ගැන කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනව. පොදුවේ බලන විට තැපැල් සේව යේ අඩුපාඩු කීපයක් තියෙනව. විශේෂ යෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ ඒ පළාත්වල නිලධාරි මහත්වරුන් ගැනත් හිත යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනව. ඒ ප්‍රදේශවල උප තැපැල් කන්තෝරු විවෘත කලත්, ඒ උප තැපැල් කන්තෝරු වලින් මහජනයාට ලියුම් බෙදා දීමක් කෙරෙන්නෙ නැහැ. මහජනයා තැපැල කන්තෝරුවට ඇවිත් ලියුම් ලබා ගන්න ඕනැ. මේ ගැන විමසා බැලුවම තැපැල් කන්තෝරුවලින් ලියුම් බෙදා දීමට අවශ්‍ය පියන් මහත්වරුන් පත් කිරීමට මුදල් වෙන් කර නැති බව දැන ගන්න ලැබුනා. යම් ප්‍රදේශයක උප තැපැල් කන්තෝරු වක් විවෘත කරන අවස්ථාවේදී ඒ උප තැපැල් කන්තෝරුවෙන් ලියුම් බෙදා දීමටත් වැඩ කටයුතු සකස් කරන්න ඕනැ. ඒ ගැන සඳහන් කරන විට, උප තැපැල් කන්තෝරුවලට බඳවා ගන්නා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පියන් මහත්වරුන් ඒ ඒ ගම්වලින්ම තෝරා ගැනීම ඉතාම යෝග්‍ය බව මම ප්‍රකාශ කරන්න කැමතියි. අනුරාධපුරයේ සිට හැතැප්ම 14ක් පමණ ඈතින් පිහිටි මනෝරාව නමැති ගමේ තැපැල් කන්තෝරුවේ පියන් තනතුරට ද්‍රවිඩ මහත්මයකු පත් කළා. ඒ මහත්මයා ද්‍රවිඩ මහත්මයකු නිසාය කියා මම විරුඬ වන්නෙ නැහැ. නමුත් ඒ ප්‍රදේශයේ ලියුම්වල ලිපිනයන් තියෙන්නෙ සියයට සියයක්ම සිංහලෙන්. ඒ මහත්මයට සිංහල තරමක් කියවා ගන්න පුළුවන් වුනත් ලියමනක නමක් හරියට කියවා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ ඒ ප්‍රදේශවල උප තැපැල් කන්තෝරුවල ට පත් කර ගන්නා පියන් මහත්වරුන් ඒ ප්‍රදේශවලින්ම තෝරා ගත යුතු බව සඳහන් කරන්න කැමතියි.

පසුගිය අවුරුද්දේ උප තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ මහා සභා රැස්වීමක් අනුරාධපුරයේ තිබුණු නිසා මමත් එයට සහභාගි වුනා. ඒ අවස්ථාවේදී ඒ මහත්වරුන්ට මුහුණ පාන්න සිදු වන නොයෙකුත් කරදර ගැන සාකච්ඡා වුනා. ගරු සිරිවර්ධන ඇමතිතුමා තැපැල් ඇමති වශයෙන් සිටිද්දීයි, ඒ සම්මේලනය පැවැත් වුණේ. උප තැපැල් ස්ථානාධිපති මහත්වරුන් ඉතාමත් කරදර තත්ත්වයක සිටිමින් තමන්ගේ කටයුතු කරන බව ඒ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම මතක් කළා. පත් කර තිබුණු එක්තරා කොමිෂන් සභාවක වාර්තාවකුත් ඒ අවස්ථාවේදී ඉදිරිපත් කර තිබුන. ඒ වාර්තාව ඉක්මණින්ම ක්‍රියාත්මක කරනවා යයි, ඒ මහත්වරුන් බලාපොරොත්තු වන බව ඒ අවස්ථාවේදී ප්‍රකාශ කළා. නමුත් අවුරුදු දෙකක් ගත වෙලත් ඒ සම්බන්ධයෙන් සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදී නැහැ. මේ නිලධාරි මහත්වරුන් උදේ 8 සිට සවස 5, 6 දක්වා වැඩ කරනව. සමහර තැපැල් කන්තෝරුවලට මේල් බස් එක එන විට රෑ 8, 9 පමණ වෙනව. මේ වේලාවටත් මේ මහත්වරුන්ට ඇවිත් නැවත වැඩ කරන්න සිදු වෙනව. යම් කිසි ක්‍රමයක් යොදා, මේ නිලධාරි මහත්වරුන් මුළු කාලය ගත කරන රජයේ සේවකයන් හැටියට පත් කර, ඊට ගැළපෙන පඩි ක්‍රමයක් ඒ අයට දී සේවය අවසානයේදී විශ්‍රාම ලබා ගැනීමට පුළුවන් ක්‍රමයක් ඇති කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

මා ඉදිරිපත් කළ කරුණුවලට ගරු ඇමතිතුමාගේ හිත යොමු කර ඒවා ගැන ඉක්මනින් කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 6.40

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

Sir, one thing must be said, and that is that we are thoroughly dissatisfied with the postal and telecommunication services. The only new thing that I see since 1956 is the introduction of blue telephone wires. The Department of Posts and Telecommunications has introduced blue telephone wires! Besides that, there has been nothing new.

It is good that we have as our new Minister a person who can approach this problem without bias. I do not want to speak on what has already been said. I should like to point out that the provision of telephones is an industry, a paying industry, and that the question should be viewed in that light. As it is, it seems as if today a telephone is a gift or an honour that is conferred on people. Getting a telephone seems to be as signal an honour as being made a J. P. Telephones have become so rare and so difficult to get that it adds to a man's normal qualifications to say that he possesses one.

I do not want to comment on the various views that people have on this matter of the granting of telephones. I only ask that we approach this problem from the angle that it is a paying industry. Therefore, why not build up this industry? I wish the new Minister will address his mind to this subject and realize that there is money in providing telephone facilities for the people of this country.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හමීඩ් මයා.]

The world is moving fast. You can get a call from Ceylon to England within five minutes. But to get a call from Colombo to Ratmalana you have to wait half an hour. Recently, the Greater Colombo scheme was introduced. Under this scheme, anybody who wants to get a number in Colombo can dial direct, but a person desiring to telephone somebody in Nugegoda or Ratmalana or anywhere else has to get through the exchange. That is the absurdity of the scheme. It has been done in the most haphazard manner. If you can dial a number in Colombo direct from Kirillapone or Nugegoda, why should those who live in Colombo be deprived of the same facility ? This is a case of sheer lack of planning.

